මෙවර 'රළ'
සමඟ

ISSN 1391 - 1031
2019 සැප්තැම්බර්
25 වෙළුම 05 කලාපය

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ආධාරය රු 40/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"මිනිසා මාලිගාවකදී හා පැල්පතකදී වෙනස් ආකාරයෙන් සිතයි. සාගින්න නිසා, දුක්ඛිත තත්වය නිසා ඔබට ඔබේ සිරුර තුළ පෝෂණය සඳහා දෙයක් නොමැති නම්, ඒ ආකාරයෙන්ම, ඔබේ ඔළුවේ, ඔබේ මනසේ සහ හදවතේ සදාචාරය පෝෂණය සඳහා දෙයක් නොමැත."

**ලුද්විග් ෆෙබාෆ්ග්**



# සුභවාදී ජනතාවගේ අපේක්ෂාව

# ජාතික ජන බලවේගයයි

## ජාතික ජන බලවේගයේ ජනාධිපති ධුර අපේක්ෂක අනුර දිසානායක සහෝදරයා

දූෂිත දේශපාලනයට එරෙහි ධජයත් ශිෂ්ට සම්පන්න දේශපාල භූමියක් නිර්මාණය කිරීමේ ධජයත් ගමට ගෙන යා හැක්කේත් කළු ව්‍යාපාරයක් වී තිබෙන දේශපාලනය සුදු දේශපාලනයක් බවට පත්කිරීම පිළිබඳ සාකච්ඡාව ගමට ගෙනයා හැක්කේත් ජ.වි.පෙ. මහජන නියෝජිතයින්ට පමණක් බවත් පෙන්වා දුන් ජාතික ජන බලවේගයේ ජනාධිපති ධුර අපේක්ෂක අනුර දිසානායක සහෝදරයා, එදිනෙදා සිදුවීම් දෙස දේශපාලන සංවේදීතාවයෙන් බලන හා රටට අත්වී තිබෙන ඉරණම පිළිබඳ වේදනාවෙන් පසුවෙන ජනතාව රට ගොඩනගන දේශපාලන බලවේගයක් පිළිබඳව සුභවාදී අපේක්ෂාවකින් පසුවන බවත් නිසැක ලෙසම ඔවුන්ගේ තෝරාගැනීම ජාතික ජන බලවේගය බවත් ප්‍රකාශ කළේය.

අනුර දිසානායක සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 01වැනි දින කොළඹ නව නගර ශාලාවේදී පැවති 'ගම-රට කොළඹට' ජ.වි.පෙ. පළාත් පාලන නියෝජිත හමුව අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"ජනතාවගේ අනාගතය ස්ථාවර කරන රට ගොඩනගන වැඩපිළිවෙළක් අපිට අවශ්‍යයයි. ගාටමින් තිබෙන ආර්ථිකය වෙනුවට නව ආර්ථික ප්‍රතිපත්තියක් රටට අවශ්‍යයි. අපරාධ සමාජයක් වෙනුවට යහපත් සමාජයක් නිර්මාණය කරන වැඩපිළිවෙළක් අවශ්‍යයි. අධ්‍යාපනය, ප්‍රවාහනය, සෞඛ්‍යය වෙනුවෙන් විශාල මුදලක් වැය කරන ක්‍රමයක් නිර්මාණය වී තිබෙනවා. ගෙදර ඉන්න ලෙඩා බරක් වෙලා. ගෙදරට ගත්ත වාහනය බරක් වෙලා. උපයන මුදලින් විශාල කොටසක් අධ්‍යාපනය, සෞඛ්‍ය ප්‍රවාහනය වෙනුවෙන් වැය කරන්න සිදුවෙලා. එනිසා මහා පරිවර්තන යුගයක් අපේ රටට අවශ්‍යයි. නව සොයාගැනීම් මගින් අපේ රට ලෝකය ඉදිරියට ගෙන යාමට අවශ්‍යයි. ලෝකය සමග අත්වැල් බැඳගැනීමට ශක්තිමත් ආර්ථිකයක් අවශ්‍යයි. අපේ රටට හිතකර පරිසර පද්ධතියක් අධ්‍යාපනය, සෞඛ්‍යය, ප්‍රවාහන සේවා දියුණුවට පත් කරමින් කෘෂි, ධීවර, පශු සම්පත් සංවර්ධනය දියුණු කරමින් නිෂ්පාදකයාටත් පාරිභෝගිකයාටත් සාධාරණ මිලක් නියම කරන ක්‍රමවේදයක් අවශ්‍යයි.

එවැනි වැඩපිළිවෙළක් සමග ඔබ ගම ආමන්ත්‍රණය කළ යුතුයි. අපේ රට ලෝකයේ දියුණුතම රාජ්‍යයක් දක්වා ගෙන ඒමටත් අපේ රටේ ජනතාවට උසස් සමාජ ජීවිතයක් බලාපොරොත්තු විය හැකි වැඩපිළිවෙළක් සමග ඔබ ගම ආමන්ත්‍රණය කළ යුතුයි. ඒ වගේම එවැනි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා බලවේගයන් නිර්මාණය කළ යුතුයි. අපි අපේ සාමාජිකයින්, ක්‍රියාකාරීන්, හිතවතුන් සමග හොඳ දේශපාලන සංවාදයක් තිබෙනවා. නමුත් එය පමණක් ප්‍රමාණවත් නැහැ. එම සාකච්ඡාවෙන් ඔබ්බට ගොස් එ.ජා.ප., ශ්‍රීල.නි.ප., පො.ජ.පෙ. සහ අනෙකුත් පක්ෂවල සාමාජිකයින් සමග ඉතා හොඳ දේශපාලන සංවාදයක් නොකරන්නේ නම් අපේ රට සංවර්ධනය කිරීමේ කාර්යභාරය සම්පූර්ණ කරගන්න බැරි වෙනවා. එක්සත් ජාතික පාක්ෂිකයින් එම පක්ෂයට ඡන්දය දෙන විට බලාපොරොත්තු වන්නේ රට සංවර්ධනය කර ගැනීමයි. නීතියේ ආධිපත්‍යය තහවුරු කර ගැනීමයි. තරුණ තරුණියන්ගේ

02 පිටුවට

**03 ජනාධිපතිවරණය...**



මෙම දේශපාලන සංදර්භය තුළ ධනපති කඳවුරේ අභ්‍යන්තර අර්බුදය විසිනුත්, ඔවුන්ගේ වසර 71ක...

**07 'ශ්‍රී ලංකන්' විකිණීමට තිබේ!...**




දැන් ජනතාව සතු වගකීම වන්නේ, මෙම දූෂිත දේශපාලුවන් රෙදි අපුල්ලන්නා සේ කුණු සෝදා...

**10 පැන් පොදක් වේ නම්...**



මෙතෙක් සිටි නිහඬ බව බිඳිය යුතු කාලයයි මේ. රටේ පාලකයින්ගේ නොහැකියාවන් ඔවුන්ගේ ජනතාව...

**11 දර්ශනයේ හා විද්‍යාවේ...**



මේ අනුව පෙනී යන්නේ ඉතිහාසයේ ගමන්මඟ තුළ පංති සමාජය බිහිවීමෙන් පසු සමාජ සංවර්ධනය සිදු වූ...

තරුණ............ 04
සංවාදය............ 05
ආවර්ජනා............ 06
ජාත්‍යන්තර............ 12
වේදිකාව............ 13
විශේෂ............ 14

**යුක්තිගරුක දේශයක්!**

# සටන් බිම

## මහජන බැංකු සංශෝධන පනතට එරෙහිව විරෝධතා




මහජන බැංකු පනත සංශෝධනයට එරෙහිව පසුගියදා මහජන බැංකු මූලස්ථානය ඉදිරිපිට කළු විරෝධතාවයක් පැවැත්විණි. සමස්ත ලංකා බැංකු සේවක සංගමය මගින් මෙම කළු විරෝධතාවය සංවිධානය කරන ලද අතර 1961 අංක 21 දරන මහජන බැංකු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත පාර්ලිමේන්තුවේදී විවාදයට භාජනය කිරීමට ලක් කිරීමට ලක් වූ බවත් ඉදිරියේදී මෙම පනත සම්මත කිරීමට නියමිත බවත් මෙහිදී සමස්ත ලංකා බැංකු සේවක සංගමයේ මහජන බැංකු ශාඛා ලේකම් අජිත් ගමගේ සහෝදරයා පැවසීය. මෙම පනත සංශෝධනය මගින් 'ජන හද හඳුනන' ප්‍රධාන රාජ්‍ය බැංකුව වූ මහජන බැංකුවේ රජයේ අයිතිය ඉදිරි කාලයේදී පෞද්ගලික බැංකුවක හෝ විදේශීය බැංකුවක ග්‍රහණයට පත්කිරීමට හැකියාව ලැබෙයි.

## බැංකු පෞද්ගලීකරණය කරන නව ලිබරල් ආර්ථිකය ආපසු හැරවිය යුතුයි - ලාල්කාන්ත




මේ වන විට මහජන බැංකු පෞද්ලීකරණය කිරීමේ අරමුණින් ගෙන එන ලද බැංකු සංශෝධන පනත්, නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වන්නක් බවත් එවැනි ආර්ථික ප්‍රතිපත්ති පරාජය කිරීම වෙනුවෙන් ජනතාව ඉදිරියට පැමිණිය යුතු බවත් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයා පවසයි. ඔහු මේ බව පැවසුවේ පසුගියදා ඒ බව රටට හෙළිදරව් කිරීම සඳහා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ මැදිහත්වීමෙන් පවත්වන ලද මාධ්‍ය හමුවකදීය.

මහජන බැංකු පනත සංශෝධනය කර මහජන බැංකුව සතු කොටස් වෙනත් බැංකුවලට හිමි වන ලෙසට කරන ලද මෙම සැලසුම මගින් මහජන බැංකුව වාර්ෂිකව ලබන රුපියල් කෝටි 3000කට වැඩි මුදලක් කොටස් හිමියන් අතරේ බෙදීයමින් බැංකුව පෞද්ගලීකරණයකට ලක්වීම මෙම පනතේ කුට අරමුණ බව ලාල්කාන්ත සහෝදරයා පවසයි.

පාර්ලිමේන්තුවේ වැඩි පිරිසක් මෙම පනතට අත උස්සන බවත් ඒ නිසා මෙම පනත මහපාරේ පරාජය කළ යුතු බවද සමස්ත ලංකා බැංකු සේවක සංගමය මගින් අරඹා ඇති මෙම සටන වෘත්තීය සමිති ව්‍යාපාරය එක්වී ජයග්‍රහණය කිරීමට කටයුතු කරන බවද මෙහිදී ලාල්කාන්ත සහෝදරයා පැවසීය.

## කම්කරු නීති සංශෝධන වහා හකුළාගනු වෘත්තීය සමිති විරෝධතා




ආණ්ඩුව විසින් ගෙන ඒමට නියමිත කම්කරු නීති සංශෝධන වහා හකුළා ගන්නා ලෙස බලකරමින් පසුගියදා කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරිපිට විරෝධතා ව්‍යාපාරයක් පැවැත්විණි. ජාතික කම්කරු උපදේශක සභාව නියෝජනය කරන වෘත්තීය සමිති රැසක් එක්වී මෙම විරෝධතාවය පැවැත්වූ අතර ඒ සඳහා අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ, ලේකම් ජානක අධිකාරී සහෝදරවරු ඇතුළු සාමාජිකයෝ විශාල පිරිසක්ද සහභාගී වී සිටියහ. 'වැඩකරන ජනතාව වහලුන් කරන කම්කරු නීති සංශෝධන පරදවමු' යන තේමාව යටතේ විරෝධතා, පෝස්ටර් ව්‍යාපාර, ජනතාව දැනුවත් කිරීමේ පත්‍රිකා බෙදාහැරීම් ඇතුළු ක්‍රියාමාර්ග රැසක් මෙම කම්කරු නීති සංශෝධනවලට එරෙහිව මේ වන විට දියත් කරනු ලැබ ඇත.

## ලංගමයටත් 2500/- දීමනාව ඕනෑ

2019 අගෝස්තු මාසයේ වැටුපට ශ්‍රී ලංගම සේවකයන් හට රු 2500යේ අන්තර් දීමනා මුදල ලබාදීමට සහ විධායක සහ විධායක නොවන නිලධාරීන්ගේ වැටුප් සංශෝධනය කිරීමට කඩිනමින් මැදිහත් වන ලෙස සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමය ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය අර්ජුන රණතුංග මහතාගෙන් ඉල්ලා ඇත. රජයේ සේවකයන්ට 2019 අයවැය තුළින් ලබාදුන් රු 2500ක දීමනා මුදල ලබාගැනීම සඳහා තම සංගමයෙන් දිගින් දිගටම අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටියද එම ඉල්ලීම ඉටු කිරීමට විධිමත් මැදිහත් වීමක් මෙතෙක් සිදුකර නැති බවද එම සංගමය පවසයි. එසේ නොගෙවීමට එරෙහිව වෘත්තීය ක්‍රියාමාර්ග ගැනීමට වුවද පසුබට නොවන බවද එම සංගමය අමාත්‍යවරයා වෙත යවන ලද ලිපියේ සඳහන්ය.

## නොවිසදුන ගැටලුවලට එරෙහිව විශ්වවිද්‍යාල සේවකයෝ වැඩවර්ජනයේ




වසර ගණනාවක් තිස්සේ නොවිසඳුන ගැටලුවලට සාකච්ඡා මාර්ගයෙන් විසඳුම් නොලැබුණ හෙයින් අඛණ්ඩ වෘත්තිය අරගලයකට අවතීර්ණ වීමට තීරණය කර ඇති බව විශ්වවිද්‍යාල වෘත්තීය සමිති එකමුතුව පවසයි. ඒ අනුව පසුගිය අගෝස්තු 28-29 දෙදින රට පුරා විශ්වවිද්‍යාල අනධ්‍යන සහ පරිපාලන අංශයේ සේවයේ නියුතු 16,000කට ආසන්න සේවක පිරිසක් වෘත්තීය ක්‍රියාමාර්ග සඳහා එක්වී සිටියහ.

මෙහිදි විශ්ව විද්‍යාල වෘත්තීය සමිති එකමුතුවේ ප්‍රචාරක ලේකම් විජයතිලක ජයසිංහ සහෝදරයා පවසන්නේ, වසර ගණනාවක් තිස්සේ පවතින විශ්ව විද්‍යාල අනධ්‍යන සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ පවතින වෘත්තීය ගැටලු හේතුවෙන් සේවකයින් මේ වනවිට දැඩි අපහසුතාවයකට පත්ව සිටින බවත් පාලකයන් සාකච්ඡා මේසයතුල නිසි විසඳුම් ලබාදීමට අපොහොසත් වීම නිසා වෘත්තීය සමිති එකමුතුවක් විදිහට අඛන්ඩ අරගලයකට අවතීර්ණ වීමට තීරණය කළ බවත්ය.

ඒ අනුව වසර 03 ක් තිස්සේ පවතින වැටුප් විෂමතාවය සහ වැටුප් වැඩිවීම මෙතෙක් ලබා නොදීම, මාසික හිලව් දීමනා ඉහළ නොදැමීම සහ විශ්වවිද්‍යාල පද්ධතියට ගෙවනු ලබන විශ්‍රාම වැටුප එළදායී ලෙස පිළියෙල කර ගැනීම ඇතුළු තවත් ඉල්ලීම් කිහිපයක් මුල්කර ගනිමින් මෙම වැඩවර්ජනය පවත්වනු ලැබිණි.

# එතෙරින්...

## ආසියා පැසිපික් සභාපතිවරුන්ගේ සමුළුවට හඳුන්නෙත්ති



ආසියා පැසිපික් කලාපයේ රටවල ගිණුම් කාරක සභා සභාපතිවරුන්ගේ 09වැනි සමුළුවට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් කෝප් කමිටු සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා පසුගියදා සහභාගි විය. මැලේසියාවේ ක්වාලාම්පූර්හි මැලේසියානු පාර්ලිමේන්තු සංකීර්ණයේ පැවැති මෙම සමුළුවට මැලේසියාව, හොංකොං, පාකිස්ථානය, බංගලිදේශය ඇතුළු රටවල් රැසක ගිණුම් කාරක සභා සභාපතිවරු සහභාගි වී සිටියහ. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ කෝප් කමිටු ප්‍රගතිය මෙහිදී විශේෂ ඇගයීමකට ලක්ව තිබේ.

## ජ.වි.පෙ. යෝජනා රෝමයේ විහාරධිපති හිමිටත් පිළිගැන්වේ



ජාතික සමගියත්, මහජන ආරක්ෂාවත් තහවුරු කිරීමට ජ.වි.පෙ. ඉදිරිපත් කළ යෝජනා මාලාව ජනතා විමුක්ති පෙරමුණේ ඉතාලි කමිටුවේ නියෝජිතයින් පිරිසක් විසින් රෝම බෞද්ධ විහාරයේ විහාරාධිපති මොල්ලිගොඩ ධීරානන්ද හිමියන්ටද පසුගියදා පිළිගන්වන ලදී.

## එතෙර අපි - ගිම්හාන සැඳෑව ස්වීඩනයේ ස්ටොක්හෝම්හිදී



ස්වීඩනයේ එතෙර අපි "ගිම්හාන සැඳෑව" උත්කර්ෂවත් ලෙස ශ්‍රී ලාංකිකයින් විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් පසුගියදා ස්ටොක්හෝම් නගරයේදී පැවැත්විණි. මෙයට ලාංකික දරු දැරියන්ගේ විශේෂාංග රැසක්ද ඇතුළත්ව තිබීම විශේෂත්වයකි.

## 'එතෙර අපි' ඡන්ද අයිතිය ඉල්ලා




"විදෙස් ගත ශ්‍රී ලාංකිකයන්ට ඉදිරි ජනාධිපතිවරණයේදී ඡන්ද අයිතිය දිනාගමු" තේමාව යටතේ මහජන සම්මන්ත්‍රණයක් පසුගියදා මරදාන සමාජය හා සාමයික කේන්ද්‍ර ශාලාවේදී පැවැත්විණි. එතෙර අපි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා විසින් මෙහි ප්‍රධාන දේශනය පැවැත්වූ අතර මෙම අවස්ථාවට එතෙර අපි භාණ්ඩාගාරික නීතිඥ ජානක අධිකාරී සහ එතෙර අපි කටාර් ශාඛාවේ සභාපති රුවන් සංජීව සහෝදරයාද සහභාගි විය. ජනගහනයෙන් 10%ක් වන විදේශගත ශ්‍රමිකයින් ලංකාවේ විදේශ විනිමය මගින් අපනයන ආදායමට 35%ක් දායක වුවද මෙතෙක් ප්‍රධාන මැතිවරණයකදී ඡන්දය භාවිතා කිරීමට ඔවුන්ට නොහැකි වී ඇති බැවින්, ඉදිරි ජනාධිපතිවරණයේදී ඡන්ද අයිතිය දිනාගැනීමට අවශ්‍ය නීති සම්පාදනය කරන ලෙස ආණ්ඩුවට බලකිරීම මෙම වැඩ පිළිවෙළේ අරමුණ බව මෙහිදී සඳහන් විය. ඡන්ද අයිතිය තහවුරු කිරීමට ජ.වි.පෙ. යෝජනා කර ක්‍රියාත්මක වූ තේරීම් කාරක සභාවේ කරුණුද මෙහිදී සාකච්ඡාවට ලක්විය.

## වෙනිසියුලාවේ නි. විදේශ ඇමති ජ.වි.පෙ. හමුවක්



ජනතා විමුක්ති පෙරමුණ සහ වෙනිසියුලාවේ රජයේ නියෝජිත, විදේශ නියෝජිත අමාත්‍ය රූබන් මොලීනා සමග විශේෂ සාකච්ඡාවක් ජ.වි.පෙ. පැලවත්ත පක්ෂ මූලස්ථානයේදී පැවැත්විණි. මෙම අවස්ථාවට ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභිකයින් වන බිමල් රත්නායක හා සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා සහ සමාජවාදී තරුණ සංගමයේ විදේශ කටයුතු ලේකම් අංජන අමරසිංහ හා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයාද එක්විය. රූබන් මොලිනා සහෝදරයාට අමතරව ඉන්දියාවේ වෙනිසියුලා තානාපති කාර්යාලයේ නියෝජිත හෙස්ටර් ලෝපෙස් සහෝදරයාද සහභාගි විය.

වෙනිසියුලාවට එරෙහිව සිදුකරන ඇමරිකා එක්සත් ජනපද මැදිහත්වීම පිළිබඳව, ශ්‍රී ලංකාවේ වෙනිසියුලානු රාජතාන්ත්‍රික සබඳතා ගොඩනැගීමට අවශ්‍ය පියවර ගැනීමට පක්ෂය ලෙස මැදිහත්වීම පිළිබඳවත් දැනටමත් ජනතා විමුක්ති පෙරමුණ සහ අනුබද්ධිත සංවිධාන වෙනිසියුලාවට සහාය පල කිරීමට ගෙන ඇති පියවර පිළිබඳවත් දීර්ඝව මෙහිදී සාකච්ඡා කරන ලදී.

## සුභවාදී ජනතාවගේ...

01 වැනි පිටුවෙන්

හැකියාවට රැකියාවක් ලබා ගැනීමයි. අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි සේවා දියුණුකර ගැනීමයි. නමුත් එජාප සාමාජිකයින්ගේ සහ නායකයින්ගේ අපේක්ෂාවන් පරස්පරයි. මහින්ද රාජපක්ෂ මහතා නියෝජනය කරන කඳවුරේ පාක්ෂිකයන්ගේ බලාපොරොත්තුවත් යහපත් ආණ්ඩුකරණයයි. නමුත් පාක්ෂිකයින්ගේ සහ එම කඳවුරේ නායකයින්ගේ අපේක්ෂාවන් පරස්පරයි.

අදූෂිත දේශපාලනයක් සමග, හැකියාවන් - දක්ෂතාවයන් - කැපකිරීම් සහිත වෘත්තීයවේදීන් සහ වැඩ කරන ජනතාව සමග පමණයි මේ රට ගොඩනැගිය හැක්කේ. එය තමයි ජාතික ජනබලවේගය නියෝජනය කරන්නේ. එය තමයි ජාතික ජන බලවේගයේ මහා දේශපාලන පෞරුෂය වී තිබෙන්නේ. ජාතික ජන බලවේගයේ එවැනි බර අවි සමග අනෙකුත් පක්ෂවල සුළු අවිවලට තරග කරන්න හැකියාවක් නැහැ. ජනතාවගේ වුවමනාවන්, බලාපොරොත්තු නියෝජනය කරන, රට ගොඩනැගිය හැකි වෙනස් බලවේගයකට රට බාර දිය යුතුව තිබෙනවා. එනිසා මෙවර ජනාධිපතිවරණයට අපි දැන් වැඩ ආරම්භ කොට තිබෙනවා. අපේ පක්ෂයේ නිර්මාතෘ රෝහණ විජේවීර සහොදරයා කියූ පරිදිම අපි වේලාසනින් අවදි වී වේලාසනින් වැඩකටයුතු ආරම්භ කොට තිබෙනවා."

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# දේශපාලනය විගඩමක් නොවීමට නම්...

ජනාධිපතිවරණ සටන දිනෙන් දින උණුසුම් වෙමින් තිබේ. මේ වනවිටත් රාජපක්ෂ කඳවුර විසින් සිය අපේක්ෂකයා ලෙස ගෝඨාභය නම්කර තිබේ. ඒ අතර තවමත් එ.ජා.ප.ය අපේක්ෂකයෙක් නම් කිරීමටද නොහැකිව සිටියි. එහෙත් අලුතින් ගොඩනැගුණු ප්‍රගතිශීලීන්ගේ, ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ, මානවවාදීන්ගේ හා වාමවාදීන්ගේ කඳවුර වන ජාතික ජන බලවේගය නියෝජනය කරමින් අනුර දිසානායක සහෝදරයා සිය අපේක්ෂකයා ලෙස ඉදිරිපත් කිරීමට සමත්ව තිබේ.

මේ සමග කලබල වූ සමහරු මහින්ද රාජපක්ෂ කඳවුරේ අපේක්ෂකයා වන ගෝඨාභයගේ පැමිණීම පිළිබඳ අතිශයෝක්තියෙන් යුත් භීතියක් මවා පා ගෝඨාභය පැරදවීමට සියලු දෙනා එක කඳවුරකට පැමිණිය යුතු බවත් රාජපක්ෂ විරෝධී කඳවුරේ ඡන්ද බෙදීම රාජපක්ෂවරුන්ට වාසියක් බවටත් මත පළ කිරීමට පටන්ගෙන සිටිති. මේ වහෙන් ඔරෝ භාෂාවෙන් කියන්නේ වෙන යමක් නොව 2015 සිදුකළේ නැවත සිදුකළ යුතු බවයි.

මාක්ස් විසින් ලියන ලද 'ලුයී බොනපාට්ගේ බෲමයර් 18දා' නම් ලිපියේ මාක්ස් අපූරු කියමනක් පවසා තිබුණි. ලෝක ඉතිහාසයේ සමහර සිදුවීම් දෙවරක් සිදුවන්නේ යයි හෙගල් පවසා ඇති බව කී මාක්ස් එයට එකතු කිරීමක් කරමින් එසේ වන්නේ නම් එය පළමුව ඛේදවාචකයක්ද දෙවනුව විගඩමක්ද වන බව පැවසීය. සැබැවින්ම ලංකාවේ දේශපාලනයේ 2015 ජනාධිපතිවරණයේ ජනවරම හා අභිලාෂය මෛත්‍රී-රනිල් හවුල විසින් පාවාදීම නිසා එය ඛේදවාචකයක් විය. දැන් එයම නැවත සිදු කරන්නේ නම් එය විගඩමක් වීම වළකාලිය නොහැකි වනු ඇත. ඒ නිසා 2015 සිදුවූ දේ එලෙසින්ම නැවත සිදුවිය යුතු නැත.

2015 ජනාධිපතිවරණයේදී ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලා සිටි සමාජ සාධාරණත්වය, යහපත් ආණ්ඩුකරණය, විනිවිදභාවය වැනි සාධනීය සමාජයීය ප්‍රතිඵල බලාපොරොත්තු වූ ලක්ෂ 62ක ජනතාවත් ඔවුන් නියෝජනය කළ දේශපාලන පක්ෂ හා සිවිල් සංවිධාන රැසකුත් එවකට පැවති රාජපක්ෂලාගේ දූෂිත පවුල් පාලනය පරාජය කිරීමට මහත් ධෛර්යයකින් මැදිහත් වූහ. එහිදී එ.ජා.ප.ය කළේ එම ජනතා අභිලාෂය තමන්ට බලයට පත්වීමේ මඟක් ලෙස භාවිත කිරීමය. මෛත්‍රීපාල එයට දායක වූයේ රාජපක්ෂ පාලනය තුළ තමන්ට සිදුවූ කෙනෙහිලිකම්වලට දැක්වූ ප්‍රතිචාරයන් ලෙසය. ඒ නිසාම මෛත්‍රීපාලට හෝ රනිල්ට ලක්ෂ 62ක ජනතාවගේ අභිලාෂය වටහා ගැනීමට හෝ එය ඉටුකිරීමට අවශ්‍ය නොවීය. මෛත්‍රී-රනිල් හවුල සැබැවින්ම සිදුකළේ ජනතාව ඡන්දයෙන් පැරදවූ රාජපක්ෂ පිල ආරක්ෂා කිරීමය. හිරගෙදර සිටිය යුතු වර්ගයේ අපරාධ රැසකට සම්බන්ධ පුද්ගලයෙකුට රාජපක්ෂ පිලෙන් ජනාධිපතිවරණයේ අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වීමට හැකිවූයේ ඒ අනුවය.

මෙම ජනාධිපතිවරණයේදීද රාජපක්ෂ පිල පරාජය කළ යුතුය. එහෙත් දූෂිත රාජපක්ෂවරුන් ආරක්ෂා කළ, එම පාදඩ දේශපාලන සංස්කෘතිය වෙනස් නොකොට එයම පවත්වාගෙන ගිය මෛත්‍රී කණ්ඩායමට හෝ රනිල් කණ්ඩායමට එය කළ නොහැක. රනිල් පිලේ වෙනත් අපේක්ෂකයෙක්ද ඊට ගැලපෙන්නේ නැත. සමාජය අලුත් මඟක් සෙවිය යුත්තේ ඒ නිසාය. 2015 දේශපාලනය ඛේදවාචකයක් කළ අයට දේශපාලන විගඩම් කිරීමට තවත් අවස්ථාවක් ලබාදිය යුතු නැත.

අනෙත් අතට සමහරුන් සිතා සිටින ලෙස දේශපාලනයෙන් තොර ස්වාධීන නිර්පාක්ෂික උගතෙකුට මහජන බලයක් නැති දේශපාලන සංවිධාන ජාලයක් නැති තනි මිනිහෙකුට, ඊනියා 'සුපර් මෑන්' කෙනෙකුටද සමාජයේ වත්මන් දේශපාන ඛේදවාචකයන්ට විසඳුම් සෙවිය නොහැක. එවන් අයට කළ හැක්කේද දේශපාලන විගඩම්කාරයෙකගේ භූමිකාවට තාවකාලිකව පණ පෙවීම පමණි.

මේ වනවිටත් ලාංකේය දේශපාලන බිම කඳවුරු දෙකකට බෙදීමට ජාතික ජන බලවේගය සමත්ව සිටී. පසුගිය අගෝස්තු 18 ගෝල්ෆේස් රැලිය එය පෙන්වූ ප්‍රබල අවස්ථාව විය. රාජපක්ෂවරුන්ගේ දූෂිත, අධම දේශපාලන සංස්කෘතියත් එහිම සහායකයා වන රනිල් වික්‍රමසිංහලාගේ දූෂිත නව ලිබරල්වාදී දේශපාලනයත් නියෝජනය කරන්නේ එකම කඳවුරක් බව ඉතා පැහැදිලිය. ඒ අධිරාජ්‍ය ගැති, දූෂිත, ප්‍රජාතන්ත්‍ර විරෝධී, මානව විරෝධී, ප්‍රතිගාමී කඳවුරය. පක්ෂ දෙකක් හෝ කිහිපයක් ලෙස පෙනී සිටියද ඔවුන් එකම දේශපාලන කඳවුරකට අයත් කණ්ඩායම්ය. එබැවින් පැරදවිය යුත්තේ මෙම ප්‍රතිගාමී දේශපාලන කඳවුර එකට තබා මිස ඉන් එක් පාර්ශ්වයක් වෙන්කර ගෙන අනික් පාර්ශ්වයට උදව් කරමින් නොවේ.

වඩාත් කළු කේතලයද, මුට්ටියද යන්න සෙවීමට කාලය නාස්ති කළ යුතු නැත. දෙකම කළුය. එබැවින් ඒ දෙකම අත්හළ යුතුය. 2015 දී ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ සාධාරණය, යහපත් ආණ්ඩුකරණය පිළිබඳ අපේක්ෂා දල්වා සිටි සියලු ප්‍රගතිශීලීන්ට, මානවවාදීන්ට, ප්‍රජාතන්ත්‍රවාදීන්ට මෙන්ම වාමවාදීන්ටද දැන් විශ්වාසය තැබිය හැකි දේශපාලන කඳවුරක් තිබේ. ඒ ජාතික ජන බලවේගය විසින් නිර්මාණය කළ දේශපාලන කඳවුරය. දේශපාලන කුහකකමෙන් තොර සියලු දෙනාටම එය හා අත්වැල් බැඳ ගැනීමට කිසිදු බාධාවක් තිබිය නොහැක. ප්‍රතිගාමීත්වයට එරෙහි ප්‍රගතිශීලීන්ගේ ඡන්ද කැඩීම නොකළ යුත්තක් නම් ඔව්! දැන් කළ යුත්තේ ප්‍රගතිශීලී කඳවුරේ ඡන්ද කැඩීමට (බොරු තර්ක දමමින්) දායක වනවා වෙනුවට ජාතික ජන බලවේගය නියෝජනය කරන දේශපාලන කඳවුර ශක්තිමත් කිරීමය. ඒ හැර අන් විකල්පයක් නැත. මන්ද රට ඉල්ලා සිටින සැබෑ විකල්ප බලවේගය දැන් ගොඩනැගී ඇති නිසාය. මෙම ජනාධිපතිවරණයේදී දිනවිය යුත්තේ එම බලවේගයයි.

# ජනාධිපතිවරණය හා ධනවාදී කඳවුරේ අර්බුදය



ඉදිරි ජනාධිපතිවරණය පදනම් කර ගනිමින් මේ දිනවල ප්‍රධාන ධනේශ්වර පක්ෂ දෙක තුළ මතුව ඇති අර්බුදය සරල නොවන බව දිනපතා සිදුවීම් නිරීක්ෂණය කරන විට හොඳින් පෙනේ.

පාලක එක්සත් ජාතික පක්ෂයට මේ ලිපිය ලියන මොහොත වන විටත් තම ජනාධිපති අපේක්ෂකයා තීරණය කර ගැනීමට නොහැකිව තිබේ. රනිල්ගේ පක්ෂ නිල බල අධිකාරියට පිටින් ප්‍රාදේශීය රැලි පවත්වමින් සජිත් අපේක්ෂකයා සේ මතුවීමට උත්සාහ කිරීම එ.ජා.ප.ය දෙකඩ වීමට තරම් ප්‍රමාණවත් අර්බුදයක් නිවමා තිබේ. එහෙත් තවමත් අගමැති රනිල් සටන අත්හළ බවක් පෙනෙන්නේද නැත. රනිල් සජිත්ට අපේක්ෂකත්වය දේ යයි සිතිය නොහැක. අනෙක් අතින් කරු ජයසූරියද අපේක්ෂකත්වයට බලාපොරොත්තු දල්වාගෙන සිටී. පක්ෂයක් ලෙස ජනාධිපතිවරණයට පොදු එකඟතාවයෙන් අපේක්ෂකයෙක් ඉදිරිපත් කර ගැනීමට නොහැකි, එකිනෙකා බලය සඳහා අපේක්ෂකත්වයට පොරකන පක්ෂයක් රටක විනය හදන්නේ කෙසේදැයි ජනතාව දැන්වත් සිතිය යුතුය. එ.ජා.ප. නායකයා ජනාධිපතිවරණයට සුදුසු නැතැයි කියන්නේ එ.ජා.ප.යේම මැති ඇමතිවරුය. ඉන් කියවෙන්නේ කුමක්ද? එ.ජා.ප.යේ නායකයාට තම පක්ෂය පාලනය කරගත නොහැකි නම් රටක් පාලනය කර ගන්නේ කෙසේද? මේවා බැහැර කළ නොහැකි ප්‍රශ්නයන්ය.

අනෙක් අතට සජිත් ප්‍රේමදාස මේ 'දඟලන්නේ කුමකටද? රට හැදීමටද? නැත. ඔහු දේශපාලනයේදී කිසිදු ස්ථාවරයක් (හරි හෝ වැරදි) නැති තවමත් පියා ජීවත් වූ අතීතයේ ජීවත් වෙමින් පියාගේ නම උපයෝගී කරගෙන බලයට ඒම උත්සාහ කරන බලලෝභියකි. අපේ රටේ ජනතාවගේ ගැටලුවකදී අරගලයකදී ඔහු කවදාවත් එය නියෝජනය කර නැත. මහජන මුදල් වියදම් කරමින් තම පුද්ගල ප්‍රතිරූපය ගොඩනැගීමට තැනින් තැන ගෙවල් කිහිපයක් හදා රට පුරා පෝස්ටර් අලවනවා මිස රටේ කිසිදු ජාතික ප්‍රශ්නයකදී ඔහු තම අදහසවත් පවසන්නේ නැත. ඔහු දැන් බලය ඉල්ලීමට සූදානම් වන්නේද ඔහුම කියන ලෙසට 'සජිත් ප්‍රේමදාස යුගයක්' නිර්මාණය කිරීමටය. රටේ දේශපාලනයේ මේ මොහොතේ ඉල්ලා සිටින්නේ කුමක්ද යන්න ගැනවත් අවබෝධයක් නැති, තමන් විසින් මවා ගත් මනෝ ලෝකයක ජීවත් වන සජිත් වැන්නන් එ.ජා.ප.යේ ජනාධිපති අපේක්ෂකත්වයට යෝජනා කිරීමට සිදුවීමම එ.ජා.ප.ය මුහුණ පා සිටින නායකත්වය අර්බුදයේ තරම පෙන්වයි.

මේ ප්‍රශ්නයේදී හැම දෙනාම සිටින්නේ තම 'බලය' රැකගැනීමේ සටනේය. රනිල් උත්සාහ කරන්නේ ජනාධිපති අපේක්ෂකකම නැති වුවත් අඩුගානේ පක්ෂ නායකකමවත් රැක ගැනීමටය. ඔහුට රට අදාළම නැත. අනේක් අයත් එසේමය. එබැවින් මේ මොහොතේ එ.ජා.ප.ය මුහුණදී ඇති අර්බුදය ඔවුන් වෙත බලවේග කැන්දන එකක් නොව දැන් සිටින බලවේගද අහිමි කරගන්නා එකක් වී තිබේ.

ඒ අතර රාජපක්ෂ කඳවුරේ 'සහෝදර සමාගමේ' සීතල යුද්ධයද දිය යටින් ගින්දර ගෙන යන ක්‍රමයට වර්ධනය වෙමින් තිබේ. වෙනත් කළ හැකි කිසිවක් නොමැති නිසා මහින්ද රාජපක්ෂ විසින් ගෝඨාභය ජනාධිපති අපේක්ෂකයා ලෙස නම් කළද එය කළේ හොඳම කැමැත්තෙන් නොවන බව කවුරුත් දනිති. දැන් මහින්දගේ අරමුණ ගෝඨා මහින්දට වඩා මතුවීමට ඉඩ නොදී ඔහුට යටින් තබා ගැනීමය. ඒ නිසා ගෝඨාභය දැනට මහින්ද අත නැටවෙන රූකඩයක් බවට පත්ව තිබේ.

> මෙම දේශපාලන සංදර්භය තුළ ධනපති කඳවුරේ අභ්‍යන්තර අර්බුදය විසිනුත්, ඔවුන්ගේ වසර 71ක භාවිතයේ ප්‍රතිඵල විසිනුත් ජනතාව විකල්පයක් පිළිබඳ වෙනදාට වඩා වැඩියෙන් අවධානය යොමු කරමින් සිටීම විසිනුත් නව විකල්ප දේශපාලන ව්‍යාපාරයකට වෙනදා නොතිබූ වාසිදායක තත්වයක්, ඉඩක් විවර වී තිබේ.

ජනාධිපති අපේක්ෂක ලෙස ගෝඨාභය නම් කිරීමෙන් පසුත් හැම වේදිකාවකම, අවස්ථාවකම ලොකු පුටුවේ, උස පුටුවේ සිටින්නේ මහින්දය. එසේම ගෝඨාභය අපේක්ෂකයා ලෙස කවුරු හමුවීමට ගියත්, කුමන අවස්ථාවකට ගියත් මහින්ද නොමැති නම් වෙනත් රාජපක්ෂ කෙනෙක් හෝ (චමල් හෝ නාමල්) ඔහු අසල තැබීමට මහින්ද වගබලා ගෙන ඇත. ඒ ගෝඨාභයට තනිවම මතුවීමට ඉඩ නොදීම සඳහා බව පැහැදිලිය.

ඊට අමතරව ගෝඨාභය ජනතාව අමතන අවස්ථා අඩුකිරීමටත් අඩුවෙන් කතා කිරීමට සැලැස්වීමටත්, මාධ්‍යවේදීන් ප්‍රශ්න ඇසීම වැළැක්වීමටත් දැනටමත් මහින්දලා විසින් විවිධ පියවර ගෙන තිබේ. ඒ ගෝඨා 'කට වරද්දා ගන්නා' නිසා පමණක් නොවන බවද වෙනත් අරමුණක් එහි ඇති බවද යමෙක් පවසන්නේ නම් එයද නොසලකා සිටිය නොහැක. එසේම 'පරිසර හිතකාමී' මැතිවරණ ව්‍යාපාරයක් සඳහා යයි ගෝඨා වෙනුවෙන් දැමූ කටවුට්, බැනර්, පෝස්ටර් ඉවත් කිරීමටද (සමහර තැන්වල පමණක්) රාජපක්ෂවරු පියවර ගත් අතර නාමල් රාජපක්ෂ පක්ෂ සංවිධායකයින්ගේ රැස්වීමකදී උපදෙස් දෙනු ලැබුවේද කටවුට්, පෝස්ටර්, පොලිතින් භාවිතා නොකරන ලෙසය.

තමන්ගේ වුවමනාවන් වෙනුවෙන් පරිසරය මුළුමනින්ම විනාශ කළ 2015 ජනාධිපතිවරණයේදී රට පුරා මහින්දගේ යෝධ කටවුට් වැපිරූ නාමල්ලා, ගෝඨාභයගේ කටවුට් ඉවත් කිරීම හා කටවුට්වලින් තොර මැතිවරණ ව්‍යාපාරයක් වෙනුවෙන් ඉදිරිපත් වීම තේරුම්ගත යුත්තේ පරිසර ප්‍රශ්නයක් ලෙසට නම් නොවේ. එහි වෙනත් අරමුණක්ද තිබිය හැකිය.

මේ අනුව ගෝඨාභයගේ 'පැමිණීම' සිතූ තරම් 'නැගල යන වර්ගයේ එකක්' නොවූ බව පැහැදිලිය. ඔවුන් දැනටමත් ජනමාධ්‍ය සමග ගැටලු හදා ගනිමින් සිටී. ගෝඨාභයට උදව්කරන අවශේෂ කණ්ඩායම්වල සමහරුද කලින් තිබූ සද්දය දැන් අඩුකරගෙන තිබෙන බවද පෙනේ. මේ සියලු කරුණුවලින් පෙන්වන්නේ රාජපක්ෂ කඳවුරේ සීතල යුද්ධය උණුසුම් වන බවමය.

මෙම දේශපාලන සංදර්භය තුළ ධනපති කඳවුරේ අභ්‍යන්තර අර්බුදය විසිනුත්, ඔවුන්ගේ වසර 71ක භාවිතයේ ප්‍රතිඵල විසිනුත් ජනතාව විකල්පයක් පිළිබඳ වෙනදාට වඩා වැඩියෙන් අවධානය යොමු කරමින් සිටීම විසිනුත් නව විකල්ප දේශපාලන ව්‍යාපාරයකට වෙනදා නොතිබූ වාසිදායක තත්වයක්, ඉඩක් විවර වී තිබේ.

නායකයන් පිටුපස අන්ධයන් සේ ගාටන සාමාජිකයන්ගෙන් පමණක් ඡන්ද දිනිය නොහැක. වෙනසක් සොයන, ප්‍රගතිශීලී හා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජීවත්වීමට කල්පනා කරන පොදු ජනතාවගේ විශ්වාසය දිනා ගැනීම ජයග්‍රහණය සඳහා අත්‍යවශ්‍යය. ප්‍රජාතන්ත්‍රවාදී හා ප්‍රගතිශීලී බලවේගයන් සහාය දිනාගැනීමට ධනවාදී කඳවුරේ අපේක්ෂකයන් දෙදෙනාම සමත් වන්නේ නැත. අනෙක් අතට දෙමළ හා මුස්ලිම් ඡන්ද දිනාගැනීමේදී ගෝඨාභය මෙන්ම එ.ජා.ප.යෙන් ඒ යැයි සිතෙන අපේක්ෂකයාද සමත් වන්නේ නැත. කලක් සිංහල ජාතිවාදය ඇවිළවීම නිසා ගෝඨාභයලාට මුස්ලිම් හා දෙමළ ඡන්ද ලබාගැනීමට දුෂ්කර වී තිබෙන අතර දැන් හදිසියේ එම ඡන්ද ගැනීමට මුස්ලිම් පල්ලි ගානේ යාමට සිදුවීම නිසා තමන් විසින්ම හදාවඩාගත් සිංහල ජාතිවාදීන් අවුල්වීම වැළැක්විය හැකි වන්නේද

15 වැනි පිටුවට



# YES WE CAN

## අපේක්ෂාව

පසුගියදා තරුණ යැයි පැවසූ සමුළුවක් නෙළුම් පොකුණ රඟහලේදී පැවැත්වුණි. කඩිමුඩියේම ඔවුනට තරුණ සමුළුවක් මතක්වූයේ ජනාධිපතිවරණය අතළඟ නිසා බව කාටවත් වසන්කළ නොහැක. හාස්‍යය වන්නේ පසුගිය කාලය පුරාම රටේ තරුණයින් උන්නද මළාද නොබලපු අය, රටේ තරුණයින් මුහුණ දෙන සැබෑ ප්‍රශ්න මොනවාද යන්නවත් නොදන්නා අය රටේ තරුණයින් වෙනුවෙන් නෙළුම් ප්‍රකාශන ලබාදීමය. ගොනා හැරෙන්නේ පොල් පැළයට බව අවබෝධ කරගත යුතුය. තරුණයින් රවටා ඡන්ද කුට්ටිය ඩැහැගෙන පොහොට්ටුවේ අපේක්ෂකයා ජයග්‍රහණය කරවීම මොවුන්ගේ ඒකායන පරමාර්ථයයි.

ඔවුන් මේ ජයග්‍රහණය කරවන්නට කැසකවන්නේ ගොඨාභයයි. ඒ වෙනුවෙන් මේ තරුණ සමුළුව නියෝජනය කළ අයද අපේක්ෂකයා මෙන්ම දූෂිතය අයවලුන්ය. නාමල් රාජපක්ෂ යනු තාත්තා ජනාධිපති වී සිටි සමයේ සිදුවූ බොහෝ දූෂණ වංචාවලට හවුල් වී සිරගතව සිට දැන් ඇප මත නිදහස්ව සිටින පුද්ගලයෙකි. වේදිකාවේ සිටි තවත් අයෙක් වන්නේ සේනානි සමරනායකයි. ඇයත් මූල්‍ය වංචා නිසා සිරගතව සිට දැන් ඇප පිට සිටින්නීය. දිලුම් අමුණුගම යනු පසුගියදා පාර්ලිමේන්තුවේ දේපළවලට හානිකරමින් යකා නැටූ පුද්ගලයාය.

මෙම ජනාධිපතිවරණයේදී එක් පාර්ශවයක් නියෝජනය කරන්නේ ගෝඨාභය ඇතුළු මේ හොර නඩයයි. මේ තරුණ සමුළුවෙන් එය විද්‍යාමාන විය. ගෝඨාභයට ඇත්තේ කළු ඉතිහාසයකි. ජනතා දේපළ සාවද්‍ය ලෙස පරිහරණය කිරීම, මූල්‍ය වංචා ගණනාවකටම සම්බන්ධ වීම, විරුද්ධවාදීන්ට පහරදීම, අතුරුදහන් කිරීම, පැහැරගෙන ගොස් ඝාතනය කිරීම, මාධ්‍යවේදීන් අතුරුදහන් කිරීම, ඝාතනය කිරීම හා පහරදීම, මාධ්‍ය ආයතනවලට පහරදීම වැනි බරපතළ ගණයේ සිදුවීම්වලට මොහුට එරෙහිව නඩු විභාග වෙමින් තිබේ.

අනෙක් පාර්ශවය නියෝජනය වන්නේ එ.ජා.ප.යෙනි. සජිත් ප්‍රේමදාස එහි අපේක්ෂකයා බව ඔහුම කියාගෙන යයි. ඒ නිසාම එ.ජා.ප.ය තුළ ප්‍රබල බෙදීමක් වර්ධනය වෙමින් ඇත. සජිත්, ගෝඨාභයට නොදෙවෙනිය. තාත්තා ජනාධිපති වී සිටි සමයේ විනෝදාස්වාදයට කළේ රටේ තිබුණු නිදන් ගොඩදැමීමය. තවමත් ඒ පුරුද්ද අතහැර නොමැත. මේ ආණ්ඩුවේ ඇමතිකම් දරමින් තරුණයින්ට, උපාධිධාරීන්ට රැකියා දෙනවා වෙනුවට ඔහුගේ හෙන්චයින්ට රැකියා දුන්නේ සුදුසුකම ලෙස උසද මිටිද යන්න සලකා ගෙනය. මෙම රැකියාදීමට එරෙහිව අල්ලස් කොමිසමේ මොහුට එරෙහිව නඩුවක්ද ගොනුකරනු ලැබ ඇත. අලුත්ම චෝදනාව වන්නේ තම අමාත්‍යංශයට පුරප්පාඩු ඉක්මවා සේවකයින් බඳවා ගැනීම සහ මධ්‍යම සංස්කෘතික අරමුදල හින්දවීමය. මේ ජනාධිපති වීමට පෙරය.

මීළඟ පාර්ශවය වර්තමාන ජනාධිපතිවරයායා. ජනතා අපේක්ෂාවන් මහ දවාලේම අමු අමුවේ උල්ලංඝනය කරමින් තම පදනම් සුනුවිසුණු කරගනිමින් අනාථභාවයට පත්ව ඇති පුද්ගලයාය. දැන් කාට හෝ මුක්කුවක් ගසා අගමැති ධූරය සඳහා කෙළ හළමින් සිටින්නේ ඔහුය.

මෙම පුද්ගලයින් මගින් තරුණ පරම්පරාවේ අපේක්ෂාවන් ඉටුකරගත හැකිද?.

හමුදාව යොදවා තරුණ ප්‍රශ්න මර්දනය කරනවා වෙනුවට එම ප්‍රශ්නවලට නම්‍යශීලී විය හැකි, උස්මිටිකම් බලා තම හෙංචයින්ට පමණක් රැකියා දෙනවා වෙනුවට සියලු රැකියා විරහිතයින්ට සාධාරණයක් කළ හැකි, තරුණයින්ට කුඩු වෙනුවට සාධාරණ අධ්‍යාපන ක්‍රමයක් ළඟා කර දිය හැකි, තරුණ කාගේත් අපේක්ෂාවන් අමු අමුවේ බොඳකර දමනවා වෙනුවට සියලු දූෂකයින් හට දඬුවම් දිය හැකි, තරුණ අපේක්ෂාවන් ඉටුකරගත හැකි නායකත්වයක් අවැසි වී තිබේ.

ඒ වෙනුවෙන් කැපකිරීම් කළ හැකි, රටේ උගතුන්ගේ හා බුද්ධිමතුන්ගේ අදහස්වලට ගරුකරමින් නිවැරදි වැඩපිළිවෙළක් හා දැක්මක් සහිත, අදූෂිත පුද්ගලයින්ගෙන් සැදුම්ලත් නායකත්වයක් ජාතික ජන බලවේගය යටතේ නිර්මාණය වී තිබේ. ඒ සඳහා ජනතා බලවේගයක් ලෙස එක්වෙමු. ජනතා අපේක්ෂාවන් සඵල කරගැනීමට බුද්ධිමත්ව මැදිහත් වෙමු.

## ජය ටැඹ මානයේ

================

දශක ගණනක්
තැලුම් කෑ තරමක්
පතිතව දාහයේ
දිය බිම් තෙත් කොට...
කඳුළු පිරි දෑස්
විවර කොට බලනු...
ඉදිරියෙන් පෙනෙන්නේ
පෙර නොදුටු ජයටැඹක්...
ඉතිහාසෙ ගොඩනැඟූ
අරගලයේ පරමාදර්ශය
හෙට ලොවට ජය ගෙනෙන
ධෛර්යයේ වත්කම
වෙර දරා පල දරන
ජය ලබන හෙට රට..
නොනැවතී යා යුතුය
දන දිනන පෙරමඟ
විවර කොට ඔබ මම...



# ඇගේ කඳුළු බර වැඩියි

වසර ගණනාවක් තිස්සේ මුස්ලිම් විවාහ නීතිය සහ දික්කසාද නීතිය සංශෝධනය කළ යුතු බවට සංවාදයක් ලාංකේය සමාජය තුළ පැවතුණි. මේ පිළිබඳ වැඩි වැඩියෙන් කතා බහට ලක් වූයේ පසුගිය අප්‍රේල් 21 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුවයි. මේ පිළිබඳව සිංහල සමාජයේ ඇතැමුන් ජාතිවාදී ඇසින් මෙය විග්‍රහ කළ අතර තවත් කොටසක් මෙහි යථාර්ථය තේරුම්ගෙන මුස්ලිම් කාන්තාව මුහුණ දෙන ඇත්ත පීඩනයට එරෙහිව හඬ නැගූහ. මේ පිළිබඳව මුස්ලිම් සමාජයනුත් යම් හඬක් 21 ප්‍රහාරයට පෙර සිටම තිබුණි. කෙසේ නමුත් පසුගිය කාලය තුළ ඒ හඬ වැඩි වැඩියෙන් ප්‍රබල විය. එම නිසාම පාර්ලිමේන්තුව දක්වාද මෙම සංවාදය ගොඩනැගුණි.

මෙම මුස්ලිම් කාන්තාව පත්ව ඇති අසාධාරණය පිළිබඳ සමාජ කතිකාවක් ගොඩනැගීමේ අරමුණින් අලුත් පියාපත් සංවිධානය විසින් පසුගිය අගෝස්තු 23 දින "ඇගේ කඳුළු බර වැඩියි" යනුවෙන් මුස්ලිම් විවාහ සහ දික්කසාද නීතිය පිළිබඳ විද්වත් සංවාදයක් කොළඹ මහජන පුස්තකාල උඩුමහල් ශ්‍රවණාගාරයේදී පැවැත්වනු ලැබීය. මෙම වැඩසටහන ඔවුන්ගේ ෆේස්බුක් පිටුව ඔස්සේ සජීවීව ලබා දී තිබිණි.

මුස්ලිම් විවාහ සහ දික්කසාද නීතියේ ලංකාවේ පසුබිම, එහි ආගමික පසුබිම, මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ ගැටලු සහ ඒවාට යෝජනා කර ඇති සංශෝධන, මෙම සංශෝධන ක්‍රියාත්මක වීමට ඇති බාධාවන්, ලංකාවේ ක්‍රියාත්මක වෙනත් විශේෂ නීති මෙන්ම බාල වයස් විවාහවල ජෛව විද්‍යාත්මක සහ මනෝ වෛද්‍ය විද්‍යාත්මක පදනම පිළිබඳවද මෙහිදී සංවාදයට බදුන් කෙරිණ. විද්වත් අදහස් දැක්වීම් මෙන්ම ප්‍රේක්ෂකාගාරයේ අදහස් දැක්වීම සහ ගැටලු ඉදිරිපත් කිරීම සඳහාද මෙහිදී අවස්ථාව ලබා දෙනු ලැබිණ.

මිනිසුන් ලෙස අප සියලු දෙනාම මෙම අරගලය සඳහා සහය දිය යුත්තේ මන්ද යන්න සමාජගත කිරීම සඳහා පැවති මෙම විද්වත් සාකච්ඡාව සඳහා මුනීර් මුනෆ්ෆර් මවුලවිතුමන්, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රිනී ෆෙරියල් අශ්රොෆ් මහත්මිය, නීතිඥ රාස්මාරා ආබිදීන් මහතා, නීතිඥ අර්මිසා ටෙගල් මහත්මිය, නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනවිය සහ වෛද්‍ය අසංග වික්‍රමසිංහ මහතා යන අය සංවාදය සඳහා එක් වූහ.

මෙම අවස්ථාවට නීතිඥවරුන්, සිවිල් ක්‍රියාකාරීන්, කලාකරුවන්, බුද්ධිමතුන් ඇතුළු සිංහල දෙමළ මුස්ලිම් තරුණ තරුණියෝ විශාල පිරිසක් සහභාගි වීම කැපී පෙනුණි.


















## වසර මිලියන 19කට පෙර විසූ ගිරවෙක්



වසර මිලියන 19කට පෙර ජීවත් වූ ගිරවෙකුගේ පොසිලයක් නවසීලන්තයේ මධ්‍යම ඔටෙගෝ පළාතේ තිබී හමුව ඇත. මිහිමතින් වඳ වී ගිය පක්ෂයෙකු ලෙස සැලකෙන මෙම ගිරවා Heracles Inexpectatus යනුවෙන් හැඳින්වේ. මෙම පක්ෂියා දිගින් අඩි 3.3 ක් වූ අතර බර කිලෝග්‍රෑම් 07 ක් පමණ බවත් ඔස්ට්‍රේලියාවේ නිව්සවුත්වේල්ස් විශ්වවිද්‍යාලයේ පර්යේෂකයෝ පවසති.

## හුආවෙයිගෙන් තමන්ගේම මෙහෙයුම් පද්ධතියක්




හුආවෙයි සමාගම තමන්ගේම වූ මෙහෙයුම් පද්ධතියක් පසුග යදා එළිදැක්වීමට සමත් වී ඇත. මෙම නව මෙහෙයුම් පද්ධතිය යොදා ගනිමින් නවතම ස්මාර්ට් රූපවාහිනියක් නිර්මාණය කර ඇති බව හුආවෙයි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ජෝර්ජ් ෂාඕගේ පවසා තිබේ. මෙය හාර්මන්ඕස් ලෙසින් නම් කර තිබේ. මෙම මෙහෙයුම් පද්ධතිය ඉදිරියේ දී හුආවෙයි ජංගම දුරකතන සඳහා භාවිත කළ හැකි බව සමාගම වැඩිදුරටත් පවසයි.

## ලොව විශාලතම ගොවිපොළ පැරිසියේ වහලයක් උඩ



ලෝකයේ විශාලතම ගොවිපොළ ප්‍රංශයේ පැරිස් නුවර තට්ටු හයක ගොඩනැගිල්ලක වහලයේ ඉදිකෙරෙමින් පවතින බව වාර්තා වේ. මෙය වර්ගමීටර 14,000ක විශාලත්වයෙන් යුක්ත අතර 2020 වසන්ත සමයේ දී විවෘත කිරීමට නියමිතය. මෙහි එකිනෙකට වෙනස් එළවළු හා පළතුරු පැළ විශේෂ 30කට අධික ප්‍රමාණයක් වගා කෙරෙන බවත් ඒ හරහා දිනෙකට කිලෝග්‍රෑම් 1000 නිෂ්පාදනයක් අපේක්ෂා කෙරෙන බවත් මෙම ගොවිපොළ බිහි කිරීමට දායක වූ ඇග්‍රෝපොලිස් සමාගමේ නිර්මාතෘ පැස්කල් හාර්ඩි පවසා තිබේ.

## සැපාටා ඉංග්‍රීසි ඕඩය හරහා සාර්ථකව පියාසර කරයි



ජෙට් බලයෙන් ක්‍රියාත්මක ෆ්ලයිබෝඩ් උපාංග යොදා ගනිමින් ඉංග්‍රීසි ඕඩය හරහා පියාසර කිරීමට ප්‍රංශ නිර්මාණකරුවෙකු වන ෆ්‍රැන්කි සැපාට පසුගියදා සමත් විය.
භූමිතෙල් දහනයෙන් ක්‍රියාත්මක ටර්බයින 5ක් ඇතුළත මෙම ජෙට්ස්කි ෆ්ලයිබෝඩ් උපාංගයට පොළවේ සිට මීටර 15 ත් 20 ත් අතර උසකින් පැයට කිලෝමීටර 190 ක පමණ වේගයකින් පියාසර කිරීමේ හැකියාව පවතී. සැපාටා මීට වසර 03 කට පෙර මෙය නිර්මාණය කර ඇති අතර ඉන්ධන ලබා ගැනීම සඳහා සාගරයේ පිහිටි වේදිකාවක් මතට සාර්ථකව ගොඩබැස්වීමට හැකිවීමද ඔහුගේ මෙම පියාසැරියේ සාර්ථකත්වයට හේතු වී තිබේ.

# රටට අවශ්‍ය සමාජ ආර්ථික දේහයේ පුළුල් පරිවර්තනයක්



ජාතික ජන බලවේගයේ ජනාධිපති අපේක්ෂක
**අනුර දිසානායක සහෝදරයා**

***නියමුවා:- සාම්ප්‍රදායික පක්ෂ ජනාධිපති අපේක්ෂකයෙකු තෝරා ගැනීමේ අර්බුදයක ගිලී සිටියෙදී ජනතා විමුක්ති පෙරමුණද ඇතුළත් සංවිධාන 28කින් සමන්විත ජාතික ජන බලවේගය විසින් ඒකමතිකව ඔබ තෝරා ගනු ලැබුවා. මේ පරිසරය පිළිබඳව පැහැදිලි කළොත්.***

***අනුර දිසානායක සහෝදරයා:-*** අවුරුදු 71 ක් අපේ රටේ අනුගමනය කරන ලද සමාජ ආර්ථික ප්‍රතිපත්ති අපේ රටේ විනාශය කරා ඇදගෙන ගොස් තිබෙනවා. ඒ නිසා මෙම තත්වයෙන් අපේ රටත් අපේ රටේ ජනතාවත් මුදා ගැනීමේ වගකීම ජනතා විමුක්ති පෙරමුණේ අපට පමණක් නොවෙයි අප සියලු දෙනා විසින්ම පවරාගත යුතුව තිබෙනවා. අන්න ඒ අරමුණින් තමයි ප්‍රගතිශීලී, වාමාංශික, ප්‍රජාතන්ත්‍රවාදී සංවිධාන සමග අප ජාතික ජන බලවේගය ගොඩනගනු ලැබුවේ. එය හුදු මැතිවරණ පෙරමුණක් නොවෙයි; මේ සමාජ පරිවර්තනය වෙනුවෙන් දිගුකාලීන අරගලයක් අපට තිබෙනවා. ඒ අරගලය සඳහා ඒකරාශී කර ගත හැකි, ඒකරාශී කර ගත යුතු සියලුම ප්‍රජාවන් ඒකරාශී කර ගැනීමේ අරමුණෙන් තමයි ජාතික ජන බලවේගය ගොඩනගනු ලැබුවේ. ඒ වගේම මේ දිගුකාලීන දේශපාලන පොර පිටියේ අවස්ථාවක් තමයි මැතිවරණය කියන්නේ. ඒ නිසා අපි මැතිවරණ උපයෝගී කර ගන්නේත් එම අරමුණ සාර්ථක කර ගැනීම වෙනුවෙනුයි. මේ තත්වය තුළ එළඹී ජනාධිපතිවරණය වෙනුවෙන් ජාතික ජන බලවේගයේ කඳවුර නියෝජනය කරමින් මාව අපේක්ෂකයා හැටියට තෝරාගෙන තිබෙනවා.

***නියමුවා:- ඔබ ජයග්‍රහණය කළහොත් ඔබ ලංකාවේ අවසාන විධායක ජනාධිපතිවරයා වෙයිද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** අනිවාර්යයෙන් එසේ වනවා. මොකද අපේ රටේ විධායක ජනාධිපති ධුරය තක්කඩි ඒකාධිපතියන්ගේ සිට විහිළුකාරයන් දක්වා පාලනය කර එම ධුරයේ විනාශකාරී තත්වය අපිට ඕනෑවටත් වඩා වැඩියෙන් ඔප්පු කොට තිබෙනවා. ඒ නිසා තවදුරටත් අපේ රටේ විධායක ජනාධිපති ක්‍රමයක් තිබිය යුතු නැහැ. ඒ වෙනුවට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතුයි කියන ස්ථාවරයේ අපි ඉන්නවා. හැබැයි එය සිදුවීම සඳහා ජනාධිපතිවරණ ජයග්‍රහණයෙන් පසුව අනිවාර්ය ලෙස පාර්ලිමේන්තුවේ බහුතර බලය ලබා ගත යුතුයි.

සාමාන්‍යයෙන් අපේ ඉතිහාසයෙන් ලද අත්දැකීම තමයි ජනාධිපතිවරණය ජයග්‍රහණය කරන කෙනා අතට තමයි පාලන බලය හිමිවන්නේ. අන්න එම පාලන බලයේ වැඩ කොටස් අතර, ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමත් ප්‍රධාන වැඩ කොටසක් බවට පත්වෙන්නේ. අන්න ඒ ප්‍රජතන්ත්‍රවාදය තහවුරු කිරීමේ වැඩ කොටස ඇතුළේ තමයි විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට අපේ යෝජනාව තිබෙන්නේ. ඒ නිසා අනිවාර්යයෙන්ම අවසන් විධායක ජනාධිපතිවරයා බවට පත්වෙන එක නම් නිසැකයි.

***නියමුවා:- බොහෝ අපේක්ෂකයින් ජයග්‍රහණය වෙනුවෙන් ජාතිවාදය වපුරද්දී මංගල රැලියේදීම ඔබ ජාතික සමගිය අවධාරණය කළා. ඒ ඇයි?***

***අනුර දිසානායක සහෝදරයා:-*** විශේෂයෙන්ම අපි දන්නව අපේ රටේ විවිධ ජාතිවාදයන්ට කතා කරන නායකයන් ඉන්නවා. සිංහල ජාතිවාදෙට, දෙමළ ජාතිවාදෙට, මුස්ලිම් ජාතිවාදෙට කතා කරන ජාතිවාදී නායකයන් ඉන්නවා. එම නායකයන් තමන්ගේ බලය වෙනුවෙන් ඕනෑවටත් වඩා වැඩියෙන් මේ බිමේ ජාතිවාදය වපුරලා තියෙනවා; යුද්ධ නිර්මාණය කර තියෙනවා; සැකය නිර්මාණය කර තියෙනවා; රටේ අනාරක්ෂිත තත්වය නිර්මාණය කර තියෙනවා. ඒ නිසා අද අපේ රටට අවශ්‍ය කර තිබෙන්නේ කවර පන්නයේ නායකත්වයක්ද? එක් එක් ජන කොට්ඨාසයන්ට වෙන වෙනම ආමන්ත්‍රණය කරන, ජාතිවාදී කෝණයෙන් ආමන්ත්‍රණය කරන නායකත්වයක් නොවෙයි අපේ රටට ඕනෑ. රටට අවශ්‍ය සියලු දෙනාට ආමන්ත්‍රණය කළ හැකි නායකත්වයක්. අන්න ඒ නිසා තමයි අපි බය නැතිව තාමත් කෙලින් හිටගෙන ඉන්නේ. අපේ රටට ඉදිරියට යා හැකි වන්නේ ජාතික සමගියේ මාවතේ පමණයි කියන ස්ථාවරය තුළයි, අප සිටින්නේ.

***නියමුවා:- එළඹෙන ජනාධිපතිවරණයේදී දෙමළ හා මුස්ලිම් ජනතාවගේ සහය ජාතික ජන බලවේගයට පළ වනු ඇත්ද? එම ජාතිකත්වයන් නියෝජනය කරන පක්ෂ ඔබට සහය පළ කරන්නේනම් එය භාරගන්නා ප්‍රතිපත්ති රාමුව කුමක්ද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** විශේෂයෙන්ම දෙමළ සහ මුස්ලිම් ජනතාව අතර විශාල වැඩකොටසක් කරන්න මේ වෙනකොට අපි සූදානම් වෙලා සිටිනවා. ඒ වගේම ඔවුන්ගෙන් විශාල ප්‍රතිචාරයක් ලැබෙමින් තිබෙනවා. සියලු ජන කොට්ඨාසයන්ට මේ දේශපාලන පක්ෂ අනුගමනය කරන ලද ප්‍රතිපත්ති, එම ප්‍රතිපත්තිවලින් තමන්ට වූ පීඩාව සහ විනාශය පිළිබඳව ඕනෑවටත් වඩා අත්දැකීම් තිබෙනවා. දෙමළ ජනතාවට විශාල යුද්ධයක් තුළ මෙම විනාශකාරී තත්වය අත්විඳ තිබෙනවා. ඒ නිසා සියලු ජන කොට්ඨාසයන්ට අවශ්‍ය වෙලා තිබෙනවා වෙනස් පරිවර්තනයක්. දෙමළ ජනතාව සහ මුස්ලිම් ජනතාව වෙනදාටත් වඩා වැඩියෙන් ඉතාමත් උද්‍යෝගයෙන් මේ පරිවර්තනය වෙනුවෙන් මැදිහත් වෙන්න සූදානම් බව පෙන්නුම් කර තිබෙනවා. ඒ වගේම එම ජන කොට්ඨාසයන් නියෝජනය කරමින් සිටින වාමාංශික ව්‍යාපාරත් එක්ක සාකච්ඡා කරන්න අපි සූදානම්. ඒ අනුව සියලු ජාතිකත්වයන් ජාතික සමගිය තුළ ඒකරාශී කර ගැනීම තමයි අපේ අරමුණ බවට පත්වී තිබෙන්නේ. අපේ අරමුණ සැකය අවිශ්වාසය දුරු කළ, ජාතික සමගිය රජයන සමාජයක්.

***නියමුවා:- එළඹෙන ජනාධිපතිවරණයේදී කිසියම් හෝ අපේක්ෂකයෙකු පළමු වටයෙන්ම ජයග්‍රහණය කරනු ඇත්ද? ඔබ සිතන අන්දමට විය හැක්කේ කුමක්ද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** අපි දැනට අවධානය යොමු කර තිබෙන්නේ අවසාන ප්‍රතිඵලයේ ස්වභාවය පිළිබඳව නොවෙයි, අපි මැතිවරණ ව්‍යාපාරය ජයග්‍රාහී ලෙසින් ඉදිරියට ගෙනියන්නේ කොහොමද කියන එකටයි. මැතිවරණ ව්‍යාපාරය තුළ ජනතාව ආමන්ත්‍රණය කරන්නේ කොහොමද කියන එක තමයි අපේ සැලසුම් බවට පත්වී තිබෙන්නේ. ඒ නිසා අවසන් ප්‍රතිඵලයේ ස්වභාවය පිළිබඳව තාමත් විග්‍රහයකට යාමට කල්වැඩියි කියා අපි හිතනවා.

***නියමුවා:- මේ වන විට ජනතාව පෙළන ප්‍රශ්නවලට විසඳුම් සහ රට ඉදිරියට ගෙනයන විකල්ප වැඩපිළිවෙළකින් තොරව හුදු පුද්ගල මාරුවකින් රට වෙනස් කළ හැකිද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** කිසිසේත්ම බැහැ. හුදු පුද්ගල මාරුවීම්වලින් මේ රට ඉදිරියට ගෙනයාමට බැරි බව දැන් දශක හතක් තිස්සේ අපේ රටේ ජනතාවට ඔප්පුකොට හමාරයි. එම තත්වය තේරුම් ගැනීම වෙනුවෙන් අපිට ඕනෑවටත් වඩා වැඩියෙන් කාලය ගත කර තිබෙනවා. ඒ නිසා අද අපේ රටට අවශ්‍ය වී තිබෙන්නේ සමාජ ආර්ථික දේහයේ පුළුල් පරිවර්තනයක්. ඒ පරිවර්තනය සඳහා අවශ්‍ය වන විකල්ප වැඩපිළිවෙළ අපි ඉදිරිපත් කර තිබෙනවා.

විශේෂයෙන් මේ වැඩපිළිවෙළ තුළ අපේ රටේ ඇති වී තිබෙන ආර්ථිකයේ ඇති වී තිබෙන අර්බුදය සමනය කරමින් ආර්ථික වර්ධනය සහ ජනතාව පදනම් කරගනිමින් ආර්ථිකය ප්‍රසාරණය වෙමින් ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට ගලායාමේ ආර්ථික සැලැස්මක් ගැන අපි අවධානය යොමු කරනවා. ඒ වගේම සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා අතර ඇතිවී තිබෙන සැකය, අවිශ්වාසය, ක්‍රෝධය, වෛරය තුරන් කරමින් ජාතික සමගිය ගොඩනැගීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙළ, ඒ වගේම අපේ රටේ ඇති වී තිබෙන සමාජ අපරාධ සමනය කිරීම සඳහා අවශ්‍ය නීති විධානයේ ආධිපත්‍යය තහවුරු කිරීම, ඒ වගේම දරුවන්ට පැහැදිලි අනාගතයක්, තරුණ තරුණියන්ගේ හැකියාව හා ශ්‍රමය ඉතාමත් සක්‍රීයව යොදන්න පුළුවන් පාලනයක්, ඒ වගේම වැඩිහිටියන්ට සුරක්ෂිත ජීවිතයක්, අරමුණු කරගත්තු වැඩපිළිවෙළක් අපි ඉදිරිපත් කර තිබෙනවා.

***නියමුවා:- මේ වැඩපිළිවෙළ සඳහා පාදක වනු ඇත්තේ කුමක්ද? එය ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** මේ සඳහා ජාතික විද්වත් සංවිධානය විසින් දැනටමත් සකස් කොට එළිදක්වා ඇති 'ගොඩනගමු ශ්‍රී ලංකාව' වැඩපිළිවෙළ පදනම් කරගන්නවා. සැබැවින්ම එය ක්‍රියාත්මක සඳහා අවශ්‍ය ඉතාමත් දියුණුතම මානව සම්පත අප සතුව තිබෙනවා. විශේෂයෙන් තමන්ගේ පෞද්ගලික ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් තොරව මේ රට ගොඩනැගීම සඳහා අවශ්‍ය වන සත්භාවයෙන් මැදිහත් වන විශාලතම මානව සම්පතක් අප සතුව තිබෙනවා. එම මානව සම්පත විසින් මෙම වැඩපිළිවෙළ ක්‍රියාවට නගමින් මේ රටට අනාගතය ගෙන එන බව ඉතාම පැහැදිලියි.

***නියමුවා:-රටට සෞභාග්‍යයත් ජනතාවට සතුටත් ගෙනෙන සටන ජයග්‍රහණයෙන් අවසන් කළ හැකිද? ඒ සඳහා නිවැරදි දේශපාලන නායකත්වයක්, විද්වත් වැඩපිළිවෙළක් පමණක් ප්‍රමාණවත්ද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** අපි විශ්වාස කරනවා, අපේ රටේ ජනතාව අද දේශපාලන වෙනසක් අපේක්ෂා කරනවා. ඒ දේශපාලන වෙනස වෙනුවෙන් වෙනස් දේශපාලනයක් අවශ්‍ය වී තිබෙනවා. ඒ හුදු දේශපාලකයන්ගෙන් පමණක් නොවෙයි,

**15 වැනි පිටුවට**

> "හුදු පුද්ගල මාරුවීම්වලින් මේ රට ඉදිරියට ගෙනයාමට බැරි බව දැන් දශක හතක් තිස්සේ අපේ රටේ ජනතාවට ඔප්පුකොට හමාරයි. එම තත්වය තේරුම් ගැනීම වෙනුවෙන් අපිට ඕනෑවටත් වඩා වැඩියෙන් කාලය ගත කර තිබෙනවා. ඒ නිසා අද අපේ රටට අවශ්‍ය වී තිබෙන්නේ සමාජ ආර්ථික දේහයේ පුළුල් පරිවර්තනයක්. ඒ පරිවර්තනය සඳහා අවශ්‍ය වන විකල්ප වැඩපිළිවෙළ අපි ඉදිරිපත් කර තිබෙනවා."

# අල ගොවි සටන ජයග්‍රහණය තෙක් ඉදිරියට

ආණ්ඩු පක්ෂය මෙන්ම විපක්ෂයේ ඇතැමුන්ද ජනාධිපති සිහිනයක ගිලී සිටිමින් ජනතාවගෙ ගැටලු අමතක කර දමා ඇත. ඔවුන්ට එම ගැටලු අවශ්‍ය වන්නේ, ජනාධිපතිවරණ වේදිකාවේදී පමණි. එහෙත් ජ.වි.පෙ. මෙන්ම එයට අනුබද්ධ ගොවි, කම්කරු, ශිෂ්‍ය සහ කාන්තා සංවිධාන ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් අඛණ්ඩව පෙනී සිටිමින් සිටී. මේ අතුරින් සමස්ත ලංකා ගොවිජන සම්මේලනය ගොවි ජනතාවගේ ගැටලු විසඳීම වෙනුවෙන් ඉදිරියෙන්ම සිටී.

ගොවීන්ගෙන් ලබා ගත් අර්තාපල් අල සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තුමේන්තුව මගින් ලබා දිය යුතු මුදල් නිසි පරිදි නොලැබීම හේතුවෙන් පසුගිය අගෝසතු 08වැනිදා කොළඹ එම දෙපාර්තුමේන්තුව ඉදිරිපිට සමස්ත ලංකා ගොවිජන සම්මේලනය විසින් උද්සෝෂණයක් පවත්වන ලදී. අනතුරුව එම සම්මේලනයේ සභාපති නාමල් කරුණාරත්න සහෝදරයා සහ දෙපාර්තුමේන්තුවේ සභාපතිවරයා ඇතුළු නිලධාරීන් සමග පැවති සාකච්ඡාවෙන් පසු ගොවීන්ට ලැබීමට නියමිතව තිබූ රුපියල් කෝටි තුනක මුදලෙන් කොටසක් පසුදිනම ගොවීන්ගේ ගිණුම්වලට දැමීමට ඔවුහු ලිඛිතව පොරොන්දු වූහ.

මීට වසරකට පෙර ගොවීන්ගෙන් ලබා ගත් අර්තාපල් අල වෙනුවෙන් රුපියල් කෝටි 18ක මුදලක් ගෙවීම විෂය භාර අමාත්‍යවරයා සහ නිලධාරීන් විසින් පැහැර හැර අල ගොවීන් පීඩාවට පත් කරමින් සිටි මොහොතක සමස්ත ලංකා ගොවිජන සම්මේලනය මෙම ගැටලුවට අවතීර්ණ විය. එම මුදල් ලබා ගැනීම වෙනුවෙන් පැවැත් වූ උද්සෝෂණවල සහ සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස එම මුදල් කොටස් වශයෙන් ගොවීන්ගේ බැංකු ගිණුම් වෙත බැර වී තිබුණි.



# අන්තරේ සහ ජ.වි.පෙ. අතර හමුවක්



ශිෂ්‍යයින්ගේ මෙන්ම රටේ පොදු ජනයාගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි අතීතයක් අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍යබල මණ්ඩලය සතුව ඇත. විවිධ උස් පහත්වීම් මැද අද දවසේද ශිෂ්‍යයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අන්තරය පෙනී සිටී.

මේ අතර ජනතා විමුක්ති පෙරමුණ සහ අන්තර් විශ්වවිද්‍යාල බල මණ්ඩලය අතර සාකච්ඡාවක් පසුගිය අගෝස්තු 06 වැනිදා බත්තරමුල්ල, පැලවත්ත පිහිටි ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වුණි. යෝජිත උසස් අධ්‍යාපන තත්ව සහතික කිරීමේ හා ප්‍රතීතන පනත හරහා නිදහස් අධ්‍යාපනයට එල්ල වන අභියෝගත් ඒවා පරාජය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ගත් මෙහිදී සාකච්ඡාවට බඳුන් විය.

මෙම සාකච්ඡාව සඳහා  අන්තර් විශ්වවිද්‍යාල බල මණ්ඩලය නියෝජනය කරමින් එහි කැඳවුම්කරු මහීල් බණ්ඩාර දෙහිදෙණිය සහෝදරයාද, ජ.වි.පෙ.න් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය නලින්ද ජයතිස්ස සහ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය යන සහෝදරවරු ඇතුළු පිරිසක් සහභාගි වූහ.

# අධිරාජ්‍යවාදී අතපෙවීම්වලට එරෙහි වෙනිසියුලා ජ.වි.පෙ. හමුව

බොහෝ රටවලට සිදුකරනු ලබන අධිරාජ්‍යවාදී අතපෙවීම්වලට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ වාමාංශික මෙන්ම ප්‍රගතිශීලී බලවේගත් සමග එකට සිට ගනිමින් අනවරත අරගලයක යෙදී සිටී. එමෙන්ම ලොව බොහෝ තැන්හි ශිෂ්‍ය, කම්කරු හා කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් සිදුකරන ලබන සටන් සඳහාද තම සහෝදරාත්මක දායකත්වය දක්වනු ලබයි.

විශේෂයෙන් පසුගිය වකවානුවේ වෙනිසියුලාවට සිදුකරන ඇමරිකානු මැදිහත් වීම්වලට එරෙහිවද ජනතා විමුක්ති පෙරමුණ ජාතික හා ජාත්‍යන්තරව සම්බන්ධ විය. දෙපාර්ශවය අතර සබඳතා ශක්තිමත් කරගැනීම වෙනුවෙන් පැවති සාකච්ඡාව සඳහා වෙනිසියුලා විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය රූබන් මොලීනා සහ ඉන්දියාවේ වෙනිසියුලා තානාපති කාර්යාලයේ නෙස්ටර් ලොපේස් යන මහත්වරුන් වෙනිසියුලා රජය නියෝජනය කරමින්ද පාර්ලිමේන්තු මන්ත්‍රීන් වන බිමල් රත්නායක සහ සුනිල් හඳුන්නෙත්ති යන සහෝදරවරුන් ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින්ද සහභාගි වී සිටියහ. මීට අමතරව සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහ සමාජවාදී තරුණ සංගමයේ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම් අංජන අමරසිංහ යන සහෝදරවරුද මේ අවස්ථාවට සහභාගි වූහ.

මෙම සාකච්ඡාව පසුගිය අගෝස්තු 24වැනි දින බත්තරමුල්ල, පැලවත්තේ පිහිටි ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත් විණි. එමෙන්ම අගොස්තු 27වැනිදා මරදාන සමාජය හා සාමයික කේන්ද්‍රයේදී "වෙනිසියුලාවට එරෙහි අධිරාජ්‍යවාදී අත පෙවීම් පරදවමු" යන මැයෙන් සම්මන්ත්‍රණයක්ද ජ.වි.පෙ. විසින් සංවිධානය කර තිබුණි.





# කලා සංගමයෙන් නාට්‍ය පුහුණු වැඩමුළුවක්

දිවයින පුරා විසිරී සිටින නැගී එන කලාකරුවන් ඉලක්ක කර ගනිමින්  සමාජවාදී කලා සංගමය විසින් "සියත් රංග භූමිකා" යන නමින් නාට්‍ය පුහුණු වැඩමුළුවක් ආරම්භ කරන ලදී. සෑම දෙයක්ම මුදල මත සිදුවන වටපිටාවක කලා සංගමය මගින් කිසිදු අයකිරීමකින් තොරව සිදු කළ මේ ක්‍රියාව අංකුර කලාකරුවන්ට මහත් අස්වැසිල්ලක් විය.

මෙම වැඩමුළුවේ පළමු නාට්‍ය දැක්ම පසුගිය අගෝස්තු 03වැනිදා බස්නාහිර පළාත් සෞන්දර්යය නිකේතනයේදී එළිදක්වන ලදී. මෙම අවස්ථාව සඳහා ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක යන සහෝදරවරුන්ද මෙම නාට්‍ය වැඩමුළුව සඳහා ස්වෙච්ඡාවෙන් දායකත්වය ලබා දෙන ලද කලාකරුවෝ රැසක්ද සහභාගි වී සිටියහ.

# 'ශ්‍රී ලංකන්' විකිණීමට තිබේ!

# ජාතික ගුවන් සේවයේ ඉරණම කොයිබටද?




“රටකට ඕන අපමණ අගයක් - අපහට ඕනෑ මෛත්‍රී යුගයක්” - මේ තේමාව මීට වසර 4 1/2 කට කලින් ජනාධිපතිවරණ වේදිකාවේ නිතර ඇසුණු නිසා අදටත් මිනිස් මතකයේ රැව්දේ. දැන් ගතවෙමින් යන්නේ මෛත්‍රී + රනිල් යුගයේ අවසන් මාස කිහිපයයි. මාස 60න් අලුත් රටක් හදන්න පැමිණි ඔවුන්ද සුපුරුදු නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිම ක්‍රියාවට නගමින් රටත් ජනතාවත් තවදුරටත් ණයකාරයින් කරමින්, රටේ අපමණ අගයන් විකුණා දමමින් සිටියි. විකිණීමේ නවතම බිල්ල බවට රාජ්‍ය දේපළ ලෙස ජනතාවට හිමිව තිබූ මහජන බැංකුව හා ශ්‍රීලංකන් ගුවන් සේවය දැන් ඉලක්ක වී ඇත. මහජන බැංකුවේ කොටස් විදේශික සමාගම්වලටද මිලදී ගත හැකි පරිදි බැංකු පනත සංශෝධනයට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර, ආයතනවල පවතින මහා ණය බර පෙන්වමින් ශ්‍රීලංකන් ගුවන් සමාගම තවදුරටත් රජයේ අයිතිය යටතේ පවත්වාගෙන යාමට නොහැකි බව හඟවා විකුණා දැමීමට කටයුතු කෙරෙමින් තිබේ.

### ශ්‍රීලංකන් විකිණීමේ හේතු

2008 අවසානයේ ශ්‍රීලංකන් ගුවන් සේවය එමිරේට්ස් ආයතනය විසින් ලංකාවේ අයිතියට යළි බාරදෙන අවස්ථාවේදී රු. බිලියන 9.3ක මූල්‍ය තැන්පතු ආදායමක් පැවැති අතර 2009 සිට 2019 දක්වා අවු. 10ක (රාජපක්ෂ හා රනිල් වික්‍රමසිංහ පාලන දෙකේම කාලය තුළ) ලංකා ආණ්ඩුවල පාලනය තුළ රු. බිලියන 240ක (කෝටි 24,000) අලාභයක් ලබා ඇත. මෙම කාලය තුළ ගුවන් සේවය මෙහෙයුම් කටයුතුවලින් ලබා ඇති අලාභය පමණක් රු. බිලියන 116කි. (කෝටි 11600කි)

පාඩුවට අමතරව 2019 අප්‍රේල් 30 දිනයට ගෙවිය යුතු මුළු ණය රු. බිලියන 146.6කි. (කෝටි 14600ක්) රු. කෝටි 90ක් ලාභ ලැබූ ආයතනයක් අවු. 10ක කාලය තුළ කෝටි 24,000ක් පාඩු කිරීමට ආණ්ඩුවක් කටයුතු කළේ කොහොමද? විශේෂයෙන් ශ්‍රීලංකන් ගුවන් සේවයට තරගකාරී වෙනත් පෞද්ගලික දේශිය හෝ විදේශීය ගුවන් සේවයක් ක්‍රියාත්මක නොවෙන තත්වයක් තුළ මෙය සිදුවූයේ කෙසේද?

රජයේ ශක්තිමත්ම බැංකු දෙක වන ලංකා බැංකුව සහ මහජන බැංකුව මූල්‍යමය සහාය ලබාදෙන තත්වයක් තුළ සහ ඛනිජ තෙල් සංස්ථාව විසින් රටට ඉන්ධන සපයා සහන දෙමින් තිබියදී මෙම දැවැන්ත පාඩුව හා ණය කන්ද ගොඩගැහී තිබේ. මුළු ණය ප්‍රමාණයෙන් 70%ක් (රු.බිලියන 102) මහජන බැංකුව හා ලංකා බැංකුවට සහ ඛනිජ තෙල් සංස්ථාවට ගෙවිය යුතු ණය වේ.

ශ්‍රීලංකන් ගුවන් සේවයේ ණය බර දළ දේශීය නිෂ්පාදිතයෙන් 1%ක් වන අතර, එයට තම ජීවිතයේ කිසිදාක ගුවන් ගමනක් නොගිය සෑම පුරවැසියකුම රු. 7300ක් බැගින් ගෙවීමට දායක විය යුතු ණය බරකි.



දූෂිත දේශපාලකයින්, හොරුන් හා ද්‍රෝහීන් බලයට ගෙනන ජනතාව වින්දිතයින් නොවේ... අපරාධ සහයකයින්ය.

**ජෝර්ජ් ඕවල්**

### වර්තමාන තත්වය

2019 මාර්තු 31 වනවිට ශ්‍රීලංකන් ගුවන් සේවය සතුව ගුවන් යානා 27ක් පැවති අතර එයින් එකක්වත් ශ්‍රීලංකාවේ අයිතියට සතු ගුවන්යානා නොවීය. සියල්ල වාරික ගෙවමින් පවතින කුලියට ගත් ඒවා වන අතර, ආයතනයේ සමුච්චිත වත්කම්වලද සෘණ මට්ටම රු. මිලියන 175,027ක් (කෝටි 17,502) විය. එය පසුගිය වසරට වඩා 32%ක වැඩිවීමකි. 2016/17 මූල්‍ය ප්‍රකාශන අනුව එම වසරේදී (2017) ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ශුද්ධ අලාභය රු. බිලියන 17,214 (රු. කෝටි 1721ක්) වූ අතර 2018/2019 මූල්‍ය ප්‍රකාශනය අනුව එම ප්‍රමාණය 2018 වසරේදී රු.බිලියන 41,493ක් (රු. කෝටි 4149ක්) විය. වසරක් තුළ රටේ එක රාජ්‍ය ව්‍යාපාරයක පමණක් පාඩුව රු. කෝටි 2428ක් නම්, එය අප වැනි තාමත් දුප්පත්කමේ පතුලට ඇද වැටෙමින් තිබෙන රටකට දරාගත හැකිද?

### පාඩුවේ හේතු දැක්වීම

දැන් ආණ්ඩුව ශ්‍රීලංකන් ගුවන් සේවය පාඩු ලබන බව පිළිගනී. නමුත් ඒ පිළිගැනීමේ අවශ්‍යතාවය යළි ජාතික ගුවන් සේවය ලෙස රජයේ අයිතිය යටතේම දියුණු කිරීම නොව අඩු මුදලකට විකුණා දැමීමයි. ඒ නිසාම පාඩුවේ සැබෑ හේතු හඳුනාගෙන එම හේතු වැළැක්වීම ජනතාවගේ හා රටට ආදරය කරන ජාතික ගුවන් සේවයක අගය වටහා ගන්නා හැමගේම වගකීමයි.

ආණ්ඩුව මේ සා විශාල ශ්‍රීලංකන් ගුවන් සේවයේ පාඩුවට හේතු ලෙස දක්වන්නේ, අකාර්යක්ෂම පරිපාලනය කළමනාකරණ අඩුපාඩු පමණි. එසේ නැතිනම් රාජපක්ෂ පාලනයේ වත්මන් විපක්ෂයේ අය චෝදනා කරන්නේ රනිල් වික්‍රමසිංහ විසින් ගුවන් යානා 8ක් අත්පත්කර ගැනීමේ ගනුදෙනුවේදී එම ගුවන් යානා අවලංගු කිරීමේදී ගෙවන ලද ගාස්තු ගැනය. වත්මන් රනිල් වික්‍රමසිංහ අගමැතිගේ කට්ටිය චෝදනා කරන්නේ රාජපක්ෂ පාලනයේ පැවැති ඥාති සංග්‍රහ සහ රාජපක්ෂවරුන් විසින් ගුවන් යානා මිලදී ගැනීමට අත්සන් කළ ගිවිසුමේ අඩුපාඩු හා ශිරන්ති රාජපක්ෂගේ සොහොයුරා සභාපති ලෙස කරන ලද නාස්තිකාර වියදම නිසා පාඩු ලැබූ බවය.

පසුගියදා කෝප් (පොදු ව්‍යාපාර පිළිබඳව පාර්ලිමේන්තු කමිටුව) කමිටුව හමුවට ශ්‍රීලංකන් ගුවන් සේවයේ අධ්‍යක්ෂ මණ්ඩලය කැඳවූ අවස්ථාවේදී වත්මන් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ශ්‍රීලංකාවේ ගුවන් සේවයේ බිඳවැටීමට බලපාන ප්‍රධාන හේතු කිහිපයක් ඉදිරිපත් කරන ලදී.

ඒ යටතේ ප්‍රධාන හේතුවක් වී ඇත්තේ රජයේම බැංකුවලින් ඉහළ පොලියට ණය ලබාගෙන තිබීමයි. 5.53%ක පමණ (LIBO + 5.53%) පොලියට ශ්‍රීලංකන් සමාගම ණය ලබාගෙන ඇත. වාර්ෂිකව ණය සඳහා පොලී ලෙස ඩොලර් මිලියන 62ක් ගෙවිය යුතු වන අතර එයින් ඩොලර් මිලියන 45ක්ම ගෙවීමට සිදුව ඇත්තේ ලංකාවේ රාජ්‍ය බැංකු දෙකේ ණය පොලිය සහ තෙල් සංස්ථාවේ ණය සඳහා ගෙවන පොලිය බව ඔවුන් කරුණු දක්වන ලදී.

ඊළඟ කරුණ ඉහළ අගයකට කුලී පදනම මත ගුවන් යානා බදු ගැනීම සහ බදු සඳහා ඉහළ වාරික ගෙවීමට සිදුවීමයි. ලංකාවේ ගුවන් සේවයට දැරිය නොහැකි නාස්තිකාර වියදම දරන ගුවන් යානා කල්බදු පදනමට කුලියට ගෙන ඇති නිසා මෙහෙයුම් වියදමින් 27%ක්ම එම ගුවන් යානා කල්බදු වාරික සඳහා ගෙවීමට සිදුව ඇත.

එසේම මෙම ආසියානු කලාපයේම ඉහළම ගුවන් යානා ඉන්ධන මිල අය කරනු ලබන්නේ ලංකාවේ ඛනිජ තෙල් සංස්ථාවයි. ඉහළ ඉන්ධන මිලද පවතින අර්බුදයට බලපා ඇති තවත් හේතුවකි.

දැන් ජනතාව සතු වගකීම වන්නේ, මෙම දූෂිත දේශපාලුවන් රෙදි අපුල්ලන්නා සේ කුණු සෝදා මැතිවරණයෙන් මැතිවරණයට පිරිසිදු කිරීම නොව ඔවුන් මුළුමනින්ම පරාජය කර මෙවැනි ජාතික සම්පත් ආරක්ෂා කර ගැනීමයි. ආසියාවේ හොඳම ගුවන් ගමන් මධ්‍යස්ථානයේ පිහිටි ශ්‍රීලංකන් ගුවන් සේවය රැක ගත හැක්කේද එවැනි ධෛර්යමත් දේශපාලන තීන්දුවකින්ම පමණි.

### පැවැත්ම සඳහා යෝජනාව

ශ්‍රීලංකන් අධ්‍යක්ෂක මණ්ඩලය ගුවන් සේවය විකිණීම වෙනුවට ඉදිරි මාස 3කදී ලාභ පාඩු නොලබන මට්ටමට රැගෙන ඒමට යෝජනා කිහිපයක් ඉදිරිපත් කර ඇත. දැනට ආණ්ඩුව පරදවා අයකරන රඳවා ගැනීමේ බද්ද (with holding tax) ඉවත් කරදීම, රාජ්‍ය බැංකුවලට ගෙවිය යුතු පොලිය අඩුකර පොලී ගෙවීමට සහන කාලයක් ලබාදීම. මෙයින් ප්‍රධාන ඉල්ලීම වේ. එම ඉල්ලීම ආණ්ඩුව ඉටුකර දෙන්නේ නම් 100%ක් රජය යටතේම හිමිකාරිත්වය පවත්වා ගනිමින් ආයතනය පෞද්ගලී කරණය නොකර ලාභ පාඩු නොලබන මට්ටමට පත් කළ හැකි බව වත්මන් අධ්‍යක්ෂක මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කර ඇත.

### විකිණීමේ සඳහා යෝජනාව

ආණ්ඩුව ශ්‍රීලංකන් සමාග මේ ඉල්ලීම ඉටු කිරීමට එකඟ නැත. ඒ වෙනුවට මුදල් අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ඒජන්සිය (PPP) ප්‍රධානි තිලාන් විජේසිංහ යෝජනා කරන්නේ ආණ්ඩුව වෙනුවෙන් භාණ්ඩාගාරයට දැනට ලබා ඇති පාඩුවේ වැඩි පංගුව භාරගෙන හිමිකාරිත්වය විදේශීය සමාගමකට ලබා දිය යුතු බවයි. ආණ්ඩුවේ සූදානම ලබන ලබන පාඩු හා ණය පෙන්වා ගෙඩිය පිටින් විකිණීමටය. දැනට ගණනය කර ඇති මට්ටම යටතේ, ශ්‍රීලංකන් ගුවන් සමාගම යළි ගොඩනැගීමට නම් ඇමරිකන් ඩොලර් මිලියන 900ක් (රු.මිලියන 160,000) වත් අවශ්‍යය. ආණ්ඩුවේ යොජනාව වී ඇත්තේ මේ මුළු මුදලම යෙදවීමට තනි ආයෝජකයකු සොයා ගත නොහැකි නිසා එයින් ඩොලර් මිලියන 500ක් පමණ පාඩු ලෙස රජය වෙනුවෙන් භාණ්ඩාගාරය භාරගෙන ඩොලර් මිලියන 250කට පමණ විදේශීය ආයෝජකයකුට විකිණීමය.

අධ්‍යක්ෂක මණ්ඩලය ඉදිරිපත් කරන යෝජනාවට ඩොලර් මිලියන 500ක් වියදම නොවුණද ආණ්ඩුව එය ප්‍රතික්ෂේප කර ක්‍රියාත්මක කිරීමට සූදානම ඇත්තේ විකිණීමේ PPP යෝජනාවයි.

දැනට පාර්ලිමේන්තුවේ කෝප් කමිටුව මෙම විකිණීමේ තීරණයට බාධකයක් පනවා ඇතත් මෙම වැරදි ආර්ථික ලිබරල්කරණ ප්‍රතිපත්තියම කරපින්නා ගත් කවර ආණ්ඩුවක් බලයට පත් වුවත් විකිණීම අනිවාර්යයෙන්ම සිදුකිරීමේ පිපාසාවෙන් පෙළේ.

### එයාර් බස් ගනුදෙනුව

ගුවන් සමාගමේ ගුවන් යානා ධාරිතාව පුළුල් කිරීමේ වුවමනාව ඉදිරියට දමා පැවැති දූෂිත රාජපක්ෂ පාලනය විසින් A -350 - 900 ගුවන් යානා 8ක් කල්බදු කුලී පදනම යටතේ ලබා ගැනීමට 2013/2014 වසරවල ගිවිසුම්වලට එළඹෙන ලදී.

A -350 - 900 ගුවන් යානා 8න් 4ක් බදු ගැනීමේ ගිවිසුම අවලංගු කිරීමට පමණක් වරින් වර ගෙවීමට සිදුවී ඇති සෘජු පාඩුව රු. මිලියන 17058.1ක් වන අතර, ලැබීමට නියමිත ඉතිරි ගුවන් යානා 4 පිළිබඳව වන්දි ගෙවීමට සිදුවන මුදල තවම අදහසක් නොමැත. මෙම මිලියන 17,058 ශතයකුත් රටට ආදායමක් නොලබා රටට අහිමි කල මුදලකි.

එසේම වරින් වර මෙම ගුවන්යානා මිලදී ගැනීමේදී උපදෙස් ලබා ගන්නා මුවාවෙන් සීබරි, SKY WORKS, නයිරුස් වැනි සමාගම් ලට ගෙවා ඇති උපදේශන ගාස්තුද කෝටි ගණනකි.

රටක ඒකාධිකාරී රාජ්‍ය ව්‍යාපාරයන් නාස්තිකාර නිලධාරින් හා හවුලේ දේශපාලකයින් අතළොස්සකට විකිණිය හැකි බවට හොඳම උදාහරණයකි. ශ්‍රීලංකන් ගුවන් සේවය පාඩු කිරීම හා විකිණීමට දරන උත්සාහය.

දැන් ජනතාව සතු වගකීම වන්නේ, මෙම දූෂිත දේශපාලුවන් රෙදි අපුල්ලන්නා සේ කුණු සෝදා මැතිවරණයෙන් මැතිවරණයට පිරිසිදු කිරීම නොව ඔවුන් මුළුමනින්ම පරාජය කර මෙවැනි ජාතික සම්පත් ආරක්ෂා කර ගැනීමයි. ආසියාවේ හොඳම ගුවන් ගමන් මධ්‍යස්ථානයේ පිහිටි ශ්‍රීලංකන් ගුවන් සේවය රැක ගත හැක්කේද එවැනි ධෛර්යමත් දේශපාලන තීන්දුවකින්ම පමණි.

# පැන් පොදක් වේ නම් වියළි ගම් බිම් අස්වසන්නට...



ඉඩෝරය සංසිඳුවමින් අගෝස්තුවේ වර්ෂාව ඇදහැලේ. ඉරිතලාගිය බොල් පොළව මත කේඩෑරිවී ගිය වෘක්ෂලතාවෝ අලුත්වැස්සෙන් පණ ලබා හිරු දෙසට සිනාසෙයි. වියළි තණ පත් කොළ පැහැයට හැරී ඒ මත කුඩා විසිතුරු මලින් සරසමින් සැප්තැම්බරයට සූදානම් වන්නේ මේ පොළවට නැවුම් බලාපොරොත්තු කැඳවමිනි.

සොබාදම මෙලෙස වෙනස් වෙද්දී මහපොළවද ඒ අනුව වෙනස් වන්නා සේම, රට අලුත් බලාපොරොත්තුවලින් පිරී යමින් තිබේ. ජනතාවද ඒ අනුව සුබවාදී ලෙස වෙනස් වෙමින් ඒ අනුව අනාගතයට සූදානම් වන ලෙසක් දක්නට ඇත. මව් බිමට අලුත් හිරු කැන්දන ඒ මහගු අවස්ථාවන් මුදුන් පමුණුවාලීමට අපේක්ෂාවේ අපේක්ෂකයා අප හමුවට පැමිණ තිබේ. ඇදහැළුණු වර්ෂාවෙන් අගෝස්තු උණුසුම පහව ගියද මේ බිම ජනාධිපතිවරණය උදෙසා උණුසුම් වෙමින් පවතී.

එදා කුංකුනාවේ හිමියන් ලියූ දෙයට ඌණපූර්ණයක් කරමින් "අනේ කුහුඹුන්නේ තොපට පමණක් නොව අපටද රජෙක් නොව සොහොයුරෙක් ඉන්නේ " යැයි කටපුරා සැකයක් නැතිව කිවහැකි අපේම හද ගැස්ම හඳුනන මිනිසෙකු අප හමුවට පැමිණ තිබේ. ඒ ජාතික ජන බලවේග යේ ජනාධිපති අපේක්ෂකයා ලෙසිනි.

අප සම බිමක රඳවන සෙනවියානෝ...

රජෙකැයි අපට නොසිතෙන සොහොයුරාණෝ .. යැයි එදා නන්දා මාලනිය ගැයුවේ ඔහු පිළිබඳව යැයි අපට දැනෙමින් පවතී. 71 වසරක් පුරා ලාංකේය භූමිය මත සිදු නොවූ අපූර්ව විපර්යාසයක ලකුණු අපේ හදවත්වලට දැනෙමින් පවතින මොහොතක ඒ වෙනස සඳහා සියලු ප්‍රමාණාත්මක වෙනස්කම් සිදුවී අවසන් වෙමින් පවතින බව අපට දැනෙමින් ඇත. දැන් ඇත්තේ ගුණාත්මක පිම්මක් වෙනුවෙන් වූ කාර්යභාරයයි. නැතහොත් පුරවැසියන් ඡන්ද දායකයින් බවට පත්වන අවස්ථාවයි.

ඒ අපට ලැබෙන වාරයේදී කළ යුත්තේ කුමක්ද ? ලාංකේය භූමිය මත ජීවත්වන ජනගහනයෙන් 51%ක් කාන්තාවන් බැවින් මේ අපේ වාරය නොව මේ කාන්තාවන්ගේ වාරය යැයි හඳුන්වන්නේ නම් වඩාත් උචිතය. අප එසේ පවසන්නේ රටේ පාලකයන් පත්කිරීමේදී බහුතර කාන්තා ඡන්ද ප්‍රතිශතයක් හේතු සාධක වන බැවිනි. එසේ නම් 2020 ජනාධිපතිවරයා පත්කිරීමේ වැඩිම පංගුකාරයින් වන්නේද කාන්තාවන්මය. එසේ නම් ඡන්දයකදී යමක් වෙනස් කිරීමේ වැඩි බලයක් අපට ඇති බව ඔබ අප මුලින්ම වටහා ගත යුතුමය.

අගෝස්තු 18 ඓතිහාසික ගෝල්ෆේස් රැලියට සහභාගි වූ ජන ගඟ අතරෙහි වැඩිම නියෝජනය කාන්තාවන් වූවාට සැකයක් නැත. එසේ එක්වූ මව්වරුන් සහෝදරියන් මේ ලාංකේය භූමියේ සතර දිග්භාගයේ විසිරී පැතිරී සිටින අයයි. රට වෙනස් දිශාවකට යොමුකරන්නට සමත් කාන්තා බලවේගයක් ගොඩනගන්නට පෙරගමන් කරුවන් වීමේ ඓතිහාසික කාර්‍යභාරය මේ සියලු දෙනා වෙතම පැවරී තිබේ. ඒ අරමුණින් එදා දහසකුත් අපේක්ෂාවන් පෙර දැරිකරගෙන ගෝල්ෆේස් පිටියේ ගිනි අව්වේ ඔවුහු නොසැලී බලා සිටියෝය.

බොහෝවිට ලංකාවේ කවර හෝ වර්ගයක ඡන්දයක් ළංවන විට ප්‍රධාන පක්ෂ දෙකම වැඩි ඉලක්කයට බඳුන් වූයේ කාන්තාවන් බව අපට අමතක නැත. එයට හේතු කිහිපයක් තිබේ. එකක් ජනගහනයෙන් බහුතරය කාන්තාවන් වීමය. තවත් හේතුවක් වන්නේ රටේ ආර්ථික ප්‍රශ්න වැඩියෙන්ම දැනෙන්නේ කාන්තාවන්ට වීමය. එසේම රටේ අනෙකුත් සමාජ සංස්කෘතික පරිහානීන්ගේ පහසු ගොදුර බවට පත්වන්නේද කාන්තාවන්ය. අනෙකුත් ප්‍රධාන කාරණාව පැවසීම කොතරම් කණගාටුදායක හා ශෝචනීය වුවද සත්‍ය එයයි. එනම් කාන්තාවන් ඉතා පහසුවෙන් හා ඉක්මනින් රැවටිය හැකි පිරිසක් ලෙස පාලකයින් සිතීමත්, ඒ සිතුවිල්ල යථාර්ථයක් කරමින් කාන්තාවන් ඕනෑම ආකාරයකින් රැවටීමට භාජනය වීමත්ය. ඒ නිසා බඩු මල්ලට, සිල් රෙද්දට, අභ්‍යාස පොත් කිහිපයකට, ටකරං තහඩුවකට, පමණක් නොව දේශපාලකයින් තම දරුවන් වඩා ගත්තේ නම් හෝ හිස අතගෑවේ නම් ඒ නිසාද තම ඡන්දය හිලව් කිරීමට කාන්තාවන් පෙළඹුණි.

අප වෙනස් කළ යුත්තේ මෙයයි. තවකාලික වරදාන, වරප්‍රසාදවලට තවදුරටත් කාන්තාවන් රැවටීම කළ නොහැකි බව දේශපාලකයින්ට පෙන්වා දිය යුතුය. කාන්තාවන් හැදිමිටෙන් එහාගිය නුවණකින් යුතු බව 2020 දී පෙන්වා දිය යුතුමය. එසේ නම් එදාවේල පමණක් නොව දිගුකාලීන යහපත් ජීවන තත්වයක් උදාකර ගැනීමේ වැඩපිළිවෙලක් ජයග්‍රහණය කරගැනීම සඳහා සියලු කාන්තාවන් ඒකරාශි කරගැනීමේ වැඩපිළිවෙළ ඇරඹිය යුතුව ඇත. ඒ සඳහා පෙරමුණ ගැනීමේ වගකීම ඇත්තේ එදා ගොල්ෆේස් පිටියේ අපේක්ෂාවේ දෑස් දල්වාගෙන නොසැලී වුන් මව්වරුන්ට හා සහෝදරියන්ටය.

අපේ සහෝදරියන් අතින් මඟ හැරෙන තවත් දෙයක් තිබේ. සමාජ අසාධාරණය, රටේ ප්‍රශ්න, ආර්ථික අපහසුතා වැනි සියල්ල පිළිබඳ අවබෝධයක් තිබියදීත් ඒ පිළිබඳ අවශ්‍ය තැන්වල කතා නොකිරීම ඒ වරදයි. 71 වසරක් පුරා රට පාලනය කළ පාලකයින් රට ප්‍රපාතයට ඇද දැම්මා විනා රටට යහපතක් නොකළ බව හොඳාකාරවම දැන සිටියදීත් ඒ බව නොදන්නා සේ නිහඬව සිටීම ඒ වරදයි. ඒ නිසා 2020 වෙනුවෙන් ඒ වරද නිවැරදි කරගත යුතුමය. එසේ නම් කඩපිලේ, බස්රියේ, කාර්යාලයේ, පාසලේ, වැඩබිමේ, අනෙකුත් පාක්ෂිකයන්ගේ ගුණ වයද්දී මුනිවත රැකීමෙන් වැළකී සිට ඊට එරෙහිව අදහස් ප්‍රකාශ කිරීමේ වගකීම කරට ගත යුතුය. ඒ අනුව හොරුන්ගේ තක්කඩියන්ගේ, මංකොල්ලකාරයින්ගේ සහ ස්ත්‍රී දූෂකයින්ගේ මතවාද සමාජගත වීමත් ඒ මගින් ඔවුන් බලයට පත්වීමත් වැළැක්වීමට අපට හැකි උපරිම අයුරින් ක්‍රියාත්මක විය යුතුය. 71 වසරක් පුරා රැවටෙමින් නැවත රැවටෙමින් වර්ථමානය වන විට රැවටීම අනිවාර්ය අංගයක් ලෙස ලේ වලට කිඳාබැස ඇති කාන්තාවන් ඒ අගාධයෙන් ගොඩගැනීමේ කාර්‍යභාරය උරමතට ගතයුතුය.

ඒ නිසා මෙතෙක් සිටි නිහඬබව බිඳිය යුතු කාලයයි මේ. රටේ පාලකයින්ගේ නොහැකියාවන් ඔවුන්ගේ ජනතාව රැවටීමේ උපායන් පිළිබදවත්, අප විසින් අනෙකා දැනුවත් කළ යුතුව තිබේ. රටට අවශ්‍ය අලුත් බලවේග යක් අලුත් වැඩපිළිවෙළක් සහිත නායකයෙකු බව එක හඬින් ප්‍රකාශ කිරීමට අප විසින් ධෛර්යය උපදවාගත යුතු වේ.

සෑම ගිම්හානයකට පසුම වසන්තය උදාවන නමුත් අපි මෙතෙක් එය අත්විඳින්නට වාසනාවන්ත නොවූයෙමු. එය තවත් කෙනෙකු කරදෙනු බලා සිටිනු වෙනුවට අප කළ යුතු වන්නේ අප විසින්ම ඒ කාර්යය සිදු කිරීමට දායක වීමයි. ඒ නිසා 71 වසරක දිගු ගිම්හානයකට පසු 2020 වසන්තය කැන්දන මහඟු කර්තවයයට කාන්තාවන්ගේ බහුතර දායකත්වය ලබාදීම වගකීමක් ලෙස ඉටුකරන්නට අපට හැකියාව තිබේ. ඒ හැකියාව උපරිමයෙන් ප්‍රයෝජනයට ගත්විට අනාගතය කෙතරම් පහසුදැයි අප සැමට වැටහෙනු ඇත.

## ජීවිතය යළි ලියමු

අලුත් පොත් අරගෙන
පරණ විදියට හිතන
පරණ වුන නමුත් පොත්
අලුත් ඇසකින් බලන
නෝන මහතුන් මෙන්ම
සොයුරියනි, සොහොයුරනි,
මේ සැප්තැම්බරය...
වෙනදාට වඩා සොඳුරුය...
බලන් අලුතින් අකුරු එක්කර
ඔබ ගැනම ලියූ මහපොත ...
මෙහි පිටු එකින් එක
ඔබ නමින් වෙන් වී ඇත...
පද එකින් එක ගළපා
එළිවැට එළිසමය නොනසා
ලියමු පදවැලක් එහි
සිතුවම් කරමු ජීවිතය යළි ..



## සිව්දෙසින්



### දිළිසෙන විරෝධතාවය

කාන්තා හිංසනයට එරෙහිව මෙක්සිකෝ කාන්තාවන් වීදි බැස තිබේ. විරෝධතාවය මතු වීමට මූලික හේතුව නව යොවුන් වියේ දැරිවියක පොලිස් නිලධාරීන් හතර දෙනෙකු විසින් දූෂණය කිරීමයි. මෙම විරෝධතාවය දිළිසෙන විප්ලවය ලෙස නම් වී තිබෙන්නේ විරෝධතාකරුවන් රෝස පැහැති දිළිසෙන කුඩු වීදි පුරා විසුරුවමින් විරෝධතාවයේ යෙදෙන බැවිනි. විරෝධතාකරුවන් චෝදනා කරන ආකාරයට සෑම දිනකම පාහේ ගැහැනු ළමයින්, කාන්තාවන් අතුරුදහන්වීම්වලට, හිංසනයට, දූෂණයට ලක්වන අතර දිනකට ස්ත්‍රීන් 10 පමණ ඝාතනය වන නමුත් බොහෝ අපරාධ වලට දඬුවම් නොලැබෙයි.

### හිස නමා ජීවත්වීමට වඩා මියයාම වටී



ඉරාන ඉස්ලාමීය රාජ්‍යයේ උත්තරීතර නායකයා ලෙස සැලකෙන අයතුල්ලා අලි කුමේනි හට ධුරයෙන් ඉල්ලා අස්වන ලෙස එරට කාන්තා ක්‍රියාකාරිනියන් පිරිසක් ඉල්ලා තිබේ. දාහතරදෙනෙකු පමණ වන මෙම ක්‍රියාකාරිනියන් ප්‍රකාශ කර සිටින්නේ මෙම ක්‍රියාව හේතුවෙන් තමන්ට ඕනෑම දඬුවමකට ලක්වීමට සිදුවුවද වසර 40 ක් තිස්සේ කාන්තාවන්ට වෙනස් ලෙස සලකන පාලනයක් යටතේ තවදුරටත් දිගු ජීවිතයක් ගතකිරීමට අවශ්‍ය නොවන බවයි.

මෙම ඉල්ලීම තුළ ඉස්ලාමීය රාජ්‍යය අවසන්කර නිරාගමික රාජ්‍යයක් බිහිකළ යුතු බවද දක්වා තිබේ. මෙම ලිඛිත ඉල්ලීමට සමාජ මාධ්‍ය ජාලා තුළද හොඳ ඉඩක් ලැබී ඇති අතර සාධනීය ප්‍රතිචාරද ලැබෙමින් තිබේ. ඉරානය කාන්තාවන්ට පාපැදි භාවිතා කිරීම නීතියෙන් තහනම් වුවද එය උල්ලංඝනය කර පාපැදි භාවිතා කරමින් ද කාන්තාවෝ සිය විරෝධය ප්‍රකාශ කරති. අගෝස්තු මස මුල් භාගයේදීද කාන්තාවන්ට වෙනස් ලෙස සැලකීම නවතන ලෙස බලකරමින් විවෘත ලිපියක් ඉදිරිපත් කළ කාන්තා ක්‍රියාකාරිනියන්ද මේ වන විටත් අත්අඩංගුවට ගනිමින් සිටී.

### ස්ත්‍රී සමානාත්මතා දිනය සැමරේ




මෙවරද අගෝස්තු 26 දින ඇමරිකානු කාන්තාවෝ ස්ත්‍රී සමානාත්මතා දිනය සැමරූහ. මෙම දිනය යෙදී ඇත්තේ එක්සත් ජනපදයේ කාන්තාවන්ට ඡන්ද අයිතිය ලබා දුන් 19වැනි සංශෝධනය සැමරීමක් වශයෙනි. 1878 වර්ෂයේදීය හඳුන්වා දුන්නේ මෙම සංශෝධනය ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලද්දේ 1920 අගෝස්තු 26 වන දිනදීය. සියලු එක්සත් ජනපද ස්ත්‍රීන්ට ඡන්දය භාවිතා කිරීමේ වරම 1951 පැවති ඡන්දයේ දී හිමි වූ අතර මෙම දිනය ස්ත්‍රී සමානාත්මතා දිනය වශයෙන් නම් කරන ලද්දේ 1971 වර්ෂයේදී ය.

වඩාත්ම විශේෂත්වය වන්නේ මෙම අයිතිය බන්දේසියක තබා දුන්නා නොව ඇමරිකන් කාන්තාවෝ තම අයිතීන් දිනාගැනීම වෙනුවෙන් කරන ලද සටනේ ප්‍රතිඵලයක් ලෙද මෙය ලබා ගත් බවයි.

ඉතිහාසයේ කතාව... 13

# දර්ශනයේ හා විද්‍යාවේ ඉතිහාසය

වර්තමානයේ අප අතර පවතින බොහෝ ක්ෂේත්‍රයන් එනම් රජය, දේශපාලනය, දර්ශනය, විද්‍යාව, කලාව, ආගම ආදී සියලුම විෂය ක්ෂේත්‍රයන් හා මිනිස් නිර්මාණ ඉතිහාසය තුළ බිහිවී වර්ධනය වූයේ එකිනෙකින් වියුක්තව හෝ අහම්බිය ලෙස නොවේ. සියලු දේ මානව සමාජයේ පොදු ගමන්මග තුළ, නිෂ්පාදන බලවේගයන්ගේ සංවර්ධනයට අනුව සංයුක්ත ක්‍රියාවලියක කොටස් ලෙස වර්ධනය වූ ඒවාය. එබැවින් ඉතිහාසයේ සෑම සිදුවීමක්ම, සෑම නිර්මාණයක්ම, සෑම සොයා ගැනීමක්ම, සෑම දාර්ශනික සංකල්පයක්ම විෂය මූලික තත්වයක් තුළ, සංයුක්ත ක්‍රියාවලියක් තුළ සිදුවූ දේවල්ය. අප ඉතිහාසයේ වෙනස් වෙනස් සිදුවීම් හා ක්ෂේත්‍ර එකම සංයුක්ත තලකය තබා කථාකරන්නේ ඒ නිසාය.

ඉතිහාසය තුළ රජය හා දේශපාලනය, ආගම බිහිවූවක් මෙන්ම දර්ශනයට හා විද්‍යාවටද ඉතිහාසයක් තිබේ. ඒවාද හුදු පුද්ගල දක්ෂතා හෝ අහම්බ නොව සමාජ සංවර්ධනයට අනුරූපීව සිදුවූ දේවල්ය.



"දයලෙක්තික දර්ශනයට කිසිවක් නිත්‍ය, සර්ව සම්පූර්ණ හෝ ශුද්ධ හෝ නොවේ. එය සෑම දෙයක්ම හා සෑම දෙයකම තාවකාලික බව අනාවරණය කරයි. ඇති වීමේ හා නැති වීමේ, පහළ සිට ඉහළට වන අනන්ත උද්ගමනයේ ක්‍රියාදාමය හැර වෙනත් කිසිවක් එය හමුවේ ඔරොත්තුදීමට අසමත්ය.''

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**01 වෙළුම,**
**18-19 පිටු**

### දර්ශනයේ පැන නැගීම

මානව සමාජය තුළ පළමු පංති සමාජය බිහිවීමට පෙර මිනිසුන් තුළ අදහස්, සංකල්ප හා මත තිබුණද දර්ශනය නමින් වූ දැනුමේ ක්ෂේත්‍රයක් අපට හමුවන්නේ නැත. ඊට හේතුව මීට පෙරද අප විසින් පැහැදිලි කරනු ලැබ තිබේ. දර්ශනය බිහිවන්නේ ලෝකයේ බිහිවීම, පරිසරයේ ස්වභාවය හා පැවැත්ම පිළිබඳව තේරුම් ගැනීමට මිනිසා දැරූ උත්සාහය තුළය. එහිදී දාර්ශනික ලෙස කල්පනා කරමින් යම් යම් පරීක්ෂණ, නිරීක්ෂණ හා නිගමන (ඉතා ප්‍රාථමිකව වුවද) කරමින් ඒ වෙනුවෙන්ම සිතන පිරිසක් අවශ්‍ය විය. ඔවුන් අප හඳුනාගන්නේ දාර්ශනියකයන් ලෙසය. ඔවුහු නිෂ්පාදන ක්‍රියාවලියට දායක නොවූහ. එවැනි අයට දාර්ශනික සංකල්ප තුළ කිමිදෙමින් යම් යම් මත පළකරමින් ඒ ක්ෂේත්‍රය වෙනුවෙන් කැපවීමට හැකි වූයේ පංති සමාජය තුළ නිර්මාණය වී තිබූ 'අතිරික්ත ධනය' නිසාය. එම සමාජ 'අතිරික්ත ධනයෙන්' යැපෙමින් තම කාර්යයේ නියැලීමට ඔවුනට හැකි විය. ඒ නිසාම අපට දාර්ශනිකයන් හමුවන්නේ පංති සමාජය ආරම්භ වූවාට පසුවය.



### දර්ශනයේ ප්‍රාථමික අවධිය

'අප ජීවත්වන ලෝකයත් ඒ හා බැඳුණු සොබාදහමේ සංසිද්ධීනුත් මෙසේ වන්නේ ඇයි' යන පැනයට පිළිතුරු සෙවීමට ගත් උත්සාහය තුළ දර්ශනය ආරම්භ විය. එවැන්නක් ආරම්භ වූයේ මිනිස් චින්තනය තුළය. එනම් මිනිසා තුළ අන් සත්වයන්ගෙන් වෙනස්ව සිතන ඉන්ද්‍රිය හෙවත් මොළය, චින්තනමය හැකියාව දක්වා දියුණු වූ මොළයක් ලෙස සංවර්ධනය වූ නිසාය. අනෙක් අතට ඔහු සොබාදහමට යටත්ව ඉන් යැපෙමින් සිටිනවා වෙනුවට නිෂ්පාදනය මගින් සොබාදහම වෙනස් කිරීම ඇරඹූ සත්වයා වූ නිසාය. නිෂ්පාදනය සඳහා සොබාදහම තේරුම් ගැනීමට ඔහුට බල කෙරිණි. දර්ශනයේ මෙන්ම විද්‍යාවේද පදනම වූයේ එයයි.

අපට ලොව හමුවන සියලු ප්‍රාථමික දාර්ශනිකයන් හමුවන්නේ ක්‍රි.පූ. 06වැනි සියවස පමණ කාලයේය. යුරෝපයේ අපට හමුවන බොහෝ දාර්ශනිකයන්ගේ නිජබිම වූයේ ග්‍රීසියයි. මන්ද එවකට ග්‍රීසිය සංවර්ධනයේ ඉදිරියෙන් සිටි ප්‍රදේශයක් වීමය. නිෂ්පාදන බලවේග වේගයෙන් වර්ධනය වූයේ එම ප්‍රදේශවලය. එහිදී අපට හමුවන විශේෂ දාර්ශනිකයන් වූයේ තේල්ස් (ක්‍රිඃපූඃ 624-534), අනෙක්සි මැන්ඩර් (ක්‍රිඃපූඃ 610-546), ඇනෙක්සි මිනස් (ක්‍රිඃපූඃ 585-525) පෛතගරස් (ක්‍රිඃපූඃ 571-497) හෙරක්ලීටස් (ක්‍රිඃපූඃ 535-470) ආදීන්ය. මේ කාලයේම විසූ සොක්‍රටීස් දේශපාලන දාර්ශනිකයෙක් විය. මෙම දාර්ශනිකයන්ගෙන් සමහරු විඥනවාදීන් වූ අතර සමහරු භෞතිකවාදීහු වූහ. එහෙත් එම භෞතිකවාදයද ප්‍රාථමික ලක්ෂණ සහිත පාරභෞතිකවාදී විය. එය එසේ වූයේ ඒ වන විට ලෝකයේ හරයන් තේරුම් ගැනීමට තරම් විද්‍යාව දියුණු වී විද්‍යාත්මක උපකරණ නිර්මාණය වී නොතිබීම නිසාය.

### භෞතිකවාදී දාර්ශනික මත

මෙහිදී තේල්ස් ග්‍රාම්‍ය භෞතිකවාදියෙක් විය. ඔහුගේ අදහස්වල සාරාංශය වූයේ 'සියල්ල ජලයෙන් නිර්මාණය වී තිබේ' යන්නය. මීට සමාන මතයක් දැරූ ඇනෙක්සි මැන්ඩර් ලෝකය නිර්මාණය වූයේ වාතය හෝ ජලය මගින් බව පැවසීය. ඇනෙක්සි මිනිස්ගේ අදහස වූයේ වාතය මූලික බවය. ගණිතය පිළිබඳ ආරම්භක චින්තකයා ලෙස සැලකෙන පෛතගරස් සියල්ල සංඛ්‍යාවලින් නිර්මාණය වී තිබෙන බවත්, ගණනය කළ හැකි බවත් පැවසීය. හෙරක්ලීටස්ගේ අදහස වූයේ සියල්ල ගින්නෙන් ඇතිවී තිබෙන බවය. මීට මදක් පසුකාලයේ ජීවත් වූ ඉංග්‍රීසි ජාතික ඩිමොක්‍රටිස් (ක්‍රිඃපූඃ 400-370) පැවසුවේ සියල්ල ඉතා කුඩා අංශුවකින් නිර්මාණය වී ඇති බවය. මෙය පරමාණුව නමින් හඳුන්වන ලදී. මෙලෙස එදා පැවති විද්‍යාවේ හා නිෂ්පාදන උපකරණවල ඉතා පහළ මට්ටම තුළ සිටි දාර්ශනිකයෝ විඥානවාදී අදහස්ද සහිතව භෞතිකවාදී චින්තනයකට මුල පිරුහ.

> මේ අනුව පෙනී යන්නේ ඉතිහාසයේ ගමන්මග තුළ පංති සමාජය බිහිවීමෙන් පසු සමාජ සංවර්ධනය සිදු වූ භූමි, කලාව තුළ බටහිර ලෝකයේ ග්‍රීසිය පදනම් කරගනිමිනුත්, පෙරදිග කලාපයේ ඉන්දියාව පදනම් කරගනිමිනුත් ක්‍රි.පූ. 06වැනි සියවස වන විට දර්ශනවාදීන් නිර්මාණය වෙමින් දර්ශනයන් බිහිවූ බවය. එහිදී පෙරදිග රටවල දර්ශනය වඩාත් ආධ්‍යාත්මික, ආත්මවාදී හා විඥානවාදී ස්වරූපයක් ගනිද්දී විද්‍යාවේද දියුණුවත් සමග බටහිර දර්ශනය භෞතිකවාදී දර්ශනයකට පදනම දැමීය. මේ සමග මීට සමගාමීව විද්‍යාවද වර්ධනය විය.

### පෙරදිග දාර්ශනිකයෝ

ක්‍රි.පූ. 6වැනි සියවස කාලයේදීම පෙරදිග දාර්ශනිකයන් රැසක් අපට හමුවන්නේ, ඉන්දියාව හෙවත් භාරතය පදනම් කරගනිමිනි. පෙරදිග (ඉන්දියානු) දර්ශනයේ විශේෂය වූයේ එය ජීවිතයේ ආධ්‍යාත්මික පැත්තට වැඩි නැඹුරුතාවයක් දැක්වීමය. ක්‍රි.පූ. 06වැනි සියවස වන විට ඉන්දියාව එක් අතකින් කුඩා කුඩා රාජ්‍ය ගණනාවකට කැඩී (සොළොස්මහ ජනපද ආදී ලෙස) දුර්වලව පැවති අතර, අනෙක් අතට රජයට හා සමාජයට ඉහළින් බ්‍රාහ්මණ ආගම බලවත්ව පැවතියේය. මේ නිසා පැවති අරාජිකත්වය, අර්බුද හා රජය බ්‍රාහ්මණ මැවුම්වාදයෙන් නිදහස්කර ගැනීමේ වුවමනාවත් සමග ක්ෂත්‍රිය කුමාරවරුන් රැසක් විසින් අධ්‍යාත්මක සුවය සෙවීමටත් කිසියම් දහමක් නිර්මාණය කර ගැනීමටත් උත්සාහ කරන ලදී. මේ නිසාම පෙරදිග දර්ශනවාදීන් තුළ විඥානවාදී හා ආගමික නැඹුරුව වැඩිවිය. ගෞතම සිද්ධාර්ථ (බුදුන්) පවා මෙලෙස දාර්ශනික ප්‍රවේශයක් සෙවීමට උත්සාහ කළ අයෙක් විය.

පෙරදිග (ඉන්දියානු) දාර්ශනිකයන් අතර ප්‍රචලිත පිරිස ෂඩ් ශාස්තෘවරුන් ලෙස නම් කරන පිරිසය. ඔවුන් නම්, සංජය බෙල්ලට්ඨ පුත්ත, අජිත කේශකම්බල, පූර්ණ කස්සප, මක්ඛලී ගෝසාල, පකුධ කච්ඡායන, නිගණ්ඨනාථ පුත්ත යන අයයි. මෙහිදී සමහරු විඥානවාදී වූ අතර, ඇතැම්හු පාර භෞතිකවාදීහු වූහ. පකුධ කච්ඡායන එවැන්නෙකි. පැරණි වෛදික ආගමික දර්ශනයට පසු මේ කාලයේ බිහිවූ දාර්ශනික මතවාදය හැඳින්වූයේ චාර්වක දර්ශනය ලෙසය. මේ අතරම ජෛන හා බෞද්ධ දර්ශනයද ආගමික දර්ශනයන් ලෙස බිහිවිය.

මේ අනුව පෙනී යන්නේ ඉතිහාසයේ ගමන්මඟ තුළ පංති සමාජය බිහිවීමෙන් පසු සමාජ සංවර්ධනය සිදු වූ භූමි, කලාව තුළ බටහිර ලෝකයේ ග්‍රීසිය පදනම් කරගනිමිනුත්, පෙරදිග කලාපයේ ඉන්දියාව පදනම් කරගනිමිනුත් ක්‍රි.පූ. 06වැනි සියවස වන විට දර්ශනවාදීන් නිර්මාණය වෙමින් දර්ශනයන් බිහිවූ බවය. එහිදී පෙරදිග රටවල දර්ශනය වඩාත් ආධ්‍යාත්මික, ආත්මවාදී හා විඥානවාදී ස්වරූපයක් ගනිද්දී විද්‍යාවේද දියුණුවත් සමග බටහිර දර්ශනය භෞතිකවාදී දර්ශනයකට පදනම දැමීය. මේ සමග මීට සමගාමීව විද්‍යාවද වර්ධනය විය.

දර්ශනයේ ඉතිහාසය සමග විද්‍යාවේ ඉතිහාසය තදින් බැඳී තිබේ. විද්‍යාව දර්ශනයටම සේවය කළ අතර, දර්ශනය විද්‍යාවේ දියුණුවට සේවය කළේය. මේ දෙකම නිෂ්පාදන බලවේගවල සංර්ධනය විසින් ඉල්ලා සිටි ඓතිහාසික අවශ්‍යතාව ඉටුකිරීමක් විය. කෙසේ වෙතත් ඉතිහාසය තුළ විද්‍යාවේ වර්ධනයේ ආරම්භය මීළඟට කතා කරමු.

# ඉන්දියාව: කාශ්මීරයේ විශේෂ තත්වය අහිමි කොට




අගෝස්තු මාසය එළඹෙද්දී අලුතින් තේරී පත්වූ නරේන්ද්‍ර මෝදිගේ ආණ්ඩුව දස දහස් ගණනින් ඉන්දියන් හමුදාව කාශ්වීරය වෙත කැඳවීය. කාශ්මීරය තුළ සැලසුම් කර තිබූ ප්‍රධාන හින්දු ආගමික වන්දනා කටයුතු අවලංගු කර දැමුණි. පාසල් වසා දැමුණු අතර සංචාරකයන්ට ප්‍රදේශයේදී ඉවත් වන ලෙසට දැනුම් දෙනු ලැබුණි. දුරකථන හා අන්තර් ජාල සේවාවන් අත්හිටුවන ලදී. කාශ්මීරයේ දේශපාලන නායකයින් නිවාස අඩස්සියට පත් කරනු ලැබිණි. ඉන් අනතුරුව අගෝස්තු 05වන දින භාරතීය ජනතා පක්ෂයේ නරේන්ද්‍ර මෝදිගේ ආණ්ඩුව වසර 70ක කාලයක් පුරා ඉන්දීය පාලනය යටතේ පැවති ජම්මු කාශ්මීර ප්‍රදේශයට ලබාදී තිබූ 'විශේෂ තත්වය' ඉවත් කිරීමට කටයුතු කරන ලදී. ඒ වෙනුවෙන් ඉන්දීය ව්‍යවස්ථාවේ 370වන වගන්තිය අවලංගු කරන ලදී.

ඉන්දීය ව්‍යවස්ථාවේ 370වන වගන්තිය ඉවත් කිරීම පසුගිය මහ මැතිවරණයේදී නරේන්ද්‍ර මෝදි විසින් ලබාදී තිබූ ඡන්ද පොරොන්දුවක් ඉටු කිරීමකි.

## ඉතිහාස කථාව

ඉන්දියානු අර්ධද්වීපය අධිරාජ්‍යවාදීන් විසින් ආගමික සීමාවන් අනුව බෙදා වෙන් කිරීමේදී ඉන්දියාව හා පාකිස්ථානය බිහිවුණි. එම බෙදා වෙන් කිරීමේදී රාජ කුමාරවරුන් විසින් පාලනය කළ රාජ්‍යයන් 650ක් පිළිබඳ ගැටලු මතුවිය. මෙම රාජ්‍යයන්ට තමන් කුමන රටකට අයත් වීම හෝ නිදහස්ව සිටීම තීරණය කිරීමේ අයිතිය ඔවුන්ට ලබාදී තිබුණි. නමුත් එහිදී එකී රාජ්‍යයන්ගේ ජනතා කැමැත්ත තීරණාත්මක විය. බ්‍රිතාන්‍ය පාලනයේ ආධිපත්‍යයෙන් මිදීමට අරගල කළ ජනතාවට බ්‍රිතාන්‍යයෙන් නිදහස් වීමෙන් ඇති වූ හිඩැස රාජ කුමාරවරුන්ගෙන් පිරවීමට අවශ්‍ය නොවීය. බොහෝ රාජ කුමාරවරුන්ට ස්වාධීනව සිටීමට අවශ්‍ය වුවද එවිට පැණනැගුණ ජනතා විරෝධය හේතුවෙන් එසේ කළ නොහැකි විය.

කාශ්මීරයේ බිහිවීම අනුව එයට එක්කෝ ඉන්දියාව සමග නැත්නම් පාකිස්ථානය සමග එක්වීමට හැකියාව තිබුණි. කාශ්මීරයේ පාලකයා වූ මහරාජා හරි සිං හින්දු භක්තිකයෙකු වූ අතර කාශ්මීර ජනතාවගේ බහුතරය මුස්ලිම්වරු වූහ. මේ නිසා මහරාජා හරි සිං ස්වාධීනව සිටීමට තීරණය කළේය. එහෙත් එය කළ නොහැකි වූයේ කාශ්මීරයේ අගනගරය වූ ශ්‍රී නගර් වෙත පකිස්ථානය විසින් මුස්ලිම් ගෝත්‍රික ජනතාවක් එවූ බැවිනි. හරි සිං ඉන්දියාවට පලාගොස් යුද ආධාර ඉල්ලා සිටියේය. 1944 ඔක්තෝබර් 26 දින ඔහු කාශ්මීරය ඉන්දියාවට පවරමින් ගිවිසුමක් අත්සන් කළේය.

ජම්මු කාශ්මීරය හේතු කොට ගෙන ඉන්දියාව හා පාකිස්ථානය අතර පළමු යුද්ධය හටගැනුණේ එහිදීය. මෙම ප්‍රශ්නය ඉන්දියාව විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය හමුවට ගෙන ගිය අතර 1948 අගෝස්තු 13වැනි දින එ.ජා. සංවිධානය විසින් ඉන්දියාවට හා පාකිස්ථානයට කාශ්මීරයෙන් සිය හමුදා ඉවත්කර ගන්නා ලෙසට දන්වන ලදී. තම ඉරණම තීරණය කිරීම වෙනුවෙන් කාශ්මීරයට ජනමත විචාරණයක් පැවත්වීමට තීරණය කෙරිණි. ඉන්දියාව ජනමත විචාරණයේ ජයග්‍රහණය පිළිබඳව විශ්වාසය ඇතිව 1948 ඔක්තෝබර් 30වැනි දින කාශ්මීර පොදු ජන නායක ෂෙයික් අබ්දුල්ලා අගමැති කරමින් හදිසි ආණ්ඩුවක් පිහිටු වීය. එවිට පාකිස්ථානය එක්සත් ජාතීන්ගේ තීරණය නොසලකමින් කාශ්මීරයේ කොටසක පාලනය තමන් සතු කර ගත්තාය. 1949 ජනවාරි 01වන දින සටන් විරාමයක් ප්‍රකාශයට පත් කළ අතර කාශ්මීරයෙන් 65%ක් ඉන්දියාව යටතේද ඉතිරි කොටස පකිස්ථානය යටතේද පවත්වාගෙන යාමට තීරණය කෙරිණි. එහිදී සැකසුණ පාලන රේඛාව තත්‍ය මායිම ලෙස සලකන ලදී. 1967 දී කාශ්මීරය නිල වශයෙන් ඉන්දියාවට සම්බන්ධ කර ගැනුණි. එහිදී ඉන්දීය ව්‍යවස්ථාවේ 370වැනි වගන්තිය අනුව කාශ්මීරයට 'විශේෂ තත්වයක්' ලබාදෙනු ලැබිණි.

මුල් කාලයේදී කාශ්මීර වැසියන් ඉන්දීය හිතවාදී වුවද 1980 දශකය ආරම්භ වෙද්දී එම තත්වය වෙනස් විය. ඉන්දියානු පාලනයේ ඇතැම් ක්‍රියාමාර්ග විසින් කාශ්මීර ජනතාව තුළ විරෝධයක් ඇති කළ බැවින් මේ වන විට කාශ්මීරය තුළ ඉන්දීය විරෝධයක් සහ පකිස්ථාන හිතවාදී බවක් වර්ධනය වී තිබේ.

## මෝදිගේ ඉදිරි සැලසුම්

**ඉන්දීය ව්‍යවස්ථාවේ 370වන වගන්තිය මගින් ලබා දී ඇති 'විශේෂ තත්වය' අනුව කාශ්මීරයට තමන්ගේම ව්‍යවස්ථාවක්, තමන්ටම වූ කොඩියක්, නීති සම්පාදනය කිරීමේ හැකියාව ලබාදෙනු ලැබීය. විදේශ කටයුතු, ආරක්ෂාව සහ සන්නිවේදන කටයුතු මධ්‍යම ආණ්ඩුවේ පාලනය යටතේ පවතී. කාශ්මීරයේ නොවන පුද්ගලයන්ට කාශ්මීරය තුළ දේපළ මිලදී ගැනීමට 370වන වගන්තිය මගින් ඉඩ ලබා නොදේ. දැන් ඉවත් කර ඇත්තේ මෙම තත්වයයි.**

ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදිගේ මීළඟ සැලසුම වන්නේ මුස්ලිම් බහුතරයක් වෙසෙන කාශ්මීරයත්, හින්දු බහුතරයක් වෙසෙන ජම්මු ප්‍රදේශයත් එක් කොට වෙනම ප්‍රාන්තයක් ඇති කිරීමත් බෞද්ධ බහුතරයක් වෙසෙන ලඩාක් ප්‍රදේශයට වෙනම ප්‍රාන්තයක්ද ලබාදී කාශ්මීරය ප්‍රාන්ත දෙකකට වෙන් කිරීමයි.

ඉන්දියානු අගමැති නරේන්ද්‍ර මෝදි කාශ්මීරයට හිමි 'විශේෂ තත්වය' අහිමි කිරීමත් සමග ඊට ප්‍රතිචාර දැක්වූ පකිස්ථානය, ඉන්දියාවේ මෙම ඒක පාර්ශ්වික ක්‍රියාව හෙළා දැක්කාය. පාකිස්ථානයේ ඉන්දීය තානාපතිවරයා පිටුවහල් කරන ලද අතර, ද්විපාර්ශ්වික වෙළඳාම අත්හිටුවනු ලැබීය. ඉදිරියේදී තමන් ක්‍රියාමාර්ග ගන්නා බවත්, දෙරට අතර යුද්ධයක් ඇති විය හැකි බවටත් අනතුරු ඇඟවූ පකිස්ථානය, මෙම ප්‍රශ්නය විසඳීමට මැදිහත් වන ලෙසට එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ට ආරාධනා කළාය. එක්සත් ජනපදය ජම්මු කාශ්මීර ප්‍රශ්නය එය බලපාන පාර්ශ්වයන් සාකච්ඡා මගින් විසඳා ගත යුතුයැයි ප්‍රකාශ කළාය. චීනයද ප්‍රතිචාර දක්වමින් ලඩාක් ප්‍රදේශය ඉන්දියාවේ ප්‍රාන්ත ප්‍රදේශයක් බවට පත් කිරීමට ගන්නා උත්සාහය හෙළා දකින ලද අතර එය චීනයේ ස්වෛරීත්වයත්, භෞමික අඛණ්ඩතාවත් පළුදු වන ක්‍රියාවක් ලෙස සලකන බව ද ප්‍රකාශ කළාය.

හින්දු ජාතිකවාදී නරේන්ද්‍ර මෝදිගේ පාලනය විසින් එතෙක් පැවති අනාගමික ඉන්දියානු රාජ්‍යය බිඳවට්ටමින් සිටී. එය විසින් ඉන්දියාව තුළත් කලාපීය වශයෙනුත් මුස්ලිම් අන්තවාදය දුර්වල කරනවා වෙනුවට එය තව තවත් ව්‍යාප්තවීමට හා වර්ධනයවීමට අවශ්‍ය තත්වයන් සකසමින් සිටී. එතැනින් නොනැවතී ඉන්දියාව තුළ ජාතික සමගිය තවදුරටත් බිඳ වැටීමටත්, බෙදුම්වාදය වර්ධනය වීමටත් මේ තත්වය හේතුවනු ඇත.

## හොංකොං: විරෝධතා රැල්ලක ගිලී



චීනයේ විශේෂ පාලන ප්‍රදේශයක් ලෙස පවතින හොංකොංහි හටගත් විරෝධතා ව්‍යාපාරය මාස 02කට වැඩි කාලයක් තිස්සේ තවදුරටත් අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී. මෙම විරෝධතා රැල්ල ආරම්භ වූයේ මෙම වසරේ ජුනි 09වැනි දින විරෝධතාකරුවන් විසින් හොංකොං විශේෂ පාලන ප්‍රදේශයේ ආණ්ඩු මූලස්ථානයට කඩාවැදී සාමකාමී රැලියක් පැවැත්වීමත් සමගය. මෙම විරෝධතාව පැන නැගීමට හේතුවන්නේ අප්‍රේල් 03 වන දින හොංකොං ආණ්ඩුව විසින් සම්මත කිරීමට උත්සාහ කළ, අපරාධ සැකකරුවන් චීනයට පිටුවහල් කිරීමට හැකියාව ඇති කරවන පනතයි. දැනට හොංකොං වැසියෙකු චීනයේදී අපරාධයක් සිදුකර හොර රහසේ හොංකොං වෙත ආපසු පැමිණියහොත් එකී අපරාධය විමර්ශනය සඳහා ඔහු චීනය වෙත කැඳවීමට හැකියාවක් නොමැත. එහෙත් මෙම පනත සම්මත වුවහොත් එවැන්නෙකු චීනය වෙත කැඳවා අවශ්‍ය විමර්ශන සිදුකර නීතිමය පියවර ගැනීමට අවස්ථාව සැලසේ. විරෝධතාකරුවන් මෙම පනතට එරෙහි වන්නේ ආරම්භයේදී මෙමගින් අපරාධයකට අවශ්‍ය සැකකරුවන් චීනයට පිටුවහල් කෙරුණද පසුකාලීනව හොංකොංහි සිටින විරුද්ධ අදහස් ඇති සිසුන්, මාධ්‍යවේදීන්, ව්‍යාපාරිකයින් චීනයට පිටුවහල් කිරීමට කටයුතු කිරීමට ඉඩ ඇති බව පවසමිනි.

දෙවැනි උද්ඝෝෂණ වටය ජුනි 12වැනි දින පැවැත් වූ අතර එය ප්‍රචණ්ඩ මුහුණුවරක් ගත්තෙන් පොලීසිය ඊට කඳුළු ගෑස් සහ රබර් උණ්ඩ ප්‍රහාරයක් එල්ල කරන ලදී. ඉන්පසු ජුනි 15වැනි දින හොංකොං ආණ්ඩුකාරවරිය, කැරි ලැම් පිටුවහල් කිරීමේ පනත අනන්තය දක්වා කල් දමන බවට ප්‍රකාශයක් කළාය. ඉන්පසු විරෝධතාකරුවන්ගේ ඉල්ලීම වෙනස් විය. ඔවුහු හොංකොං ආණ්ඩුකාරවරියට ඉල්ලා අස්වීමට බලකරන්නට පටන් ගත්තෝය.

ජූලි 01 වන දින, එනම් හොංකොං ප්‍රදේශය යළිත් චීනයට ලබාදුන් දිනයේදී විරෝධතාකරුවෝ හොංකොං පාර්ලිමේන්තුවට කඩා වැදුනහ. ජූලි 09 වන දින හොංකොං ආණ්ඩුව පනත මුළුමනින්ම ඉවත්කර ගත් බව ප්‍රකාශ කළද විරෝධතා අවසන් වූයේ නැත. ඉන්පසු ජූලි 21වැනි දින විරෝධතාවන් සමග ප්‍රචණ්ඩ ක්‍රියා ආරම්භ විය. අගෝස්තු 02 දින පැවැත් වූ උද්ඝෝෂණයට සිවිල් සේවකයෝද සම්බන්ධ වූහ. අගෝස්තු 05වැනි දින වැඩ වර්ජනයක්ද ක්‍රියාත්මක කෙරිණි. ඒ සමගම ඊට පසුදින හොංකොංහි සිදුවන විරෝධතා පිළිබඳ චීනය සිය ප්‍රථම අනතුරු ඇඟවීම සිදුකරන ලදී. එහෙත් විරෝධතා ඉන් අවසන් වූයේ නැත. අගෝස්තු 12වැනි දින විරෝධතාකරුවන් හොංකොං ගුවන් තොටුපළ අත්පත්කර ගත් අතර මේ නිසා ගුවන් ගමන් දහස් ගණනක් අවලංගු කර දැමිණි.

හොංකොං දකුණු දිග චීනයේ පිහිටි වර්ග කි.මි. 1104ක ප්‍රදේශයක් පුරු පැතිරුණ මිලියන 7.4ක ජනතාවක් වෙසෙන ප්‍රදේශයකි. එය පළමු අබිං යුද්ධය සමයේදී, එනම් 1842දී බ්‍රිතාන්‍ය යටත්විජිතයක් බවට පත් වූ අතර 1997දී බ්‍රිතාන්‍යය විසින් එය යළිත් චීනයට පවරා දෙන ලදී. එතැන් සිට චීනය විසින් එය 'එක් රටක් ක්‍රම දෙකක්' යන සංකල්පයට යටත්ව චීනයේ විශේෂ පාලන ප්‍රදේශයක් ලෙස පවත්වාගෙන යනු ලබයි. හොංකොං මේ වන විට ලෝකයේ වැදගත්ම මූල්‍ය මධ්‍යස්ථාන අතරින් එකක් බවට පත්ව තිබේ.

එක්සත් ජනපදය ප්‍රමුඛ 67 රටවල්, බටහිර ජනමාධ්‍ය, මානව හිමිකම් සංවිධාන හොංකොං හි විරෝධතාකරුවන් වෙනුවෙන් පෙනී සිටින අතර චීනය පවසන්නේ, මෙම උද්ඝෝෂණ පිටුපස එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදී බලවේග සිටින බවයි. විරෝධතාකරුවන් විරෝධතාවලදී බ්‍රිතාන්‍ය කොඩියද රැගෙන එන අයුරු මාධ්‍ය මගින් දැකගත හැකි විය. කෙසේ වෙතත් චීනය පවසන්නේ හොංකොං යනු චීනයේ අඛණ්ඩ කොටසක් බවත් එය චීනයේ අභ්‍යන්තර ප්‍රශ්නයක් බවත් කිසිවෙකු ඊට මැදිහත්වීමට අවශ්‍ය නොවන බවත්ය.

## බ්‍රසීලය: ලෝකයේ පෙනහල්ලට ගිනි වැදීමට ඉඩ හැර



ලෝකයේ පෙනහල්ල ලෙස සලකන ඇමේසන් වනාන්තරය මේ වන විටත් ගිනි ගනිමින් පවතී. බොලිවියාව, රුසියාව, බ්‍රසීලය වැනි රටවල් පැතිරී යන ගින්න නිවාදැමීමට මේ වන විටත් උත්සාහ දරමින් සිටී. ලෝකයේ වායු ගෝලීය ඔක්සිජන් ප්‍රමාණයෙන් 20%ක් පමණ එක් කරන්නේ මෙම සදාහරිත වනාන්තරය මගිනි. එහි ශාක හා සත්ව විශේෂ බිලියන 03ක් පමණ ඇති අතර ගෝත්‍රික ජනතාව මිලියනයකට ආසන්න ප්‍රමාණයක් එහි වාසය කරයි.

ඇමේසන් වනයේ මෙම ගින්න ඇතිවීම පිළිබඳ චෝදනාව එල්ල වී ඇත්තේ වත්මන් බ්‍රසීල ආණ්ඩුව වෙතයි. එක්සත් ජනපද හිතවාදී මෙම ආණ්ඩුව පත්වීමෙන් පසු පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේ ජනවාරි - අගෝස්තු කාලය තුළදී ඇමේසන් වනයේ ගිනි තැබීම් 82%කින් පමණ වර්ධනය වී තිබේ. එකී කාලය තුළ බ්‍රසීලයේ වනාන්තර ප්‍රමාණය 20% සිට 30% දක්වා ප්‍රමාණයකින් අඩු වී තිබේ.

## එක්සත් ජනපදය: තීරු බදු බර ජනතාවට




එක්සත් ජනපදය විසින් චීන භාණ්ඩවලට පනවන ලද තීරු බදු හේතුවෙන් එක්සත් ජනපද වැසියෙකුගේ වාර්ෂික වියදම ඩොලර් 850කින් ඉහළ ගොස් ඇතැයි පැවසේ. ඔක්ස්ෆර්ඩ් ඉකොනොමික්ස් නම් ආයතනයක් මගින් සිදු කළ සමීක්ෂණයකදී මේ බව හෙළිදරව් වී තිබේ.

සාමාන්‍යයෙන් එක්සත් ජනපදය තුළ චීන භාණ්ඩ 1% - 1.5% ක පමණ ප්‍රමාණයකින් මිල අඩුය. මේ නිසා චීන භාණ්ඩ මිලදී ගැනීමේදී වාර්ෂිකව ඩොලර් 850ක ඉතිරියක් පාරිභෝගිකයාට ලැබෙන බව එහිදී හෙළිවී තිබේ.

## ඉරානය: ප්‍රංශයේ මැදිහත්වීම මත සාකච්ඡා මේසයට

ප්‍රංශ ජනාධිපති එම්මානුවෙල් මැක්‍රොන්ගේ මැදිහත්වීමේ ප්‍රතිඵලයක් ලෙස ඉරානය හා එක්සත් ජනපදය අතර යළි සාකච්ඡා ආරම්භ කිරීමේ හැකියාවක් ලැබී තිබේ. 2015 වසරේදී එක්සත් ජනපදය ඒක පාර්ශ්විකව ඉරාන න්‍යෂ්ටික ගිවිසුමෙන් ඉවත්වී එරටට සම්බාධක පැනවීය. ඒ සමගම දෙරට අතර සබඳතා පළුදු වූ අතර ඉහත මැදිහත් වීමෙන් පසු තමන් ඉරාන ජනාධිපති හසන් රොහානි සමග සාකච්ඡා ආරම්භ කිරීමට සූදානම් බව ඩොනල්ඩ් ට්‍රම්ප් ප්‍රකාශ කර තිබේ.

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2019 අගෝස්තු 07

# මහජන ඉඩම් වංචනිකව පවරාගත් තක්කඩින්ට නීතිය ක්‍රියාත්මක විය යුතුයි

(මඩකලපුව විශ්වවිද්‍යාල පුද්ගලික සමාගම පිළිබඳ කල්තැබීමේ විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා

මම මේ කාරණය ගැන අවස්ථා කිහිපයකදී පාර්ලිමේන්තුවේ අදහස් දක්වපු මන්ත්‍රීවරයකු හැටියට, ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් එක් නිශ්චිත කාරණයක් පැහැදිලි කරන්න ඕනෑ. අපි මේ ප්‍රශ්නයට ප්‍රවේශ වෙන්නේ, කිසිදු ආකාරයකින් ජාතිවාදී පදනමකින් හෝ ආගමික පදනමකින් නොවෙයි; නැගෙනහිර පළාතේ මුස්ලිම් ජනතාවගේ දරුවන්ට අධ්‍යාපනය ලබා දීමේ අයිතිය පිළිබඳ ප්‍රශ්නයකට අදාළව නොවෙයි. ඒ නිසා අපේ කරුණු ඉදිරිපත් කිරීම ඉතා පැහැදිලිව, රජයේ චක්‍රලේඛ, රජයේ නීතිරීති, රජයේ තිබෙන පොදු ක්‍රමවේදය අමු අමුවේ උල්ලංඝනය කරපු හොරකමක් හෙළිදරව් කිරීමක්ම පමණයි. මේ හොරකම කරන්න ඇමතිකම පාවිච්චි කරලා මැදිහත් වෙන්නේ හිස්බුල්ලා වෙනුවට සුමනදාස කියලා කෙනෙක් නම්, ඒත් අපි මේ හොරකම හෙළිදරව් කරනවා. ගුණසිරි කියලා කෙනෙක් නම් ඒත් අපට ප්‍රශ්නයක් නැහැ. මම මේ වෙන විධියේ නම් කිවුවේ සමහර ඇමතිවරුන්ගේ නම් මා අතින් කියැවෙයි කියලායි. මේක ජාතිවාදී පදනමක් මත ඇති වූ ප්‍රශ්නයක් නොවන නිසාම තමයි අපි පැහැදිලිව කියන්නේ මේ අවිනීතික, නීතිවිරෝධී ගනුදෙනුව වහා අවසන් කරලා, මේ සඳහා රජයෙන් දශමයකවත් අනුග්‍රහය සපයන්නේ නැතිව මේ දේපොළ, මේ ඉඩම, මේ ඉදිකිරීම රජයට පවරා ගෙන නැගෙනහිර පළාතේම මුස්ලිම් ජනතාවගේ දරුවන්ට නොමිලේ අධ්‍යාපනය ලබා ගැනීමට රජයේ විශ්විද්‍යාලයක් ආරම්භ කරන්න කියලා. එතකොට ප්‍රශ්නය ඉවරයි නේ. එතකොට ජාතිවාදී කථාවක් එතැනට එනවාද? ඕනෑ නම් ඒ ඉන්න මුස්ලිම් ජනතාවගේ දරුවන්ට, දෙමළ ජනතාවගේ දරුවන්ට නැගෙනහිර පළාතේම රජයේ විශ්වවිද්‍යාලයක් ආරම්භ කරන්න. එතකොට කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි ජාතිවාදී පදනමකින් මේ සඳහා විරුද්ධ වන්නේ නැහැ. දෙමළ මාධ්‍යයෙන් ලියන සමහර අය ජනතා විමුක්ති පෙරමුණේ අපි සම්බන්ධයෙන් මේ ප්‍රශ්නය ජාතිවාදී පදනමකට ආරෝපණය කරන්න හදනවා. ඒක ලේසියි. නමුත්, ඒක වැරදියි. මම ඒකට හේතු කියන්නම්.

මුලින්ම, 2013 දෙසැම්බර් 10වැනිදා මේකට අනුමැතිය ලබා දෙන්න තමයි නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා අත්සන් කරන්නේ. මහවැලි නේවාසික ව්‍යාපාර කළමනාකරු රංජිත් පෙරේරා ඉල්ලීමක් කරනවා, " වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා බිම් කොටසක් ඉල්ලා සිටීම" කියන කාරණාව යටතේ හිටපු අමාත්‍ය හිස්බුල්ලා මහතා ශ්‍රී ලංකා හීරා පදනමෙන්



යොමු කරපු ලියුමකුත් එක්ක. හැබැයි, ඉඩම් ඇමතිවරයාගේ නිර්දේශයක් නැතුව, ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශයක් නැතුව මහවැලි අධිකාරියට අනුමැතියක් දෙන්න බැහැ. නමුත් ඉඩම් ඇමතිවරයාගේ හෝ ඉඩම් කොමසාරිස්වරයාගේ අනුමැතියක් නැතුව ඒ අනුමැතිය දීලා තිබෙනවා. ඊට පස්සේ Batticaloa Campus (Pvt.) Limited හැටියට ඒකේ නම වෙනස් කරලා, උසස් අධ්‍යාපන විශ්වවිද්‍යාල ආයතනයක් ආරම්භ කරන්න නැවත අනුමැතියක් ඉල්ලනවා. ඒ සඳහාත් ඇමතිවරයාගේ අනුමැතිය ගන්න ඕනෑ. ඉඩම් ඇමතිවරයාගේ අනුමැතියක් නැතුව 2016 අගෝස්තු 29 හා ඔක්තෝබර් 27 මහවැලි අධිකාරියෙන් ඒකට අනුමැතිය දීලා තිබෙනවා. ඒක දෙන්න බැරි අනුමැතියක්.

රජයේ ඉඩම් රෙගුලාසි යටතේ එය ගැසට් පත්‍රයේ පළ කරන්න ඕනෑ. ඉඩම මොන ක්‍රමයට දීර්ඝ කාලීනව බදු දුන්නත්, බදු පදනමට කලින් අනිවාර්යයෙන්ම අනුමැතියක් ලබා ගන්න ඕනෑ. හැබැයි, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය 2017දියි ඒ අනුමැතිය ඉල්ලන්නේ. නමුත්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ඇමතිවරයාට යොමුකර තිබුණේ 21/2 රෙගුලාසිය යටතේ පළ කළ යුතු ගැසට් නිවේදනය පළ නොකිරීමට සුදුසු ලෙස අනුමත කරන්න කියායි. අපි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරින්ගෙන් අහනවා.

> ඒ ඉල්ලීම කරලා තිබෙන්නේ 2017 මාර්තු 15 දින හීරා පදනමෙන්. හිස්බුල්ලා මැතිතුමාගේ අත්සන තිබෙනවා. සභාපති, හීරා පදනම (පුද්ගලික) සමාගම යනුවෙන් එහි සඳහන් වෙනවා. මහවැලි සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය 2017.05.25 වැනි දින ඒ අනුමැතිය ලබා දීලා තිබෙනවා. අක්කර තිස්පහයි. හතළිස් පහයි. ජනාධිපතිතුමාගේ පොළොන්නරුවේ ඉඩමක්ද මේ දෙන්නේ කියලා මම අහනවා. එතුමාගේ පෞද්ගලික බූදලයෙන්ද මේ දෙන්නේ? මහවැලි අධ්‍යක්ෂ ජනරාල්ගේ පෞද්ගලික බූදලයෙන්ද තව අක්කර 45ක් දෙන්න යන්නේ?

ගැසට් පත්‍රයේ පළ නොකළ යුතුයි කියලා එම නිවේදනය නිකුත් කරන්න තීරණය ගත්තේ ඇයි කියලා. දිගු කාලීන බදු පදනමින් දෙන දෙයක් නම් ඒක ගැසට් පත්‍රයේ පළ කරන්න ඕනෑ. ගැසට් පත්‍රයේ පළ කළාම තමයි ඒ සඳහා විරෝධයක් පළ කරන්න ඉන්න කෙනෙකුට විරෝධය පළ කරන්න පුළුවන් වෙන්නේ. හැබැයි, ගැසට් පත්‍රයේ පළ නොකර අනුමැතිය දෙන්න කියලා ඉල්ලන්නේම, විරෝධයක් සිද්ධ වෙනවා නම් එය වැළැක්වීමේ අර්ථයෙන්ම තමයි. ඒක ඉතාම පැහැදිලියි. එම නිසා අපි කියනවා මේ කාරණයට මේ සඳහා අත්සන් කළ නිලධාරීන් වග කියන්න ඕනෑ. අනුමැතිය ඉල්ලපු කට්ටිය වගකියන්න ඕනෑ කියලා. ඒ ගොල්ලෝ ක්‍රමවේද නොදැන නොවෙයි ඒ අනුමැතිය ඉල්ලන්නේ.

එම ඉල්ලුම් පත්‍රය අනුව නම්, ඉඩම් අමාත්‍යවරයාගේ නියෝගය අරගෙන ඒ නියෝග යෙන් පස්සේ තමයි අනික් කට්ටියගේ නිර්දේශයට එන්න ඕනෑ. අත්සන් කරන්න ඕනෑ එහෙමයි. නමුත්, ඉඩම් අමාත්‍යවරයාගේ අනුමැතිය ගන්නේ 2017.12.08 වැනි දින. ඊට කලින් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් අනුමත කරනවා. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ (ඉඩම්) අත්සන් කරනවා, 2017.12.08 දින මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ අනුමැතියට යවනවා. අවසානයේ තමයි ජනාධිපතිතුමාගේ අනුමැතියට යවනවා. අවසානයේ තමයි ජනාධිපතිතුමාගේ අත්සන එන්නේ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා හැටියට. මේ ඉල්ලීමකට ඇමතිතුමා තමයි මුලින් අත්සන් කරන්න ඕනෑ. ඇමතිතුමා අත්සන් කරන්නේ නැත්නම් ලේකම්ට හෝ වෙනත් කිසිවෙකුට අත්සන් කරන්න බැහැ. ඒක තමයි ක්‍රමවේදය. හැබැයි. මෙතැනදී ඒ ක්‍රමවේදය අනිත් පැත්තට තමයි කරලා තිබෙන්නේ. අපි අහනවා, ඒ ඇයි? මොකක්ද ඒකට තිබුණු හේතුව? මේ ක්‍රියාවලියේ ඉඩම් නිර්දේශ කිරීම සම්පූර්ණයෙන්ම නීත්‍යානුකූල

15 වැනි පිටුවට

2019 අගෝස්තු 07

# මඩකලපුව ප්‍රයිවෙට් කැම්පස් රජයට පවරා ගත යුතුයි

(මඩකලපුව විශ්වවිද්‍යාල පුද්ගලික සමාගම පිළිබඳ කල්තැබීමේ විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා

Batticaloa Campus (Pvt.) Limited පිළිබඳව මේ වන විට පාර්ලිමේන්තුවේත් විවිධ කාරක සභා මගින් විමර්ශන සිදු වෙමින් පවතිනවා. විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවත්, ඒ වාගේම COPE එකත්, අනෙක් පැත්තෙන් 2019 අප්‍රේල් 21 වැනි දින ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර පිළිබඳව සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන විශේෂ කාරක සභාවක් මේ පිළිබඳව විමර්ශනය කළා. මා දන්නා හැටියට මීට අමතරව CID එක සහ FCID එක මගිනුත් මේ සම්බන්ධයෙන් යම් විමර්ශනයක් සිදු කරගෙන යනවා.

දැන් අපේ රටේ රාජ්‍ය නොවන, පෞද්ගලික උපාධි ප්‍රදානය කරන ආයතන ආරම්භ කිරීම සඳහා යම් යම් නීති, අණ පනත් පවතිනවා. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය ශක්තිමත් කළත්, 1985 දී ගෙන එන ලද සංශෝධනය නිසා රාජ්‍ය නොවන පෞද්ගලික උපාධි ප්‍රදානය කරන ආයතන පිහිටුවන්නට යම් අවසරයක් ලබා දීලා තිබෙනවා. එයත් ලබාදී තිබෙන්නේ ආයෝජන මණ්ඩල ව්‍යාපෘති හැටියට ශ්‍රමිකයන් පුහුණු කරන ආයතන සඳහා උපාධි ලබා දෙන්නටයි. ඒ අනුව ඒ සංශෝධන ඉදිරිපත් කිරීමේදී බොහොම පැහැදිලිවම අවසර ගත යුතු රජයේ ආයතන ප්‍රමාණයක් නම් කරලා තිබෙනවා. ඒ ආයතන ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වෙන්නට ඕනෑ. ඒ වාගේම, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ගන්නට ඕනෑ. උපාධියට අදාළ වෘත්තීමය සභාවේ අනුමැතිය ගන්නට ඕනෑ. එය සෞඛ්‍යයට අදාළ එකක් නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවසරය ගන්නට ඕනෑ. මේ ආදී රාජ්‍ය ආයතන පද්ධතියක් මගින් තමයි ඒ අවසර ලබා ගත යුතු වන්නේ. නමුත් අපේ රටේ ලාභ ඉපැයීමේ අරමුණින් ආරම්භ කරන ලද පෞද්ගලික උපාධි ප්‍රදානය කරන ආයතන නිතරම මේ ක්‍රමවේදය කඩමින් තමයි ඉස්සරහට ආවේ.

ඒ කාලයේ SAITM එක සඳහා අවසරය ලබා ගෙන, නීතිය කඩකරමින් එතැනට ආවේ එවකට ඇමතිවරයා වෙලා හිටපු එස්. බී. දිසානායක ඇමතිවරයාගේ දේශපාලන බලයත්, නෙවිල් ප්‍රනාන්දු



මහතාගේ මුදල් බලයත් පාවිච්චි කරලායි. දැන් මේ අවස්ථාවේදී Batticaloa Campus එක සඳහා දේශපාලන බලයත්, මුදල් බලයත් හිටපු මන්ත්‍රී හිස්බුල්ලා විසින් පාවිච්චි කරලා තිබෙනවා. මේ ආයතනය ඔවුන් මුලින්ම පටන් ගන්නේ 2013 ජුනි මාසයේ 11වැනිදා University College, Batticaloa කියලායි. ඒ කියන්නේ, රට පුරා ඉන්න තරුණ තරුණියන් සඳහා නොමිලේ වෘත්තීය පුහුණු පාඨමාලාවක් ආරම්භ කරන්නට තමයි හිස්බුල්ලා මැතිතුමා සභාපතිත්වය දරන Sri Lanka Hira Foundation එක එවකට තරුණ කටයුතු සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශයත් එක්ක ගිවිසුමකට අත්සන් කරන්නේ. මම එම ගිවිසුම සභාගත කරනවා.

ඒ ගිවිසුම හැටියට, 2013 අගෝස්තු 15 සිට 2016 අගෝස්තු 15 දක්වා අවුරුදු තුනක් සඳහා තමයි මේ University College, Batticaloa කියන ආයතනය ආරම්භ කරන්නට රජයත් එක්ක එකඟ වෙන්නේ.

ඒකේ බොහොම පැහැදිලිව මෙසේ සඳහන් වෙනවා;

"All diploma courses should be opend to the youth of general public Sri Lanka"

ඒ වාගේම ඊළඟට සඳහන් වනවා;

"The diploma courses should be offered on free of charge basis"

> රාජ්‍ය-පෞද්ගලික හවුල් සමාගමක් හැටියට 2013 වර්ෂයේ තමයි මේ ආයතනය ආරම්භ කරන්නේ. මේ ආයතනය ආරම්භ කරන එක පාර්ශ්වයක් වුණේ එම රජයේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයයි. අනෙක් පාර්ශ්වය වූයේ හීරා පදනමයි. හීරා පදනමේ සභාපතිවරයා ලෙස කටයුතු කරන්නේ හිස්බුල්ලා මැතිතුමායි; නැගෙනහිර පළාතේ හිටපු ආණ්ඩුකාරතුමායි. එතුමා රජයත් සමග එහෙම ගනුදෙනුවක් කිරීම අපේ රටේ නීතියට කොයි තරම් ගැළපෙනවාද කියන එක අප සිතා බලන්න ඕනෑ. පැහැදිලිවම, බැඳියාවන් අතර ගැටුමක් - conflict of interest - යටතට වැටෙන තත්වයේ වරදක් ඔහු මෙතැනදී කර තිබෙනවා.

මේ විධියට අවසර ගන්න Sri Lanka Hira Foundation එක, 2014 දෙසැම්බර් 10 වෙනි දා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සමාගමක් හැටියට ලියා පදිංචි වෙනවා. ඒ වාගේම, 2016 මැයි මාසයේ 19 වෙනිදා ඔවුන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයත් එක්ක ගිවිසුම්ගත වෙනවා. ඔවුන් ක්‍රමානුකූලව University College එකක ඉඳලා උපාධි ප්‍රධානය කරන campus එකක් දක්වා මේ විධියට පරිවර්තනය වෙනවා.

පළමුවෙන්ම එම ඉඩම ලබා ගැනීම නීති විරෝධියි. ඒ සම්බන්ධයෙන් COPE එක විසින් ඉදිරිපත් කළ විගණන වාර්තාව මගේ ළඟ තිබෙනවා. 2012 මාර්තු 15 වැනි දින මහවැලි අධිකාරියෙන් එම ඉඩම සඳහා අවසර ලබා ගත්තා. නොමිලයේ වෘත්තීය පුහුණු අධ්‍යාපනය ලබා දීම සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ගොඩනගා ගන්න තමයි ඒ වෙලාවේ අවසර ලබා දෙන්නේ. එම ඉඩම, මහවැලි කලාපවල Zone 4A, සිද්ධපුර නගරය ගොඩ නගන්නට මහවැලි අධිකාරිය විසින් සැලසුම් කරන ලද කලාපයක පිහිටි ඉඩමක්. එසේ තිබියදී ඒ මූලික ඉඩම පරිහරණ සැලැස්ම නොතකා තමයි එම ඉඩම බැහැර කරන්නේ.

ඊළඟට පරිසර අධ්‍යයන වාර්තාවක් ගන්නට ඕනෑ. හැබැයි, පරිසර සහ වන සංරක්ෂණ අධ්‍යක්ෂවරයාගෙන් ඒ සඳහා අධ්‍යයන වාර්තාවක් ගන්නේ නැහැ. ඉඩම අරගෙන ඉදිකිරීම් වලින් සියයට 50ක් පමණ අවසන් කරලා තමයි, වාර්තාවක් ලබා දෙන්න කියලා මහවැලියට කියන්නේ. ඉතින් ඒ ඉඩම ලබා ගැනීම සම්බන්ධයෙන් මෙන්න මේ ආකාරයෙන් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒ අයට අක්කර 35ක් දුන්නාට, මේ

15 වැනි පිටුවට

කවුළුව හැරම් තබමි

# බේදය හා හාස්‍යය...




ලෝක ඉතිහාසයේ ඉතා වැදගත් සිද්ධීන් හා පෞරුෂත්වයන් දෙවරක් ඇතිවන බව කිවහැකි යැයි හේගල් වරක් පැවසීය. එහෙත් ඔහුට මෙලෙස එකතු කිරීමට අමතක විය. " ඒවා ඇතිවන්නේ ප්‍රථම වරට බේදාන්තයක් ලෙසත් දෙවැනි වර හාස්‍යජනක ලෙසත්ය." "මිනිසුන් තමන් සහ අවට පරිසර මැඩගෙන මෙතෙක් නොවූ විරූ යමක් නිර්මාණය කිරීමට මෙන් ඉදිරිපත් වන මොහොතේදී, මෙන්න මෙවැනි විප්ලවීය අර්බුද සහිත යුගවලදී අතීතයේ මළගිය ආත්ම තමන්ගේ ආධාර පිණිස අඬ ගැසීම්, ඒ මන්ත්‍ර බියසුළු ලෙස ජප කරමින් පැරණි වෙස් මුහුණු බැඳගෙන, පැරණි ණයට ගත් හඬින් කතා කරමින් සමස්ත ලෝක ඉතිහාසයේ නව ජවනිකාවක් රඟපෑම සඳහා ඔවුන්ගේ නම්ද, යුදමය සටන් පාඨ ද ඇඳුම්ද ලබාගනිති.'' - ලුවී බොනපාට්ගේ බ්‍රෑමර් දහඅට වැනිදා - 1851-52 කාල් මාක්ස්

මේ අපේ රටේ තවත් ජනාධිපතිවරණයක් සඳහා සූදානම් වන මොහොතයි. අගෝස්තු 11 පොහොට්ටුවේ ජනාධිපති අපේක්ෂකයා ප්‍රකාශයට පත්කළ අතර අගෝස්තු 18වැනිදා ජාතික ජනබලවේගය පොදු අපේක්ෂකයා ප්‍රකාශයට පත් කළේය. හිසේ සිට දෙපතුල දක්වා අර්බුදයේ ගිලුණු එ.ජා.ප.ය සිය අපේක්ෂකයා නම් කළ නොහැකිව ආඩපාලි නගමින් සිටී.

පොහොට්ටුවේ අපේක්ෂකයා මාක්ස් කියූ පරිදි අපට බේදය හා හාස්‍ය මතක් කර දෙන අතර එ.ජා.ප.යේ සජිත් රනිල් දෙබෑයන් මළගිය ආත්ම තමන්ගේ ආධාර පිණිස අඬගසමින් වෙස් මුහුණු පැළඳ එක එක ජවනිකා රඟ දක්වමින් සිටිති. දැන් මෙම දෙපාර්ශවයේම සිටින්නේ දේශපාලන මළගිය ආත්මයන්ය. පැරණි මළගිය සටන් පාඨ උච්චාරණය කරමින් මළගිය ලිබරල්වාදී වැඩපිළිවෙළ කරගසාගෙන මේ සූදානම් වන්නේ නැවත වරක් ජනතාව රැවටීමටය. රට ගොඩනගන ජනතාව සවිගන්වන වැඩපිළිවෙළක් මේ දෙපිලටම නොමැති බව දැනටමත් ඔප්පු කර හමාරය. කරමින් සිටින්නේ බලයට කෑදරව සුපුරුදු පරිදි නග්න සූදුවමය. අයියා වෙනුවට මලයා ආවද සජිත් වෙනුවට රනිල්ලා ආවද කරූ ආවද එය ඉතිහාසයේ බේදාන්තයකින් හා හාස්‍යයකින්ම කෙළවර වනු ඇත. මේ දෙකම අවසන් කළ යුතු කාලයයි මේ.

# තවත් එක් මාසයකි මේ



සැප්තැම්බර් මස සාහිත්‍ය මාසය ලෙස නිල වශයෙන් නම්කර තිබේ. රටක දියුණු කලාවක්, සාහිත්‍යයක් නිර්මාණය වන්නේ ඒ රටේ සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික හා ඒ මත ගොඩනැගෙන ජනවිඥානයේ මට්ටම අනුවය. සාහිත්‍ය හා කලාව යනු මිනිසා ලෝකය තුළ සිය සබඳතා මංපෙත් පාදා ගන්නා මාර්ගයන්ගෙන් එකකි.

මිනිසා වඩා සංකීර්ණත්වයට හා සුනම්‍යභාවයට පත් කොට ඔහුගේ මානසික තත්වයන් උසස් කිරීමට, ඔහු ආඪ්‍ය මිනිසකු බවට පත් කිරීමට, සාහිත්‍ය හා කලාවෙන් ඉතිහාසය තුළ මිනිස් සමාජයට කර ඇති මෙහෙය අනුපමය. එනිසාම උසස් සාහිත්‍යයක් හා කලාවක් යනු නව සමාජයක් ගොඩනැගීම සඳහා පූර්ව කොන්දේසියක්ද වන්නේය. කලාව අතීතයට මෙන්ම අනාගතයට ආලෝක ධාරාවන් විහිදුවයි.

එහෙත් අපි තවමත් එවැනි සාහිත්‍යයකට කලාවකට උරුමකම් කීමට තරම් භාග්‍යවතුන් වී ඇත්ද? නැගිය යුතු ප්‍රශ්නය එයයි.

වසරකට වරක් රාජ්‍ය සාහිත්‍ය උත්සවයක් පවත්වා, දේශපාලුවන් වේදිකාවට නැග දොඩවන නීරස ව්‍යාජ පල්හෑලිවලින් රටක සාහිත්‍ය පෝෂණය කළ නොහැක. වනසා දැමූ රටක සාහිත්‍යයක් පවතීද? සාහිත්‍යයේ සළුපිළිවලින් මේ දුගඳ හමන සමාජය වසා දමා එය සුගන්ධවත් කළ හැකිද? සාහිත්‍යයේ නිර්මාණාත්මක ආලෝක ධාරාවලින් අනාගත සමාජය දීප්තිමත් කිරීමට නම් මේ සමාජ ක්‍රමයේ වෙනසක් අවශ්‍යමය. එසේ නොමැතිව දේශපාලුවන්ගේ දෑත්වලින් දෙන ව්‍යාජ සම්මානවලින් රටක සාහිත්‍ය ගොඩනැගීම හා පෝෂණය කිරීම කළ නොහැකිය.

# අපේක්ෂාවේ අපේක්ෂකයා

පසුගිය අගෝස්තු 18 වන දින ගාලු මුවදොර පිටියේදී ජාතික ජනබලවේගය ජනාධිපති පොදු අපේක්ෂකයා ලෙස අනුර කුමාර දිසානායක සහෝදරයා ප්‍රකාශයට පත් කරන ලද්දේ ගාලුමුවදොර පිටිය සිසාරා සිටි ලක්ෂ සංඛ්‍යාත ජනතාවකගේ මුහුදු රළ මෙන් ගිගුම් දී නැගුණු අත්පොළසන් දීම් හා ජයඝෝෂා මැද්දේය. සංවිධාන තිහකට අධික සංඛ්‍යාවකින් ඔහුගේ නම ඒකමතිකව සම්මත කිරීම මෙහිදී විශේෂත්වයක් විය. රට කිරීමට එකම සුදුස්සා තමන් යැයි පාරම් බාන, මහින්ද පාර්ශවය තෙපරබාමින් සිට යන්තම් අපේක්ෂකයකු නම් කළේය. නමුත් ඒ පාර්ශවයේ ඇත්තම අපේක්ෂකයා ඔහුද යනු තවමත් ෂුවර් නැත. එ.ජා.ප. පාර්ශවය තවමත් මඩ වළ අවුස්සමින් සිටී. වැටී ඇති රට ගොඩනගා ජනතාවට සෞභාග්‍ය ගෙන එන වැඩපිළිවෙළක් මෙවර ජනාධිපතිවරණ සටනේ දී ඉදිරිපත් කළ එකම බලවේගය වන්නේ ජාතික ජනබලවේගයයි. එහි පොදු අපේක්ෂක අනුර සහෝදරයා රටේ ආර්ථික, දේශපාලනමය, සමාජීය, සංස්කෘතික අර්බුදයට පිළියම් ගෙනඑන වැඩපිළිවෙළ ලැබී තිබූ කාලය අනුව කෙටියෙන්, සරලව එහෙත් ගැඹුරින් ඉදිරිපත් කළේ ජනාධිපතිවරණයට ඉදිරිපත් වන අනෙක් සියලු පාර්ශවයන්ට අභියෝග කරමිනි. හැකිනම් එවන් නිරවුල් වැඩපිළිවෙළක් රට හමුවේ තබන ලෙස අප මහින්ද පාර්ශවයටත් එ.ජා.ප.යටත් අභියෝග කර සිටිමු. සැඟවී කැළෑ සටන්වල යෙදෙනු මිස මේ වන තෙක් එවැන්නක් අපි ඔවුන්ගෙන් නොදිටිමු. රට කා වනසා දේශපාලනමය වශයෙන් නන්නත්තාර වී සිටින මේ නරුම චෞරයන් ඉතිහාසයේ කෞතුකාගාරයේ ඔවුන්ට සුදුසු ස්ථානයේ තබා, රට ගැන හිතා තීරණයක් ගැනීම මෙවර ජනාධිපතිවරණයේ දී රටේ පුරවැසියන්ගේ ද පරම යුතුකම හා වගකීම වනු ඇත.



# පොලිටිකල් පංතිය

පොලිටික්ක හැපි මූඩ් එකේ හිටපු දවස් කීපයක් ගතවුණා. කාටත් කලින් උදෙන්ම පංතියට ආවා. ළමයි එක්ක හිනා වුණා. කොයිතරම්ද කියනවනම් බ්ලැක්බෝඩ් එකේ ලියන අතරෙ බිත්තියටත් හිනා වුණා. මෙහෙම දවසක උදේ ළමයි එකා දෙන්න පංතියට රෑටන්න පටන් ගත්ත.

"ගුඩ් මෝනිං සර්" වසන්තිය පංතියට ඇතුල් වෙන අතරෙ කිවුව.

"වෙරි ගුඩ් මෝනිං සර්" අනුරුද්දිය කිවුවෙ පංතියෙ දොරකඩ නතර වෙලා.

"ගුඩ් මෝනිං ළමයිනේ, ගුඩ් මෝනිං" මෝනිං ඩබල් එකේ ආපු හින්ද ළමයි දැනගත්තා මූඩ් ෆික්ස් කරන්න දෙයක් නැහැ කියල.

"මේ දවස්වල සර් පුල් හැපි එකේ ඉන්නෙ. අපිත් කැමතියි සර් දැනගන්න" කනිය හිනාව කපලා සාක්කුවෙ දාන ගමන් කිවුව.

"අනේ ඔව් සර්... අපිටත් කියන්නකො. ස්වීප් එකක්වත් ඇදුණාද?" වසන්තියත් කොටහ ඉල්ලන්න වගේ.

"මට විතරක් නෙමෙයි ළමයිනේ... මුළු රටටම ස්වීප් එකක් ඇදුණා වගේ" පොලිටික්ක අගේ වඩනව.

"මොකද්ද සර් ඒ ස්වීප් එක. අනේ කියන්නකො" අනුරුද්දියත් හුරතලේ.

"මේකනෙ ළමයිනේ... ඔය ළමයිනටත් තේරෙන්න එපායෑ" පොලිටික්ක කණ්ණාඩිය උඩින් බලල කින්ඩි හිනාවක් දැම්ම. " දේශපාලන විද්‍යාව ඉගෙන ගන්න ළමයි නේද?"

"ඔන්න සරුත් හැංගිමුත්තන් කෙළිනව" කනිය නොක්කාඩු කිවුව.

"ඇයි ඔය ළමයි ගෝඨාභය මහත්තයව නොමිනේෂන් දෙන්න තෝර ගත්ත කියල දන්නෙ නැද්ද?" පොලිටික්කගෙ මූණ පිපුණා.

"අයියෝ ඕකද...?" මංජුව තොල පෙරළල කියද්දි පොලිටික්කගෙ මූණ ඇකිළුණා. "මට හිතෙන්නෙ ඕක රඟපෑමක්... සර්"

"මොකද්ද ළමයො රඟපෑමක් කියන්නෙ, මහින්ද මහත්තයගෙ කටින්ම නේද කිවුවෙ?" පොලිටික්ක හැරෙන තැපෑලෙන් උත්තර දුන්න.

"ඒකම තමයි සර් ෂුවර් නැත්තෙ. නම කියනකොටත් කිවුවනෙ මගෙ කැමැත්ත නෙමෙයි කියල. අනික... අනික අපි නොදන්න මහින්ද මහත්තයගෙ පොරොන්දු... විධායක ජනාධිපතිකම නැතිකරනව කියලත් කිවුවෙ" මංජුවත් ඇරියෙ නෑ.

"අනෙක සර් හිතූ තරම් ගැම්මක් ආවෙ නෑ නේද? අපේ ආරක්ෂාව හදන්න එනවා කියපු කෙනා බාරහාර වෙවී තමන්ගෙ ආරක්ෂාව හදාගන්න ගියා විතරයි නේද? අපිනම් දැක්කෙ පන්සල් ගානෙ ගිය බවක් විතරයි" කනිය කාගෙද වැලමිටක් කෙනිත්තුව.

"ඒ ගියෙත් මහින්ද මහත්තයි ශිරන්ති නෝනවයි ඉස්සර කරගෙන නේද?" මංජුව අතිනුත් පෙන්නනව.

"ඉස්සර කරගෙන ගියාද ඉස්සර වෙන්න දුන්නෙ නැද්ද කියල දැනට... දන්නෙ එයාල විතරයි" සමන දැනට කියන එක බර කරල කිවුව.

"ඇයි සමන් දැනට... කියල කියන්නෙ?" කවුරුහරි කෙනෙක් ඇහුවට හැමෝගෙම ප්‍රශ්නෙ.

"දැනට එයාල විතරයි දන්නෙ කියල කිවුවෙ පස්සෙ අපිටත් දැනගන්න පුළුවන්... ගෝඨාභය මහත්තයට නොමිනේෂන් නොලැබුණාම" සමන පවුලේ රහසක් එළිකළා.

"ඇයි සමන් එහෙම කියන්නෙ?" කියල කවුරු හරි අහනකොටම වගේ පොලිටික්කත් මොකක් හරි කිවුව ඇහුණෙ නෑ.

"හරි...දැන් එයාව පෙනුමට තියාගෙන කැම්පේන් එක යනව. පස්සෙ... මාස තුනකට පස්සෙ... නොමිනේෂන් දෙනකොට තීරණේ වෙනස් වෙන්න ඉඩ තියෙනව" සමන කලිසම් සාක්කු දෙකට අත්දෙක බැස්සුව. "පොල් ලෙල්ලක් දැම්මත් ඡන්දෙ ලැබෙනව කියල තියෙන එකේ... තීරණේ වෙනස් වෙන්න පුළුවන්. ඉන්තේරුවෙන්ම පුරවැසිභාවය ප්‍රශ්නෙ විසඳිලා නෑ. එහෙත් නඩු මෙහෙත් නඩු... නඩු තියෙන අපේක්ෂකයො දාන්න එපයි කියල ආගමික නායකයො ඉල්ලල තියෙන නිසා එකට හිස නැමුව කියල වංගුවක් ගහන්න විතරයි තියෙන්නෙ." සමනගේ කතාව අතරෙ පොලිටික්ක මොනවද කොඳුර කොඳුර හම් මල්ලට මූණ ඔබන් හිටිය දැක්කෙ කීප දෙනයි.

## ජනාධිපතිවරණය...

03 පිටුවෙන්



නැත. මේ නිසා ඔවුහු දේශපාලන අවුලක සිටිති.

මේ සියලු සාධක හා කරුණු පෙළගැසෙමින් තිබෙන්නේ ප්‍රතිගාමී ධනවාදී කඳවුරට විකල්ප ප්‍රජාතන්ත්‍රවාදී, ප්‍රගතිශීලී හා වාමවාදී කඳවුරේ අපේක්ෂකයෙකුට වාසි සැලසෙන සේය. මේ මොහොතේ එම කඳවුර නියෝජනය කරනු ලබන්නේ ජාතික ජන බලවේගය වන අතර එහි අපේක්ෂකයා ලෙස ඉදිරිපත්ව සිටින අනුර දිසානායක සහෝදරයා මෙවර ජනතාව ඉල්ලා සිටින විකල්ප අපේක්ෂකයා වීම වැළැක්විය නොහැක. එබැවින් අලුත් බලවේග එකතුකර ගැනීමේ හා නව ජයග්‍රහණ ලබා ගැනීමේ හැකියාව හා වාසිය ඔහු නියෝජනය කරන ජනතා ව්‍යාපාරය සතුය.

## රටට අවශ්‍ය...

05 පිටුවෙන්



ඒ හුදු වෘත්තීයවේදීන්ගෙන් පමණක් නොවෙයි, හුදු ජනතාවගෙන් පමණක් නොවෙයි. විශේෂයෙන් අදූෂිත දේශපාලනයක්; රට ගොඩනැගීම සඳහා දැක්මක් සහ වුවමනාවක් තිබෙන වෘත්තීයවේදීනුත් එය ක්‍රියාත්මක කිරීම සඳහා ඒ මහා මෙහෙය ඉටුකළ හැකි මහජන ප්‍රජාවගෙන් සමන්විත වැඩපිළිවෙළක් මගින් පමණයි මෙය සාර්ථක කරගත හැකිවන්නේ. දේශපාලන නායකත්වයක්, වෘත්තීයවේදීන්ගේ මැදිහත්වීමක් ජනතාවගේ මෙහෙයත් මගින් මේ රට පුළුල් පරිවර්තනයකට ලක්කළ හැකියි. ජනතාව ගැන දැඩි විශ්වාසයක් අපට තිබෙනවා. ඒ විශ්වාසය මත තමයි අපි කටයුතු කරමින් සිටින්නේ.

## අපේ රටේ...

08-09 පිටුවෙන්



ඔවුන්ට සුරක්ෂිතතාවයක් නැහැ. මේ වෙනකොට කාන්තාවන් විශාල ප්‍රමාණයක් ක්ෂුද්‍ර ණය උගුලේ ගොදුරු බවට පත්කර තිබෙනවා. එක කාන්තාවක් මා සමග ප්‍රකාශ කළේ ණය උගුලෙන් බේරෙන්න, "මට දැන් විකුණන්න තියෙන්නේ වකුගඩු විතරයි." කියලා කාන්තවන්ගේ දුක්ඛිත ජීවිත ගැන මෙයින් පැහැදිලි වෙනවා. අනික් පැත්තෙන් කර්මාන්ත හිමියන් ධන කුවේරයන් බවට පත්වෙනවා. දැන් දැන් මැන්පවර් සේවකයන් යොදාගෙන නිෂ්පාදන ඉලක්ක සපුරා ගන්න බලනවා. මේ තත්වය ඔරොත්තු දෙන්නේ නැති කාන්තාවන් මත්ද්‍රව්‍ය භාවිතා කර, වැඩකරන තත්වයකට පත්වෙලා. ඔවුන් විශාල ආතතියකින් ඉන්නේ. ඔවුන් වැඩි වැඩියෙන් පීඩාවට පත්කරලා. මේ තත්වයෙන් රටේ සමස්ත කාන්තාවන් මුදාගත හැක්කේ ජාතික ජන බලවේගය වටා එක්රොක්වීමන් පමණක් බව අවධාරණය කරනවා.

## ආලෝකයේ දිශාවට...



ගාලුමුවදොර පිටියෙන් මොනවට ඔප්පු වී තිබෙනවා. විශ්වාසනීය නායකත්වයක් අපට තිබෙනවා. අපි නායකත්වය ගැන විශ්වාස කරන්නේ අනුගාමිකයන් ලෙස නොවෙයි. තවත් අය නිර්මාණය කරන කෙනෙක් හැටියටයි. මේ ජනතාව තුළ පුදුමාකාර සාවධානයක්, පුදුමාකාර නිහැඬියාවක් දකින්න පුළුවන්. ජාතික ජන බලවේගයේ සුවිශේෂී ගුණාත්මක තත්වයක් මේ සාවදානවීම තුළ දකින්නට පුළුවන්. ඒක අධිෂ්ඨානයෙන් සාවධාන වීමක්. ඒක අධිෂ්ඨානයේ නිහඬතාවයක්.

සාධාරණව ජීවිත පවත්වාගෙන යාමට වටපිටාවක් විශ්‍රාමික ජීවිතය නිදහසේ ගතකිරීමට, විවේකය ඵලදායක ලෙස යොදාගැනීමට වටපිටාවක් නිර්මාණය කිරීම පොදු සාමූහික මනුෂ්‍ය ජීවිතයේ සංවර්ධනය බවට මාටින් වික්‍රමසිංහයන් නිතර උපුටා දැක්වූ මාග්‍රට් මීඩ් කළ ප්‍රකාශය මේ මොහොතට ඉතාම වැදගත්. ලොව වෙනස් කිරීමට අවංක කැපකිරීමත් විචාරශීලී බුද්ධියෙනුත් යුතු ටිකදෙනෙක් පෙරටුකොට ගත් ව්‍යාපාර පසුකාලීනව විශාල ජන ගංගාවක් බවට පත්වෙනවා. ඇය සඳහන් කළ පරිදිම ඉතිහාසය ගමන් කර තිබෙන්නේ ඒ ආකාරයටයි. ජාතික ජන බලවේගය වටා එක්රොක්වන ජනතාව ගැන අප සම්පූර්ණයෙන්ම විශ්වාසය කරනවා. ආලෝකය වැටී තිබෙන්නේ ඒ දිශාවටයි. ආලෝකය වැටී තිබෙන ඒ දිසාව කරා අප නොනැවතී ගමන් කරමු.

මේ ගමනේදි අපට විවිධ මංසන්ධි හමුවෙනවා. ඒ මංසන්ධිවලදී විශාල ප්‍රගතිශීලී පිරිසක් මුණ ගැහෙනවා. ඔවුන් සියලු දෙනා ඒකරාශී කරගෙන ආලෝකය වැටී තිබෙන ඒ දිසාව කරා නොපසුබස්නා උත්සාහයෙන් ජයග්‍රාහීව ගමන් කරමු කියා මා ඉල්ලා සිටිනවා.

## එකම ජීවිතාරක්ෂක...



සියදිවි නසාගන්නා ඉහළම ජනතාවක් ඉන්නවා. මත්ද්‍රව්‍ය භාවිතය ඉහළම මට්ටමක තිබෙනවා. රටේ වැඩකරන කාන්තාවන්ගෙන් 25%ක් විදේශගත කරලා. ඔවුන් උපයන ආදායම්වලින් දේශපාලනඥයෝ සුඛිත මුදිත ජීවිත ගතකරනවා. මේ වැනි පාලකයන්ගෙන් රට බේරාගැනීමේ වැඩපිළිවෙළක් සහිත ප්‍රතිපත්ති ගරුක දේශපාලනයකට අප යා යුතුයි.

අද මේ රට කුණාටුවකට අහුවෙලා. සුන්බුන් ගොඩක් බවට පත්වෙන යාත්‍රාවක තත්වයට ඇද වැටිලා. අපේ දරු පරපුරත් ඇතුළු සමස්ත අනාගතය විනාශ වෙන්න දෙනවාද යන ප්‍රශ්නය අපි හැමෝම ඉදිරිපිට තිබෙනවා. මේ විනාශයෙන් දිවි ගලවා ගැනීමේ එකම ජීවිතාරක්ෂක නෞකාව වී තිබෙන්නේ ජාතික ජන බලවේගය පමණයි. ඒ නෞකාවට ගොඩවී දිවිගලවා ගන්නවාද එය අත්හැර දැමීමෙන් ඔබේත් ඔබේ දරුවන්ගේත් රටේ හෙට දවසත් සුන්බුන් ගොඩක් බවට පත්වෙන්නට ඉඩ හරිනවාද යන්න බුද්ධිමත්ව තෝරාගත යුතුයි. අපි ඔබට යෝජනා කරන්නේ මේ රටත් දරු පරපුරේ අනාගතය බේරා ගැනීම සඳහා මේ දිවිගලවා ගැනීමේ නෞකාවට එක්වී ජයග්‍රහණය කරා නොසැලී ගමන්කරන ලෙසයි.

## තමන්ගේ ආරක්ෂාවට...



රටේ අම්මලා දරුවන් එක්ක කෝච්චියට පැනලා දිවි නසාගන්න තැනට ජීවත්වෙන්න බැරි රටක් කළ උදවිය කියන කතා විශ්වාස කරන්න එපා කියලා මම ජනතාවගෙන් ඉල්ලා සිටිනවා. මේ රටේ පුරවැසියන් හැටියට ඔබත් මමත්, අපි හැමදෙනාම විශ්වාසය තබාගත යුත්තේ නායකයෙක් නොවන ජනතාවගේ අපේක්ෂකයෙක් ගැනයි. ඔය නායකත්වයට පොර බදන අය පහුගිය අවුරුදු 70ට වැඩි කාලයක් අපේ රට ගෙනැත් තිබෙන්නේ මහා බේදවාචයකටයි.

දැන් 13+ දෙන බව දෙමළ ජනතාවට ප්‍රකාශ කරලා. අලි-පොහොට්ටු හවුල් කඳවුර බලය ගන්න මේ වගේ පොරොන්දු ජනතාවට දෙනවා. අපි අවධාරණය කරන්නේ ජනතාව අත්විඳින විනාශකාරී අත්දැකීම් නැවත අත්කරගත යුතු නැති බවයි. විනයක් සහිත ජනතාවක් බිහිවන්නේ විනයක් සහිත නායකයන් පිරිසක් බලයට පත්කර ගැනීමෙන් පමණයි. මහ බැංකුව කොල්ලකෑව පිරිසකට මේ රටේ ජනතාව ගැන කිසිම වගකීමක් නැහැ. අලි-පොහොට්ටු හවුලේ ඉන්නේ ජාතිවාදී වගේම මංකොල්ලකාරී පිරිසක්.

ඊට අමතරව පැරෂුට්වලින් බැස්සා වාගේ දැන් එන විකල්පය යැයි කියාගන්නා අය ගැන කිසිම විශ්වාසයක් තැබිය යුතු නැහැ. ඇතැමුන් රටේ ණය ගෙවන බව කියනවා. ඕවට කියන්නේ බයිලා. අපි මෙහෙම කියමු. "රටේ ණය ගෙවල පෙන්වන්න. එතකොට ඡන්දය දෙන්නම්." ජනතාවක් හැටියට වගකීමෙන් දේශපාලනය කරනවා නම් කියන්න ඕනෑ ඒ විදිහටයි. ඔය බයිලාවලට නොරැවටී පොදුජනයාගේ අපේක්ෂාවන් සහිත අරමුණු ප්‍රතිපත්ති සහිත ඉදිරි දැක්මක් වැඩපිළිවෙළක් සහිත දේශපාලන ව්‍යාපාරයක් හැටියට ජාතික ජන බලවේගය අපි හඳුනාගෙන තිබෙනවා. අලුත් පරපුර මැදිහත් වෙලා ඉන්නේ ඒ බලවේගය තුළින් මේ රටේ යහපත් අනාගතය ගොඩනැගීමටයි.

## ජනතා බදු මුදල් නාස්ති...

13 පිටුවෙන්



නැහැ. කොටින්ම මේ ඉල්ලීම නීති විරෝධී විධියට තමයි අනුමත කරලා තිබෙන්නේ.

ඊට පස්සේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 2013 මැයි 18 දිනැති ඩීඑල්/1/1 දරන අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව ඉඩම් බැහැර කිරීමට ප්‍රථම අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව ඉඩම් බැහැර කිරීමට ප්‍රථම කලාපීය අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) නිර්දේශ ලබා ගන්න ඕනෑ. ඒ නිර්දේශ අරගන්න ලියන්නේ 2017දී. ඊට පස්සේ පරිසර හා වන සංරක්ෂණ අධ්‍යක්ෂකගේ නිර්දේශය ගන්න ඕනෑ. එහෙම නිර්දේශයක් අරගෙනත් නැහැ. මෙහි වැදගත්ම දේ ඒක නොවෙයි. ඒ ගොල්ලෝ අක්කර 35ක් සඳහා අනීතික විධියට නීති විරෝධී විධියට - අනුමැතිය අරගෙන, පසුව හීරා පදනම විසින් 2017 පෙබරවාරි 13වැනි දා තව ඉල්ලුම් පත්‍රයක් මගින් මඩකලපුව විශ්වවිද්‍යාලයේ සිසුන්ට නේවාසිකාගාර, ආපනශාලා හා ක්‍රීඩා පහසුකම් ලබා ගන්න තවත් අක්කර 45ක් ඉල්ලා තිබෙනවා. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා 2017 අප්‍රේල් 18 දිනැති ලිපියෙන් කියනවා, "දැනටමත් අක්කර 35ක භූමියක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී ඇති පාර්ශ්වයක් සඳහාම යළිත් අක්කර 45ක භූමියක් වෙනත් ව්‍යාපාර නාමයක් යටතේ කෙරෙන ඉල්ලීමක් බැවින්, මේ පිළිබඳව ඉදිරි කටයුතු සිදු කිරීම පිණිස ඔබතුමාගේ පූර්ව අනුමැතිය කාරුණිකව අපේක්ෂා කරමි" කියලා.

2017.04.18 වැනි දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මේ ඉල්ලීම් කරනකොට, විෂය භාර ඇමතිවරයා හැටියට ජනාධිපතිවරයා විසින් "නිර්දේශ කරමි" කියලා අත්සන් කරනවා. **ඒ ඉල්ලීම කරලා තිබෙන්නේ 2017 මාර්තු 15 දින හීරා පදනමෙන්. හිස්බුල්ලා මැතිතුමාගේ අත්සන තිබෙනවා. සභාපති, හීරා පදනම (පුද්ගලික) සමාගම යනුවෙන් එහි සඳහන් වෙනවා. මහවැලි සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය 2017.05.25 වැනි දින ඒ අනුමැතිය ලබා දීලා තිබෙනවා. අක්කර තිස්පහයි. හතළිස් පහයි. ජනාධිපතිතුමාගේ පොළොන්නරුවේ ඉඩමක්ද මේ දෙන්නේ කියලා මම අහනවා. එතුමාගේ පෞද්ගලික බූදලයෙන්ද මේ දෙන්නේ? මහවැලි අධ්‍යක්ෂ ජනරාල්ගේ පෞද්ගලික බූදලයෙන්ද තව අක්කර 45ක් දෙන්න යන්නේ?**

ඒ අක්කර 45 දෙන එක නතර වෙලා තිබෙන්නේ මේ සංවාදය රටේ මතු වුණු නිසායි. නැත්නම් හිස්බුල්ලා සමාගමට තව අක්කර 45ක් දෙනවා. අපි කියන්නේ ඒකයි. මෙම ආයතනය වහා රජයට පවරා ගන්න ඕනෑ. මේවා රජයේ ඉඩම්, මහවැලි අධිකාරියේ ඉඩම්, මහජනතාවගේ ඉඩම්. ඒ සියලු දේපළ රජයට පවරා ගෙන නොමිලේ අධ්‍යාපනය ලැබිය හැකි විශ්වවිද්‍යාලයක් හදන්න ඕනෑ. කිසිම ගැටලුවක් නැහැ. නැගෙනහිර පළාතේ දරුවන්ට එහි ප්‍රමුඛතාවක් දෙන්න ඕනෑ. ඒ ගැන ගැටලුවකුත් නැහැ. හැබැයි, මේ වංචනික හොරුන්ට, තක්කඩීන්ට අනුමැතිය දුන්න අයටත් එක්ක අනිවාර්යයෙන්ම අපේ රටේ නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ.

## ජනවරමට එකඟ පාර්ලිමේන්තුවක්...



වෙනකොට මහවැලි අධිකාරියේ වාර්තා මගින් පෙන්නුම් කරනවා, අක්කර 35ට වඩා අක්කර 8ක් දැනටමත් වැඩිපුර භාවිත කරනවා කියලා. මේ තිබෙන්නේ, මහවැලි අධිකාරිය විසින් නිකුත් කරන ලද Land Occupation Map of Batticaloa Campus (Pvt) Limited කියන Google Map එක. ඒ අය නීති විරෝධී විධියට දැනටමත් අක්කර 8ක් බලහත්කාරයෙන් පරිහරණය කරනවා. ඒ අතරේ තවත් අක්කර 45ක් ගැනීම සඳහා ඔවුන් අවසරය පතනවා. පොදු කටයුත්තක් සඳහා, ඒ කියන්නේ අපේ රටේ තරුණ තරුණියන්ට නොමිලයේ අධ්‍යාපනය ලබා දෙන්නටයි රජය විසින් එම ඉඩම වෙන් කරන්නේ. එසේ වෙන් කර තිබියදී තමයි දේශපාලන බලය පාවිච්චි කරලා, කූට උපක්‍රම පාවිච්චි කරලා, ක්‍රමානුකූලව මෙය උපාධි විකුණන ආයතනයක් බවට පත් කරමින් යන්නේ. එම ඉඩමේ ගොඩනැගිලි ඉදි කරලා තිබෙනවා. එම ගොඩනැගිලි පිළිබඳව රටට වාර්තා කළ හැටි අපි මාධ්‍යවලින් දැක්කා. සාමාන්‍යයෙන් ගොඩනැගිල්ලක් ඉදි කරනකොට ප්‍රාදේශීය සභාවෙන් ගන්න ඕනෑ අනුමැතියවත් එම ගොඩනැගිලි ඉදි කිරීමේදී ලබාගෙන නැහැ.

ඊළඟට, එම ඉදි කිරීම නීති විරෝධී වෙන්නේ මෙන්න මේ නිසායි. හිටපු මන්ත්‍රීවරයා, හිටපු ආණ්ඩුකාරතුමා වන හිස්බුල්ලා මහතා 1993 වාගේ කාලයේ "හීරා පදනම" ආරම්භ කරලා තිබෙනවා. එය එක වෙලාවක 'Sri Lanka Hira Foundation, එක වෙනවා. පසුව Hira Foundation, වෙනවා. හැබැයි, එම ආයතනය රටේ සාමාන්‍ය නීතියේ හැටියට 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කරලාත් නැහැ. එම නිසා එතැනත් නීති විරෝධීභාවයක් තිබෙනවා.

මේ සම්බන්ධයෙන් තිබෙන බරපතළම ප්‍රශ්නය මේ ආයතනය සඳහා මුදල් ලැබුණු ආකාරයයි. මේ ආයතනය සඳහා මුදල් ලැබිලා තිබෙන්නේ සවුදි අරාබියෙන්. හැබැයි, මේ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින හිස්බුල්ලා මහත්මයාට හෝ ඔහුගේ පුත්‍රයාට මේක ණයක්ද, ප්‍රදානයක්ද කියලා හරියට කියා ගන්න බැරි වුණා. මුලදී මෙය ණයක්ද, ප්‍රදානයක්ද කියා හරියට කියා ගන්න බැරිව ඉඳලා, එක වෙලාවක හිස්බුල්ලා මහත්මයා කියනවා, මේක ණයක් කියලා. හැබැයි ප්‍රශ්නය මේකයි. මේ ණය ලැබෙනකොට, ඒ ණය ගිවිසුම ඉදිරිපත් කළ යුතු ආයතනවලට ණය ගිවිසුම ඉදිරිපත් කරලා නැහැ. ඔවුන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට මේ ණය ගිවිසුම දීලා නැහැ; ලංකා බැංකුවටත් දීලා නැහැ. අනෙක් කාරණය මේ ආයතනයට ණයක් ගන්නවාය කිව්වාට, ඒ ණය ගෙවන්නේ කොහොමද? මේ ණය ලබාගෙන තිබෙන්නේ එහෙම ගෙවන්න පුළුවන් Account එකකින් නොවෙයි. ඒ නිසා, මේ මුදල් ලැබීම පිළිබඳව මීට වඩා දැඩි පරීක්ෂණයක් කළ යුතු බවයි මම නම් හිතන්නේ.

ඊළඟට, මෙන්න මේ කාරණයත් වැදගත්. 2019 ජූලි 19වන දින පළ වූ "ලංකාදීප" පුවත් පත මෙන්න මෙහෙම ප්‍රවෘත්තියක් වාර්තා කර තිබුණා: "හිස්බුල්ලා සරසවියට සෞදි තහනම් සංවිධානයකින් කෝටි 1757ක්" ඒ කියන්නේ, අපට වාර්තා වෙලා තිබෙන මුදලටත් වඩා වැඩි මුදලක් මෙම ආයතනයට ලැබිලා තිබෙනවා. ඒ සිද්ධිය සම්බන්ධයෙන් FCID එක පරීක්ෂණයක් ආරම්භ කර තිබෙන බව තමයි එම පුවත් පත් වාර්තාවේ සඳහන් වන්නේ.

**රාජ්‍ය-පෞද්ගලික හවුල් සමාගමක් හැටියට 2013 වර්ෂයේ තමයි මේ ආයතනය ආරම්භ කරන්නේ. මේ ආයතනය ආරම්භ කරන එක පාර්ශ්වයක් වුණේ එම රජයේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයයි. අනෙක් පාර්ශ්වය වූයේ හීරා පදනමයි. හීරා පදනමේ සභාපතිවරයා ලෙස කටයුතු කරන්නේ හිස්බුල්ලා මැතිතුමායි; නැගෙනහිර පළාතේ හිටපු ආණ්ඩුකාරතුමායි. එතුමා රජයත් සමග එහෙම ගනුදෙනුවක් කිරීම අපේ රටේ නීතියට කොයි තරම් ගැළපෙනවාද කියන එක අප සිතා බලන්න ඕනෑ. පැහැදිලිවම, බැඳියාවන් අතර ගැටුමක් - conflict of interest - යටතට වැටෙන තත්වයේ වරදක් ඔහු මෙතැනදී කර තිබෙනවා.** පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, රජයේ නියෝජ්‍ය ඇමතිවරයකු ලෙස හිඳිමින්, ඔහුගේ වරප්‍රසාද පාවිච්චි කරලා තමයි මේ ගනුදෙනු සිදු කර තිබෙන්නේ.

බොහොම පැහැදිලියි මේ ඉඩම අරගෙන තිබෙන්නේත් නීත්‍යානුකූලව නොවෙයි. මේවාට අවසර ලබා ගැනීම සඳහා මන්ත්‍රී ධුරය, නියෝජ්‍ය ඇමතිකම පාවිච්චි කර තිබෙනවා. ඒ නිසා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව යෝජනා කරනවා, මේ Batticaloa Campus (Pvt.) Limited ආයතනය රජයට පවරා ගෙන, එය නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පීඨ සංකීර්ණයක් බවට පත් කරන ලෙස හා මේ අයථා ගනුදෙනුවට සම්බන්ධ වූ, නීති විරෝධීව කටයුතු කළ අය නීතිය හමුවට පමුණුවන්න කියලා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




වෙනිසියුලාවට ජාත්‍යන්තරවාදී සහය පළකරමින්...



ඇල්ල ගිනි තැබීම් නිරීක්ෂණය කරමින්...



පෝට් සිටියේ අතුරු විපාක නිරීක්ෂය කර...



දූෂණයට එරෙහිව ජාත්‍යන්තරව කඳවුරු බැඳ...



ක්‍රීඩාවට අත හිත දී...



උපාධිධාරීන්ගේ රැකියා ගැටලුවට මැදිහත් වී...

# ජනතාවට තෝරා ගැනීමට ඇත්තේ රට විනාශ කරන කඳවුරද රට හදන කඳවුරද යන්නයි...

**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා**

කඳවුරු තුනක් හෝ අපේක්ෂකයන් කිහිප දෙනෙක් මේ වන විට නොමැති බවත් රට දෙකට බෙදී අවසන් බවත් අවධාරණය කළ ජනතා විමුක්ති පෙරමුණේ ටිල්වින් සිල්වා සහෝදරයා, ජනතාවට රට හදන කඳවුර හෝ රට විනාශ කරපු කඳවුර යන දෙකින් එකක් තෝරා ගත හැකි බව පැවසීය. පැරණි ක්‍රමයට රජවරුන් වැඳ පුදාගෙන වැඩවසම් ක්‍රමයක් සහිත ඉතා දුෂ්කර පාලනයක් යටතේ යටත්වැසියන් ලෙස දුක් විඳින කඳවුර හෝ එසේ නොමැතිනම් දියුණු වැඩපිළිවෙළක් සහිත රට ගොඩනගන කඳවුර තෝරා ගැනීමට ජනතාවට අවස්ථාව ලැබී ඇතැයි ඔහු පෙන්වා දුන්නේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 16වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. මෙහිදී තවදුරටත් කරුණු දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද පැවසීය.

"මේ වනවිටත් මහින්ද රාජපක්ෂ කණ්ඩායමෙන් ගෝඨාභය රාජපක්ෂ අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වී තිබෙනවා. අපේක්ෂකයෙක් ඉදිරිපත් කරගන්න බැරිව එ.ජා.ප.ය අර්බුදයක ඉන්නවා. රනිල්ද, සජිත්ද, කරුද කියලා තීරණයක් ගන්න බැරුව ඉන්නවා. ඒ අතර දැන් සමාජයෙන් මතුවෙන යෝජනාවක්ද තිබෙනවා. 2015දී මහින්ද රාජපක්ෂ කඳවුර පරාජය කළ බලවේග අතර කතාබහක් තිබෙනවා, ගෝඨාභය රාජපක්ෂ පැමිණීමත් සමග ප්‍රජාතන්ත්‍රවාදය අනතුරකට පත්වෙන නිසාත් ඒකාධිපතිත්වයකට රට ගමන් කළ හැකි නිසාත් එයට එරෙහිව එක පෙරමුණක් ලෙස පොදු අපේක්ෂකයෙක් ඉදිරිපත් කළ යුතුයි කියලා. අපිත් හිතනවා මහින්ද රාජපක්ෂ කඳවුරේ දේශපාලන සංස්කෘතිය පරාජය කළ යුතුයි කියලා. එසේ කළ යුත්තේ ගෝඨාභය නිසා නොව මහින්ද රාජපක්ෂ කඳවුර නියෝජනය කරන දුෂ්ට දේශපාලන සංස්කෘතිය නිසයි. රාජපක්ෂ දේශපාලන කඳවුර නියෝජනය කරනු ලබන්නේ රටේ කුමන හෝ අපරාධයකට සම්බන්ධ පිරිසක්. එනිසා එම දේශපාලන සංස්කෘතියම පරාජයට පත්කළ යුතුයි. එනිසාම 2015දී එම කඳවුරට එරෙහිව ඡන්ද ලක්ෂ 62ක් ලබාදුන්නා. එම ඡන්දවලින් බලයට පැමිණි වර්තමාන පාලනය එම දේශපාලන සංස්කෘතිය පරාජයට පත්කළේ නැහැ. එම දේශපාලන සංස්කෘතියම පවත්වාගෙන ගියා. මහ බැංකු බැඳුම්කර වංචාවට සම්බන්ධව අල්ලස් ගත් රවී කරුණානායකට ඇමතිධුරය අහිමි වුණා. නමුත් ටික කාලයකින් නැවතත් එම දූෂිත ඇමතිවරයාට ඇමතිකම ලබාදුන්නා.

රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ එ.ජා.ප.යත් මෛත්‍රීපාල ජනාධිපතිවරයාත් පැවති



දේශපාලන සංස්කෘතිය යහපත් තත්වයට ගෙන ඒමට අසමත් වුණා. එය නැවත නැවත සිදුවිය යුතු නැහැ. රාජපක්ෂ අශිෂ්ට දේශපාලන සංස්කෘතිය පරාජයට පත්කළ හැක්කේ ජ.වි.පෙ. ප්‍රමුඛ ජාතික ජන බලවේගයට පමණයි. රාජපක්ෂ දේශපාලනයට එරෙහිව තිබෙන එකම මධ්‍යස්ථානය ජාතික ජන බලවේගයත් එයින් ඉදිරිපත් වන අපේක්ෂකයා ප්‍රමුඛ කඳවුරත් පමණයි. රටට අලුත් ආදර්ශයන් පෙන්වපු, සංවිධාන විනයක් සහිත ව්‍යාපාර විශාල ප්‍රමාණයක් හා එක්වුණු ජනතා මධ්‍යස්ථානයක් දැන් ගොඩනගා තිබෙනවා. එම මධ්‍යස්ථානය වටා එක්වීම හැර ජනතාවට වෙන විකල්පයක් නැහැ. අපි ජනතාවගෙන් ඉල්ලනවා රට රකින, රට හදන බලවේගය සමග අත්වැල් බැඳගන්න කියලා."

මෙම අවස්ථාවට ජ.වි.පෙ. මධ්‍යම කමිටු සාමාජික, නීතිඥ සුනිල් වටගල සහෝදරයාද සහභාගි විය.

# මූල්‍ය, පරිපාලන විනයක් නැති පාලනයක් වෙනුවට රටට නව ගමනක් අවශ්‍යයි

**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා**

රටේ මූල්‍ය විනයත් පරිපාලන විනයත් බිඳ වැටී ඇති බවටත් වංචා-දූෂණ නාස්තිවලට සම්බන්ධ හොරුන්, මංකොල්ලකාරයින් දේශපාලන ඩීල් මගින් නිරුපද්‍රිතව සිටින බවටත් චෝදනා කළ ජනතා විමුක්ති පෙරමුණේ විජිත හේරත් සහෝදරයා, රටේ ජනතාව පැරණි පාලනයන් අනවශ්‍ය බවටත් රට ගොඩනැගීම සඳහා විකල්ප බලවේගයක් අවශ්‍ය බවටත් කතාබහ කරමින් සිටින බව ප්‍රකාශ කළේය.

විජිත හේරත් සහෝදරයා මේ අදහස් පැවසුවේ පසුගිය 12වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ විජිත හේරත් සහෝදරයා මෙසේ පැවසීය.

"මහානායක ස්වාමීන් වහන්සේලා, අනෙකුත් ආගමික නායකතුමන්ලාගේ එකඟතාවයෙන් ශ්‍රී ලංකාවට සුපිළිපන් දේශපාලන සංස්කෘතියක් උදාකරගැනීම උදෙසා සුදුසුකම් ඇති මැතිවරණ අපේක්ෂකයන් තෝරා පත්කර ගැනීම සඳහා දේශපාලන පක්ෂ නායකයන් හා මහජනතාව වෙත නිර්දේශ ප්‍රමාණයක් ඉදිරිපත් කරනු ලැබුවා. ඒ සඳහා මල්වතු, අස්ගිරි, අමරපුර, සහ රාමඤ්ඤ මහා නිකායන්වල මහානායක හාමුදුරුවන් වහන්සේලා, කොළඹ අගරදගුරු හිමිපාණන්, ලංකා සභාවේ රදගුරු හිමිපාණන්, සමස්ත ලංකා හින්දු සම්මේලනයේ කුරුක්කල් තුමා සහ ජමියතුල් උලමා සභාවේ සභාපතිතුමන් අත්සන් කොට තිබෙනවා. රටේ ඊළඟ දේශාපාලන නායකත්වය සහ පාර්ලිමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතනවලට ඉදිරිපත් වන නියෝජිතයින්ට මෙම නිර්දේශ වලංගු වෙනවා. එම නිර්දේශවල පැහැදිලිව සඳහන් වෙනවා, අපරාධ



වැරදිවලට වරදකරුවී ඇති අපේක්ෂකයන්, නඩු පවතින අපේක්ෂකයන් සඳහා නාම යෝජනා ලබානොදිය යුතුයි කියලා. රට ඉල්ලා සිටින්නේ එවැනි අපේක්ෂකයින්. නමුත් දැන් සිදුවෙමින් තිබෙන්නේ ඊට හාත්පසින් පරස්පර දේවල්.

අපේ රට විනාශ කළ, කැරකොප්පුවක් බවට පත්කළ පැරණි පාලකයන් පරාජයට පත්කොට නව ගමනක් ආරම්භ කිරීම සඳහා අපි කටයුතු කරනවා."

# ජාතික වැඩපිළිවෙළක් තිබෙනවා, ජයග්‍රාහී අපේක්ෂකයෙක් ඉන්නවා, තීරණය ගත යුත්තේ ජනතාවයි...

**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා**

හොරුන්ගේ කඳවුරට එරෙහිව ජනතාවට ඇති එකම විකල්පය ජාතික ජන බලවේගය බව ප්‍රකාශ කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, ජාතික ජන බලවේගයට දියුණු වැඩපිළිවෙළක් ඇති බවත් එය ක්‍රියාත්මක කිරීම සඳහා හොඳ දේශපාලන නායකත්වයක් තිබෙන බවත් එබැවින් අවශ්‍ය වන්නේ එම වැඩපිළිවෙළ ජයග්‍රහණය කරවීම උදෙසා ප්‍රගතිශීලී, ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු ජනතාවගේ ක්‍රියාශීලී මැදිහත්වීම බවත් පෙන්වා දුන්නේය.

විජිත හේරත් සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 22වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ විජිත හේරත් සහෝදරයා, මෙසේද කියා සිටියේය.

"ජාතික ජන බලවේගය ලෙස අපි ජනාධිපති අපේක්ෂකයෙකු ඉදිරිපත් කරන්නේ පූර්ව සැලසුමක් සමගයි. ඒ වෙනුවෙන් අපි මීට පෙර ඉතා සැලසුම් සහගත ලෙස ප්‍රතිපත්ති මාලාවක් සකස් කළා. ඒ වෙනුවෙන් අපේ රටේ විද්වතුන්, වෘත්තිකයින්, කලාකරුවන් විශාල පිරිසක් සහභාගි වුණා. ඒ විකල්පයට දේශපාලන නායකත්වයක් ලබාදීම සඳහා තමයි ජාතික ජන බලවේගය ගොඩනැගෙන්නේ. ජනතාව ආර්ථික පීඩාවෙන් මුදාගන්න විකල්ප ආර්ථික ප්‍රතිපත්තිය නියෝජනය කරන්නේ ජාතික ජන බලවේගයයි.

ගොඩනගමු ශ්‍රී ලංකාව ප්‍රතිපත්ති මාලාව පදනම් කරගෙන තමයි අපි මෙවර ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වෙන්නේ. අපි මීට මාස ගණනකට ඉහතදී තමයි ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කළේ. එම ප්‍රතිපත්ති ප්‍රකාශය ක්‍රියාත්මක කරන්න පුළුවන් අපේක්ෂකයෙක් දැන් අපි ඉදිරිපත් කළා. දැන් ජනතාවට කල් බලන්න දෙයක් නැහැ. තීරණය ගත යුත්තේ ජනතාවයි.

සමස්ත ශ්‍රී ලාංකේය ජනතාව නියෝජනය කරමින් රට ගොඩනැගීමේ තීරණාත්මක සන්ධිස්ථානය අපි පසුගිය 18වැනිදා ගෝල්ෆේස් පිටියේදී සනිටුහන් කළා. රට වෙනස් කිරීමේ පළමු යෝධ පියවර මේ වන විට තබා අවසන්."

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.